ශ්‍රී ලංකා කජු සංස්ථාව



වාර්ෂික වාර්තාව

2022

පටුන **පිටුව**

- සභාපතිනියගේ පණිවිඩය I - II

01. ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය 1-2
02. ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ආයතනික ව්‍යුහය 3-23
03. සංස්ථාවේ සංවර්ධන කාර්යයන් 24-30
04. පරිපාලන කටයුතු 31-32
05. අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව 33-35
06. විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව 36-38
07. 2022 වර්ෂය සඳහා කාර්යසාධන වාර්තාව 39-42
08. කාර්යසාධනය ඉහළ නැංවීම පිණිස ගැනීමට අපේක්ෂිත මධ්‍යකාලීන ක්‍රියාමාර්ග 43-48
09. කාර්යසාධනය පිළිබඳ වසර 05ක සාරාංශය 49-50
10. විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන 51-67
11. විගණකාධිපති වාර්තාව 68-77
12. විගණන වාර්තාවේ සඳහන් අඩුපාඩු නිවැරදි කරගැනීමට ගනු ලබන ක්‍රියාමාර්ග 78-99
13. වසර 05ක ගිණුම් සාරාංශ 100

සභාපතිනියගේ පණිවිඩය

දේශීය වැවිලි භෝග ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා මහඟු අත්වැලක් සපයමින් දේශීය කජු වගාව නඟා සිටුවීමට අගය එකතු කළ කජු නිෂ්පාදන හඳුන්වාදෙමින්, කජු වගා ව්‍යාප්ති කටයුතු සිදුකරමින්, කජු පර්යේෂණ හා සංවර්ධන කටයුතු දිරිගන්වමින්, සිය 50 වන වර්ෂ පූර්ණයට ළඟා වූ ශ්‍රී ලංකා කජු සංස්ථාවේ 2022 වර්ෂයේ සංවර්ධන වැඩසටහන්පෙළ පිළිබඳව පණිවුඩයක් එක් කිරීමට ලැබීම පිළිබඳව සතුටු වෙමි.

ඊසානදිග බ්‍රසීලයේ සම්භවයක් ඇති කජු ශාකය 16 වන ශතවර්ෂයේදී ඉන්දියාවේ ගෝවා ප්‍රාන්තය හරහා පෘතුග්‍රීසීන් විසින් ශ්‍රී ලංකාවට හඳුන්වා දී ඇත. ශ්‍රී ලංකාවේ වයඹදිග මුහුදුබඩ තීරයේ මුල් අවස්ථාවේ වගා කර ඇති අතර, පසුකාලීනව වියලි දේශගුණයක් ඇති කලාපවල වැවිය හැකි භෝගයක් ලෙස ප්‍රචලිත වී ඇත. වර්තමානයේදී මෙය වාණිජමය වශයෙන් වැදගත් ඉහළ කෘෂිකාර්මික ශක්‍යතාවයක් ඇති භෝගයක් ලෙස හඳුන්වා දිය හැකිය.

ශ්‍රී ලංකාවට නිදහස ලැබීමෙන් පසුව කෘෂි ක්ෂේත්‍රයේ නියුක්ත වූවන් කජු වගාව කෙරෙහි අවධානය යොමු කළ අතර, විශේෂයෙන්ම 1973 දී ශ්‍රී ලංකා කජු සංස්ථාව ස්ථාපිත කිරීමෙන් පසුව කජු කර්මාන්තය වඩාත් ප්‍රචලිත වී ඇත. ශ්‍රී ලංකා කජු සංස්ථාව වෙත කජු කර්මාන්තයේ සංවර්ධනය ප්‍රධාන වශයෙන් පැවරී ඇත.

වර්තමානයේ කජු මද මහින් සකස් කරන ලද ආහාර, විශේෂයෙන් සිංහල අළුත් අවුරුදු සහ නත්තල් සමයට රසකැවිලි, කේක්, ව්‍යාංජන සඳහා භාවිතා කරන අතර, කජු ලෙල්ලෙන් ලබා ගන්නා දියරය (Cashew nut liquid oil) ලැකර්, තීන්ත, ප්ලාස්ටික් නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍යයක් වශයෙන් භාවිත කිරීමේ හැකියාවක් ඇත.

කජු මද සහ කජු නිෂ්පාදන සඳහා දේශීය මෙන්ම විදේශීය වෙළඳපොලෙහි විශාල ඉල්ලුමක් පවතී. ශ්‍රී ලංකාවේ කජු මදවල ඇති ඇත්දත් පැහැය, ප්‍රමාණයෙන් විශාල වීම, කජු මදය වටා ඇති සීනි සහිත ආවරණය නිසා ගෝලීය වෙළඳපොලෙහි විශාල ඉල්ලුමක් ඇති අතර, එම ඉල්ලුම සැපිරීම සඳහා ප්‍රමාණවත් කජු නිෂ්පාදනයක් සිදු නොවේ. වාර්ෂිකව ලෙලි කජු මෙට්‍රික් ටොන් 25000ක පමණ ඉල්ලුම පවතින අතර, නිෂ්පාදනය වනුයේ මෙ.ටො. 12000ක පමණ ප්‍රමාණයකි. මෙම තත්ත්වය අපනයන ප්‍රවර්ධනය කිරීම සඳහා අහිතකර ලෙස බලපා ඇත.

2021 වර්ෂයේ ශ්‍රී ලංකාවේ ලෙලි කජු අස්වැන්න මෙ.ටො. 8225ක් වූ අතර, එය 2022 වර්ෂයේ මෙ.ටො. 14730 කි. මෙය මෙම වසරේ ගෝලීයව පැවති කොවිඩ් 19 වසංගත රෝගී තත්ත්වය හමුවේ වුවද ලැබූ මහඟු ජයග්‍රහණයකි. මෙය 2021 වර්ෂය හා සාපේක්ෂව 79% ක වර්ධනයකි. මෙම වර්ෂයේ අපනයන පරිමාව මෙ.ටො. 58.2වූ අතර අපනයන වටිනාකම රු.මි. 212.83කි. 2021 වර්ෂයට සාපේක්ෂව මෙය ඉහළ වර්ධනයකි.

2022 වර්ෂය තුළදී ශ්‍රී ලංකා කජු සංස්ථාවේ සියලුම සේවාවන් සැපයීම සහ වාණිජ කටයුතු ඉතා සතුටුදායක අන්දමින් පවත්වාගෙන යාමට හැකිවූ අතර, ඒ සඳහා සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මා වෙත දක්වන ලද සහයෝගීතාවය පිළිබඳව මාගේ හෘදයාංගම ස්තුතිය හා ප්‍රණාමය ඔවුන් වෙත පුද කරමි.

විශේෂයෙන්ම සංස්ථාවේ සියලුම ක්‍රියාකාරකම් ඉහළ ඵලදායිතාවකින් හා කාර්යක්ෂමතාවකින් යුතුව පවත්වාගෙනයාම සඳහා සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මෙන්ම සංස්ථාවේ සහකාර සාමාන්‍යාධිකාරීවරුන් ඇතුළු සියලු කාර්ය මණ්ඩලය දැඩි කැපවීමකින් යුතුව කටයුතු කළ අතර, ඔවුන්ගේ සේවය ද අගය කරමි.

කුඩා පරිමාණයේ පිරිසැකසුම්කරුවන්, කජු නිෂ්පාදන අපනයනකරුවන්, කුඩා කජු ඉඩම්හිමියන්, රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන ඇතුළු සියලුම පාර්ශවකරුවන් මා වෙත දක්වන ලද සහයෝගය සහ කැපවීම මත මෙම සාර්ථකත්වය ළඟා කර ගැනීමට හැකිවූ අතර, එය ද ඉතා අගය කරමි.

වැවිලි අමාත්‍ය **ගරු රමේෂ් පතිරණ මැතිතුමා** මෙන්ම උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය **ගරු ජානක වක්කුඹුර මැතිතුමා** සහ එම අමාත්‍යාංශවල ලේකම්වරුන් ඇතුළු අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය විසින් අප සංස්ථාව වෙත ලබාදුන් මගපෙන්වීම වෙනුවෙන් ද ස්තුතිවන්ත වෙමි.



නීතීඥ සාරංගා රත්නායක
සභාපතිනි
ශ්‍රී ලංකා කජු සංස්ථාව

1. ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 ශ්‍රී ලංකා කජු සංස්ථාව ස්ථාපනය

ශ්‍රී ලංකා කජු සංස්ථාව 1972 අංක 11 දරණ රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ විධිවිධාන යටතේ 1973 මැයි මස 25 වන දින අංක 60/7 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනයට අනුව පිහිටුවන ලදී. සංස්ථාව ආරම්භයේ සිට රාජ්‍ය ව්‍යාපාරයක් වශයෙන් ක්‍රියාත්මක වන අතර, කජු කර්මාන්තය සඳහා සියලුම සේවාවන් සැපයීම සිදුකරන අතරතුර වාණිජ කටයුතු ද ලාභදායී මට්ටමකින් සිදුකරයි.

1.2 ශ්‍රී ලංකා කජු සංස්ථාවේ දැක්ම

ඉතාමත් උසස් තත්ත්වයේ කජු නිෂ්පාදනය කිරීම තුළින් ශ්‍රී ලංකාව ලෝකයේ කජු අපනයනය කරන ප්‍රමුඛතම රටක් බවට පත්කිරීම.

1.3 ශ්‍රී ලංකා කජු සංස්ථාවේ මෙහෙවර

කජු වගාව, නිෂ්පාදනය, පිරිසැකසුම් තාක්ෂණය, අගය එකතු කිරීම, පර්යේෂණ හා අලෙවි ප්‍රවර්ධන කටයුතු වැඩිදියුණු කිරීම සඳහා ගොවීන් සහ අදාළ පාර්ශවයන් වෙත වෘත්තීයමය මහපෙන්වීම ලබාදීම තුළින් දිගුකාලීන වූ වාණිජමය ශක්‍යතාවයක් ළඟාකර ගැනීමට හැකිවන පරිදි කජු කර්මාන්තය නඟා සිටුවීම.

1.4 ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ඉලක්ක හා අරමුණු

ගෝලීයව පිළිගත් වෙළඳ නාමයක් සහ ඉහළ අපනයන ධාරිතාවයක් සඳහා ශ්‍රී ලංකාවේ කජු නිෂ්පාදනයේ ව්‍යාප්තිය, පිරිසැකසුම්කරණය, අලෙවිකරණය හා සහතිකකරණයේ ඵලදායිතාවය ඉහළ නැංවීම.

- වගාව ව්‍යාප්ත කිරීම මඟින් අස්වැන්න ඉහළ නැංවීම.
- කජු පිරිසැකසුම් කර්මාන්තයේ හා වතුයායන්වල ඵලදායිතාවය ඉහළ නැංවීම.
- ශ්‍රී ලංකාවේ කජු සඳහා ගෝලීයව පිළිගත් වෙළඳ නාමයක් ඇති කිරීම.
- අගය එකතු කිරීම හා නව නිෂ්පාදන සංවර්ධනය.
- කජු අපනයන දිරි ගැන්වීම.
- ශ්‍රී ලංකාව කජු නිෂ්පාදනයේ ප්‍රමුඛයා බවට පත්කිරීම.
- ලාභ ඉපැයීම මගින් ස්වයංපෝෂිත රාජ්‍ය සංස්ථාවක් බවට පත්කිරීම.

1.5 රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ පළමුවන උපලේඛනය අනුව කපු සංස්ථාවේ කාර්යයන්

(අ) කපු වගා කිරීම, පිරිසැකසුම් කිරීම සහ අලෙවි කිරීම සහ කපු නිෂ්පාදනය පිරිසැකසුම් කිරීම හා අලෙවි කිරීම සම්බන්ධ සැලසුම් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීමට උපදෙස් දීම.

(ආ) කපු වගා කිරීම, පිරිසැකසුම් කිරීම සහ අලෙවි කිරීම සහ කපු නිෂ්පාදනය, පිරිසැකසුම් කිරීම හා අලෙවි කිරීම පිළිබඳ කටයුතු සිදු කිරීම.

(ඇ) කපු වගා කිරීම, පිරිසැකසුම් කිරීම සහ අලෙවි කිරීම සහ කපු නිෂ්පාදනය පිරිසැකසුම් කිරීම හා අලෙවි කිරීම දියුණු කිරීමේ පරමාර්ථයෙන් විමර්ශන හා පර්යේෂණ කටයුතු සිදු කිරීම.

(ඈ) කපු වගා කිරීම, පිරිසැකසුම් කිරීම සහ අලෙවි කිරීම සහ කපු නිෂ්පාදනය, පිරිසැකසුම් කිරීම හා අලෙවි කිරීම පිළිබඳ තාක්ෂණික, අලෙවි හා වෙනත් තොරතුරු රැස් කිරීම, පිළියෙල කිරීම, ප්‍රසිද්ධ කිරීම, බෙදා හැරීම සහ ඒ කටයුතුවලදී අන් අය සමඟ එක්ව ක්‍රියා කිරීම.

(ඉ) කපු සහ කපු නිෂ්පාදන පිරිසැකසුම් කිරීම සඳහා පිහිටුවනු ලබන කර්මාන්තශාලා පිහිටුවිය යුතු ස්ථාන, ඒවායේ ප්‍රමාණය හා තාක්ෂණික ප්‍රමිති නිශ්චය කිරීම සහ අළුත් කර්මාන්තශාලා පිහිටුවීමටත් සහ අවශ්‍ය අවස්ථාවලදී එවකට පවතින කර්මාන්තශාලා ක්‍රියා කරවීම.

(ඊ) කපු සහ කපු නිෂ්පාදන මිලටගැනීම, බෙදා හැරීම, විකිණීම සහ අපනයනය කිරීම.

(උ) කපු වගා කිරීම, පිරිසැකසුම් කිරීම හා අලෙවි කිරීම, කපු නිෂ්පාදනය පිරිසැකසුම් කිරීම සහ අලෙවි කිරීම පිළිබඳ වැඩ කරගෙනයාම සඳහා අවශ්‍ය තැනැත්තන් පුහුණු කිරීම පිණිස පහසුකම් සැපයීම.

(ඌ) කපු වගාවන් පිරිසැකසුම් කිරීමේ පහසුකම් සහ අලෙවි කිරීම දියුණු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය මූලික සංවිධානය පිහිටුවීම සහ එම සංවිධාන පිහිටුවීමට ආධාර දීම.

(එ) කපු නිෂ්පාදන ප්‍රචාරය කිරීම හා විකිණීම සඳහා අවශ්‍ය යැයි සලකනු ලබන පියවර ගැනීම, ලෝක වෙළඳපොළ තුළ ඒ නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම ප්‍රවර්ධනය කිරීම සහ ඒ කාර්යය සඳහා හෝ ඊට සම්බන්ධ අනුෂාංගික කාර්යයන් සඳහා ප්‍රචාරක කටයුතුවලට මුදල් යෙදවීම, ඒ කටයුතු අනුපාලනය කිරීම සහ ඒ කටයුතුවලට ආධාර දීම ආරම්භ කොට ඊට අනුග්‍රහය දැක්වීම.

2. ශ්‍රී ලංකා කපු සංස්ථාවේ ආයතනික ව්‍යුහය

2.1 අධ්‍යක්ෂ මණ්ඩලය

වගුව 2.1 : 2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටි සාමාජිකයන්

අනු අංකය	නම	තනතුර
01.	ආර්.ඒ.එස්.කේ. රත්නායක මිය	සභාපතිනිය
02.	අශෝකා ලංකාතිලක මෙය	නියෝජ්‍ය සභාපතිනිය
03.	තිලකා ජයසුන්දර මිය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, විෂයභාර අමාත්‍යාංශයේ නියෝජිත, (2022.01.01 සිට 2022.01.31 දක්වා)
04.	ඒ.යූ.කේ. දොඩම්වල මිය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, විෂයභාර අමාත්‍යාංශයේ නියෝජිත, (2022.06.06 සිට 2022.12.31 දක්වා)
05.	කේ.ඒ.සී. ප්‍රියදර්ශනී මෙය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, මහා භාණ්ඩාගාර නියෝජිත, (2022.06.06 සිට 2022.12.31 දක්වා)
06.	චාමර සුභසිංහ මයා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
07.	උපාලි වඩුආරච්චි මයා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
08.	එච්.එම්.සී.කේ. හේරත් මයා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (2022.01.01 සිට 2022.01.31 දක්වා)
09.	අයි.ඩබ්.ඒ. සමන් කුමාර මයා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
10.	පී.බී. කොඩිකාර මයා	වැ.බ. සාමාන්‍යාධිකාරී, අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්, (2022.01.01 සිට 2022.08.15 දක්වා)
11.	කේ.එස්. විජයකීර්ති මයා	වැ.බ. සාමාන්‍යාධිකාරී, අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්, (2022.09.06 සිට)

2.2 ශ්‍රී ලංකා කජු සංස්ථාවේ විගණන හා කළමනාකරණ කමිටුව

වගුව 2.2 : 2022 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටුව

අනු අංකය	නම	තනතුර
01	කේ.ඒ.සී. ප්‍රියදර්ශනී මෙය	කමිටු සභාපති, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික මහා භාණ්ඩාගාර නියෝජිත
02.	ඒ.යූ.කේ. දොඩම්වල මිය	කමිටු සාමාජික, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (විෂයභාර අමාත්‍යාංශයේ නියෝජිත)
03.	චාමර සුභසිංහ මයා	කමිටු සාමාජික, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
04.	පී.බී. කොඩිකාර මයා	කමිටු ලේකම් (වැ.බ.), සාමාන්‍යාධිකාරී (වැ.බ.) (2022.01.01 දින සිට 2022.08.15 දින දක්වා)
05.	කේ.එස්. විජයකීර්ති මයා	කමිටු ලේකම් (වැ.බ.), සාමාන්‍යාධිකාරී (වැ.බ.) (2022.09.02 දින සිට2022.12.31 දින දක්වා)
06.	වී.යූ. ලියනගේ මයා	කමිටු කැඳවුම්කරු හා කමිටු සාමාජික, සහකාර සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන)
07.	ආර්.එම්.පී.ඒ. ජානක මයා	කමිටු නිරීක්ෂක, විගණන අධිකාරී ජාතික විගණන කාර්යාලය (2022.01.01 දින සිට 2022.11.16 දින දක්වා)
08.	ජී.කේ.යූ. අබේරත්න මිය	කමිටු නිරීක්ෂක, විගණන අධිකාරී ජාතික විගණන කාර්යාලය (2022.12.29 දින සිට 2022.12.31 දින දක්වා)

2.3 ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ඉහළ කළමනාකරණය

i). පී.බී. කොඩිකාර මයා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී/ සාමාන්‍යාධිකාරී (වැ.බ.) (2022.01.31 සිට 2022.08.15 දක්වා)

ii). කේ.එස්. විජයකීර්ති මයා - සාමාන්‍යාධිකාරී (වැ.බ.) (2022.08.16 සිට)

2.4 ශ්‍රී ලංකා කජු සංස්ථාවේ මධ්‍යම කළමනාකරණ කාර්ය මණ්ඩලය

i)	එම්.ටී.එස්.කේ. පීරිස් මයා	-	සහකාර සාමාන්‍යාධිකාරී - මුදල්
ii)	ජී.බී.බී. සුරේන්ද්‍ර මයා	-	සහකාර සාමාන්‍යාධිකාරී - ව්‍යාප්ති හා පර්යේෂණ
iii)	වී.යූ. ලියනගේ මයා	-	සහකාර සාමාන්‍යාධිකාරී - අභ්‍යන්තර විගණන
iv)	ආර්.එම්.පී. ජයතිස්ස මයා	-	සහකාර සාමාන්‍යාධිකාරී - අලෙවි හා පිරිසැකසුම්
v)	පී.එම්.ඒ.පී.කේ. විජේතුංග මයා	-	සහකාර සාමාන්‍යාධිකාරී - වැවිලි

2.5 ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ආයතනික ව්‍යුහය

ශ්‍රී ලංකා කජු සංස්ථාව සතුව අංශ 07ක් පවතින අතර, එම එක් එක් අංශයන් සහ එම එක් එක් අංශයන්ගේ කාර්යභාරය පහත පරිදි වේ.

01. ව්‍යාප්ති සහ පර්යේෂණ අංශය
02. මානව සම්පත් කළමනාකරණ හා පාලන
03. මූල්‍ය අංශය
04. අභ්‍යන්තර විගණන අංශය
05. වැවිලි අංශය
06. අලෙවි සහ පිරිසැකසුම් අංශය
07. ප්‍රතිපත්ති සහ සැලසුම් අංශය

2.5.1 ව්‍යාප්ති සහ පර්යේෂණ අංශය

ශ්‍රී ලංකා කජු සංස්ථාව කජු කර්මාන්තයේ ප්‍රවර්ධනය සඳහා මහත් වගකිව යුතු භූමිකාවක් නිරතුරුවම ඉටු කරනු ලබයි. එහිදී විශේෂයෙන්ම ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ව්‍යාප්ති හා පර්යේෂණ අංශය මඟින් කජු වගාව ව්‍යාප්ත කිරීම හා පර්යේෂණ කටයුතු සිදු කරමින් වැදගත් මෙහෙවරක් ඉටුකරනු ලබයි.

2.5.1.1 ව්‍යාප්ති අංශය

ව්‍යාප්ති අංශයේ කාර්යයන් පහත ආකාරයෙන් සංක්ෂිප්තව දැක්විය හැකි වේ.

- කෘෂි ගොවීන්ගේ පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම.
- දිගුකාලීන වැඩසටහන් සහ ව්‍යාපෘති සංවර්ධනය සහ ක්‍රියාත්මක කිරීම.
- කෘෂි වගාවල උසස් ක්‍රමයන් ප්‍රදර්ශනය කිරීම.
- ගොවීන්ගේ ක්ෂේත්‍රයේ ප්‍රශ්න සඳහා විසඳුම් සැපයීම.
- ක්ෂේත්‍රයේ ආදර්ශන සහ ප්‍රදර්ශන කොටස් ස්ථාපනය සහ නඩත්තුව.
- අනෙකුත් කෘෂිකාර්මික දිගුකාලීන සේවා සහ සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.
- කෘෂි වගා ක්‍රම සහ ප්‍රතිඵල සම්බන්ධ දත්ත එකතු කිරීම සහ විශ්ලේෂණය කිරීම.

ශ්‍රී ලංකා කෘෂි සංස්ථාව මඟින් සපයනු ලබන ව්‍යාප්ත සේවාව (Extension Service) යටතේ කෘෂි වගාව කරනු ලබන ගොවීන්ගේ කුසලතා, දැනුම සහ අත්දැකීම් වැඩි දියුණු කරවා ගැනීමට සහ කෘෂි වගාවේ නිෂ්පාදනය සහ ඵලදායිතාව වැඩි කිරීමට අවශ්‍ය තාක්ෂණික සහ ප්‍රායෝගික දැනුම ලබාදේ.

ව්‍යාප්ති අංශයේ අරමුණු පහත ආකාරයෙන් සංක්ෂිප්තව දැක්විය හැකි වේ.

- ගොවීන් අතර කෘෂි වගා ක්‍රමවල යථා තත්ත්වයන් හඳුන්වාදෙමින් ඒවා සංවර්ධනය කිරීම.
- කෘෂි නිෂ්පාදනය සහ ඵලදායිතාව වර්ධනය කිරීම.
- පර්යේෂණ ප්‍රතිඵල සහ හොඳම ක්‍රමවේදයන් වගාකරුවන් අතර පැතිරවීම.
- ගොවීන්ගේ කුසලතා සහ දැනුම වැඩිදියුණු කිරීමට පුහුණු කිරීම සහ සහයෝගය සැපයීම.
- තිරසාර සහ පරිසර හිතකාමී කෘෂි වගා ක්‍රම ප්‍රවර්ධනය කිරීම.
- කෘෂි වගා කිරීමේ නවීන තාක්ෂණයන් භාවිතා කිරීමට පහසුකම් සලසා දීම.
- පර්යේෂණ, දිගුකාලීන කටයුතු සහ ගොවීන් අතර සම්බන්ධතාව වර්ධනය කිරීම.

ශ්‍රී ලංකාවේ ව්‍යාප්ති අංශය යටතේ ප්‍රාදේශීය ව්‍යාප්ති කාර්යාල 11ක් කිළිනොච්චි, අනුරාධපුර, ත්‍රිකුණාමලය, පුත්තලම, මාතලේ, මහියංගනය, අම්පාර, මඩකළපුව, මොණරාගල, හම්බන්තොට හා ඇඹිලිපිටිය යන ස්ථානයන්හි පිහිටුවා ඇති අතර කෘෂි වගාකරුවන්ට අවශ්‍ය පහසුකම් සැපයීම මේවාගේ ප්‍රධානතම අරමුණ වේ.

ශ්‍රී ලංකාවේ වියළි කලාප ප්‍රධාන වශයෙන් ආවරණය වන පරිදි මෙම කාර්යාල පිහිටා ඇති අතර අතරමැදි හා තෙත් කලාප ද අවරණ වන පරිදි ද මෙම කාර්යාලවල රාජකාරි කටයුතු සිදු කරනු ලබයි. පුත්තලම, කුරුණෑගල, ගම්පහ, කෑගල්ල, අනුරාධපුර, පොළොන්නරුව, යාපනය, කිළිනොච්චි, මන්නාරම, වවුනියාව, මුලතිව්, ත්‍රිකුණාමලය, මඩකලපුව, බදුල්ල, මාතලේ, මහියංගනය, මොණරාගල, හම්බන්තොට, මාතර, රත්නපුර හා අම්පාර දිස්ත්‍රික්කවල කජු වගාව ස්ථාපිත කිරීමට මූලිකවම කටයුතු කරනු ලැබේ.

මෙම කාර්යාලවල අධීක්ෂණ කටයුතු සිදු කරනු ලබන්නේ සහකාර සාමාන්‍යාධිකාරී ව්‍යාප්ති හා පර්යේෂණ විසිනි. මෙම ප්‍රාදේශීය කාර්යාලවලට අනුයුක්තව ප්‍රාදේශීය කළමනාකරු, සහකාර ප්‍රාදේශීය කළමනාකරුවන්ගෙන් සමන්විත 100කට ආසන්න ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයක් මඟින් පහත සඳහන් භූමිකාවන් නියෝජනය කරමින් සුළු, මධ්‍යම සහ මහා පරිමාණ වශයෙන් කජු වගාවේ නියැලී සිටින ගොවීන්ගේ කුසලතා, දැනුම සහ අත්දැකීම් වැඩි දියුණු කරවා ගැනීමට සහ කජු වගාවේ නිෂ්පාදනය සහ ඵලදායිතාව වැඩි කිරීමට අවශ්‍ය තාක්ෂණික සහ ප්‍රායෝගික සහාය සැපයීම සිදු කරනු ලබයි.

ව්‍යාප්ති අංශයේ භූමිකාවන් පහත දක්වා ඇත.

- කජු ගොවීන්ගේ වගා භූමිවල ක්ෂේත්‍ර සංචාරයන් ක්‍රියාත්මක කිරීම.
- ගොවීන් සඳහා පුහුණු සැසි, වැඩමුළු සහ සම්මන්ත්‍රණ සංවිධානය කිරීම.
- කජු ගොවීන්ට තාක්ෂණික සහ උපදේශන සේවා සැපයීම.
- පර්යේෂණ ඒකක සමඟ සහයෝගයෙන් දැනුම සහ නවෝත්පාදන ක්ෂේත්‍රයට මාරු කිරීම.
- දිගුකාලීන පාරිසරික කටයුතුවලින් කජු වගාවේ බලපෑම් නිරීක්ෂණය සහ ඇගයීම.
- සම්පත්, මෙවලම්, මාර්ගෝපදේශන, ලිපි සහ පුවත් සංවර්ධනය කිරීම.
- ගුණාත්මක කජු පැළ නඩත්තුව සඳහා ගොවීන්ට අවශ්‍ය පහසුකම් සලසා දීම.

මීට අමතරව දිගුකාලීන සේවා කාලෝචිත සහ කාර්යක්ෂම සේවාවන් සැපයීම, දිගුකාලීන කටයුතු සහ ගොවීන් සමඟින් වූ ඇගැයුම්වල නිවැරදි වාර්තා තබා ගැනීම, ගොවීන්ට නවතම සහ ප්‍රායෝගික තොරතුරු ලබාදීම, දිගුකාලීන කටයුතු සඳහා ගොවීන්ගේ සමිති ස්ථාපිත කිරීම හා ඒ සමඟ සම්බන්ධ වීම, දිගුකාලීන කටයුතුවල ප්‍රගතිය සහ අභියෝග කළමනාකාරීත්වයට වාර්තා කිරීම, දිගුකාලීන වැඩසටහන් සඳහා සම්පත් සහ මුදල් ලබා ගැනීම හා ව්‍යක්තීය සංවර්ධන සහ පුහුණු කිරීම මඟින්

දැනුම සහ කුසලතා නිරන්තරයෙන් යාවත්කාලීන කිරීම ව්‍යාප්ති හා පර්යේෂණ අංශයේ වගකීම් ලෙස දැක්විය හැකිවේ.

2.5.1.2 පර්යේෂණ අංශය

ශ්‍රී ලංකා කජු සංස්ථාවේ පර්යේෂණ අංශය මඟින් කජු ශාකය, කජු වගාව හා නිෂ්පාදන පිළිබඳ විද්‍යාත්මක පර්යේෂණ පවත්වනු ලැබේ. මෙම අංශය යටතේ ප්‍රධාන මධ්‍යස්ථාන දෙකක් පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටා ඇත. එනම් පුත්තලම පර්යේෂණ මධ්‍යස්ථානය හා කමන්දළුව පර්යේෂණ මධ්‍යස්ථානය වේ.

ශ්‍රී ලංකාවේ කජු කර්මාන්තයේ ආර්ථික වර්ධනයට සහය දැක්වීම සහ තිරසාර සහ පරිසර හිතකාමී ක්‍රමවේද ප්‍රවර්ධනය කිරීම පර්යේෂණ අංශයේ ප්‍රධාන අරමුණ වන අතර, අනෙකුත් අරමුණු පහත පරිදි සංක්ෂිප්තව දැක්විය හැකිවේ.

- කජු භෝගවල ගුණාත්මකභාවය සහ අස්වැන්න වැඩිදියුණු කිරීම.
- තිරසාර සහ කාර්යක්ෂම කජු වගා ක්‍රම සංවර්ධනය.
- කජු අගය එකතු කළ නිෂ්පාදන සහ ආශ්‍රිත නිෂ්පාදන නවීකරණය කිරීම.
- කජු භෝගවලට බලපාන පළිබෝධ සහ රෝගවලට විරුද්ධව පර්යේෂණ සිදු කිරීම.
- ශ්‍රී ලංකාවේ කජු කර්මාන්තයේ ආර්ථික වර්ධනයට සහාය වීම.
- කජු වගාවේ නවීන තාක්ෂණයන් භාවිතය ප්‍රවර්ධනය කිරීම.
- පර්යේෂණ ප්‍රතිඵල ගොවීන් සහ අදාළ පාර්ශවකරුවන් වෙත පැතිරවීම.

ශ්‍රී ලංකා කජු සංස්ථාවේ පර්යේෂණ අංශයේ ප්‍රධාන කාර්යය වන්නේ කජු වගා කිරීමේ ගුණාත්මකභාවය සහ අස්වැන්න වැඩි දියුණු කිරීම සඳහා තිරසාර සහ කාර්යක්ෂම වගා ක්‍රමවල නවීකරණය සිදු කිරීම සහ කජු වගා කිරීමට අවශ්‍ය නවීන තාක්ෂණික යෝජනා ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීම වේ. මෙම කාර්යයන්ට අමතරව පහත කාර්යයන් ද පර්යේෂණ අංශය මඟින් ඉටු කරනු ලැබේ.

- කජු පැළවල ක්ෂේත්‍ර පරීක්ෂණ සහ පර්යේෂණ සිදු කිරීම.
- පර්යේෂණ කටයුතු සඳහා පොළව, ජලය සහ පැළ වර්ග විශ්ලේෂණය කිරීම.
- පළිබෝධ සහ රෝග කළමනාකරණ යෝජනා සංවර්ධනය.
- විවිධ වගා ක්‍රමවල කාර්යක්ෂමතාවය ඇගයීම.
- කජු වර්ගවල ජීව ප්‍රජාව එකතු කිරීම සහ නඩත්තු කිරීම.
- කජු නිෂ්පාදන ක්‍රමවල ආර්ථික වාසිය ඇගයීම.
- කජු පැළ වගාවෙන් පසු නඩත්තු කිරීමේ ක්‍රම නවීකරණය.

- කජු වගාකරුවන් සහ පිරිසැකසුම්කරුවන්ට උපදේශන සේවා සැපයීම.

මීට අමතරව මෙම අංශය මඟින් කජු ගස්වලින් අතිරේක වටිනාකම ඇති නිෂ්පාදන සංවර්ධනය කිරීම, සහ කජු ගස්වලට බලපාන පළිබෝධ සහ රෝගවලට එරෙහිව පර්යේෂණ සිදු කිරීමටද කටයුතු කරනු ලබයි.

ශ්‍රී ලංකා කජු සංස්ථාවේ පර්යේෂණ අංශයේ භූමිකාවන් වශයෙන් කජු වගා සහ සැකසුම් පිළිබඳ විද්‍යාත්මක පර්යේෂණ සිදු කිරීම, ජාතික සහ ජාත්‍යන්තර පර්යේෂණ ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම සහ කජු ගොවීන්ට තාක්ෂණික සහාය හා මාර්ගෝපදේශනය සැපයීම වශයෙන් හැඳින්විය හැකි අතර, අදාළ වගා ක්‍රමවේදයන්ගේ කාර්යක්ෂමතාවය ඇගයීම සහ පර්යේෂණ ප්‍රතිඵල විද්‍යාත්මක සඟරා සහ පත්‍රිකා හා වාර්තා ලෙස පළ කිරීමද සිදු කරනු ලබයි.

පර්යේෂණ දත්තවල පාරිශ්‍රමිකතාව සහ විශ්වාසනීයතාව සුරැකීම, නීතිමය මාර්ගෝපදේශන සහ වෘත්තීය සම්මතයන් පිළිපැදීම, පර්යේෂණ ව්‍යාපෘති සහ ප්‍රතිඵලවල සම්පූර්ණ වාර්තා තබා ගැනීම, කජු කර්මාන්තයේ පාර්ශවකරුවන් සමඟ සහයෝගය වැඩි දියුණු කිරීම, පර්යේෂණවල ප්‍රගතිය සහ ප්‍රතිඵල ශ්‍රී ලංකා කජු සංස්ථාවේ කළමනාකාරීත්වයට වාර්තා කිරීම, පර්යේෂණ වැඩසටහන් සඳහා මුදල් සහ සම්පත් ලබා ගැනීමට කටයුතු කිරීම සහ වෘත්තීය සංවර්ධනය හරහා දැනුම සහ කුසලතා නිරන්තරයෙන් යාවත්කාලීන කිරීම පර්යේෂණ අංශයේ වගකීම් ලෙස දැක්විය හැකි වේ.

පර්යේෂණ කටයුතු නියාමනය සඳහා ශ්‍රී ලංකා කජු සංස්ථාව හා වයඹ විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨය එක්ව කටයුතු කරනු ලැබේ. පර්යේෂණ කළමනාකරණ කමිටුව මෙලෙස ඒකාබද්ධව පිහිටවූ කමිටුවක් වන අතර, මෙහි සාමාජිකයන් මඟින් පර්යේෂණ කටයුතු මෙහෙයවීම සහ දිශානතිය පෙන්වා දෙනු ලබයි.

2.5.2 මානව සම්පත් කළමනාකරණ සහ පාලන අංශය

ආයතනයක මානව සම්පත් වශයෙන් මිනිසුන් හා ඵලදායී නිෂ්පාදන කටයුතුවලට යොමු කළ හැකි ඔවුන් සතුව ඇති ශක්තීන්, දැනුම, කුසලතාවයන් හා අත්දැකීම් හැඳින්විය හැකි වේ.

ශ්‍රී ලංකා කජු සංස්ථාවේ පරමාර්ථ හා අරමුණු ඉටු කරගැනීම උදෙසා මානව සම්පත කාර්යක්ෂම හා ඵලදායී ලෙස යොදා ගැනීම මෙන්ම අවශ්‍ය යටිතල පහසුකම්

සම්පාදනය කිරීම මානව සම්පත් හා පාලන අංශය මඟින් ඉටු කරනු ලබන ප්‍රධාන කාර්යයන් වශයෙන් දැක්විය හැකිය.
මෙම කාර්යයන්ට අමතරව මානව සම්පත් හා පාලන අංශය මඟින් පහත ප්‍රතිලාභයන් ශ්‍රී ලංකා කජු සංස්ථාව වෙත සැලසේ.

- ගොවීන්, පිරිසැකසුම්කරුවන්, අලෙවිකරුවන් සහ අවදානම් දරන්නන් සඳහා සේවාවන් සපයමින් සංස්ථාවේ කාර්යයන්ගේ කාර්යක්ෂමතාවය සහ ඵලදායිතාවය ඉහළ නැංවීම මඟින් ලාභදායිත්වය ඉහළ නැංවීම.
- සංස්ථා කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය සිදුකර කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම.
- පරිපාලන රෙගුලාසි සම්පාදනය කිරීම.

2.5.3 මූල්‍ය අංශය

ශ්‍රී ලංකා කජු සංස්ථාවේ මූල්‍ය අංශය මඟින් විවිධ අංශවලට අවශ්‍ය මූල්‍ය පහසුකම් සැලසීමේ වගකීම දරයි. ඒ අනුව අයවැය සහ මූල්‍ය කාර්යය සැලසුම්වලට අනුකූලවූ අනුමත වැඩසටහන් හා ව්‍යාපෘති සඳහා මූල්‍ය පහසුකම් සැලසීම සම්බන්ධයෙන් මූල්‍ය අංශය වගකීම දරයි. මූල්‍ය අංශය මඟින් සිදුකරනු ලබන කාර්යයන් පහත පරිදි වේ.

- නිවැරදි මූල්‍ය කළමනාකරණය මඟින් සංස්ථාවේ කාර්යක්ෂමතාවය සහ ඵලදායිතාවය ඉහළ නැංවීම.
- අදාළ මූල්‍ය නීති සහ රෙගුලාසිවලට අනුකූලව ගෙවීම් සිදුකිරීම.
- විවිධ අංශයන්ගේ සහ ව්‍යාපෘතීන්ගේ ආදායම්, වියදම්, ලාභ සහ අලාභ තත්ත්වයන් සඳහන් කරමින් මාසික වාර්තා සකස් කිරීම.
- සෑම වර්ෂයක් අවසානයේදීම වාණිජ සහ සේවා අංශයන්ගේ ලාභදායිත්වය සඳහන් කරමින් අවසාන ගිණුම් සකස් කර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම.

2.5.4 අභ්‍යන්තර විගණන අංශය

ශ්‍රී ලංකා කජු සංස්ථාවේ මූල්‍ය ක්‍රියාකාරකම් මත පදනම් වූ අභ්‍යන්තර පාලන ක්‍රමයන් පිළිබඳව නිරන්තර හා ස්වාධීන ඇගයීමක් ක්‍රියාත්මක කොට, ඒ හරහා අදාලවන අභ්‍යන්තර පරීක්ෂාවන්හි ප්‍රමාණාත්මකභාවය හා වලංගුභාවය තහවුරු කිරීමේ කටයුතු සිදු කරමින් ශ්‍රී ලංකා කජු සංස්ථාව සතු සම්පත් නිසි පාලනයක් යටතේ වඩා ඵලදායීව හා කාර්යක්ෂමව හා ආර්ථිකමය ආකාරයෙන් ආයතනයේ එදිනෙදා මෙහෙයුම් කටයුතු සඳහා යොදාගැනීම වෙනුවෙන් අවශ්‍ය විධිධ ක්‍රම හඳුන්වා දීම හා ඒවායේ ප්‍රායෝගික යොදා ගැනීම් පිළිබඳ ප්‍රතිපෝෂණයක යෙදීම මෙන්ම කජු

සංස්ථාවේ ප්‍රගතිය හා අභිවෘද්ධිය වෙනුවෙන් අදාල වන වැඩසටහන් හා ව්‍යාපෘති පිළිබඳ නිරන්තර ඇගයීමක යෙදීම හා ඒවායේ සිදුවිය යුතු වෙනස්කම් හා ඒවායේ ප්‍රගතිය පිළිබඳව පාලනාධිකාරිය වෙත වාර්තා කිරීම යන කාර්යයන් මත පදනම්ව ශ්‍රී ලංකා කජු සංස්ථාවේ පොදු ඉලක්ක හා අරමුණු සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් දායකත්වය දැක්වීම මෙම සංස්ථාවේ අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධාන අරමුණ වේ.

මීට අමතරව, අභ්‍යන්තර විගණන අංශයේ උප අරමුණු පහත පරිදි වේ.

- ශ්‍රී ලංකා කජු සංස්ථාවේ මූල්‍ය සහ මූල්‍ය නොවන ක්‍රියාකාරකම් සඳහා ස්වාධීන තහවුරු කිරීම් සහ අභ්‍යන්තර පාලනයන් මත පදනම්ව සාධාරණත්වය සහ ප්‍රමාණවත්භාවය ස්ථාපිත කිරීම සඳහා අභ්‍යන්තර පරීක්ෂා සිදුකිරීම මඟින් වංචා, දූෂණ සහ මහහැරීම් අනාවරණය කරගැනීම.

- ක්‍රමවත් උපාය මාර්ගයයන් සහ ක්‍රමික ක්‍රමවේදයන් භාවිතයෙන් සහ සම්පත් සඵලදායි, කාර්යක්ෂම ආර්ථික ක්‍රම භාවිතා කරමින් මනා පාලනයකින් සහ අරමුණුගතව ශ්‍රී ලංකා කජු සංස්ථාවේ මෙහෙයුම් කටයුතු සිදුකිරීම.

- ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ප්‍රගතිය අරමුණු කිරීම ආරම්භ කිරීමට අදාළ ව්‍යාපෘතීන් සහ වැඩසටහන් පිළිබඳ දිර්ඝකාලීන තහවුරු කිරීම් සිදුකිරීම මඟින් ප්‍රගතිය තහවුරු කිරීම.

2.5.5 වැවිලි අංශය

ශ්‍රී ලංකාවේ දේශීය කජු පාරිභෝජන ඉල්ලුම සපුරාලීමට අවශ්‍ය උසස් තත්ත්වයේ කජු නිෂ්පාදනය කිරීම මඟින් කජු කර්මාන්තය නඟා සිටුවීම උදෙසා ශ්‍රී ලංකා කජු සංස්ථාවේ වැවිලි අංශය විසින් සැලකිව යුතු කාර්යභාරයක් ඉටු කරනු ලබයි. මෙහිදී කජු අපනයනය අරමුණු කරගෙන කජු වගාවට පිවිසෙන මහා පරිමාණ ව්‍යවසායකයින් සඳහා කජු වගාවට අවශ්‍ය උසස් තත්ත්වයේ රෝපණ ද්‍රව්‍ය ලබා දීම, තාක්ෂණික උපදෙස් හා මඟපෙන්වීම් ලබා දීම වැවිලි අංශය මඟින් සිදුකරනු ලබන ප්‍රධාන කාර්යයන් වේ.

ශ්‍රී ලංකාව තුළ මේවන විට දිස්ත්‍රික්ක 20ක් තුළ කජු වගාව ව්‍යාප්ත වී ඇත. වගාකරුවන් විසින් මෙම කජු වගාව සුළු පරිමාණ හා මහා පරිමාණ වශයෙන් සිදු කරනු ලබන අතර, ශ්‍රී ලංකා කජු සංස්ථාවේ වැවිලි අංශය මඟින් මෙම කජු වගාව සිදුකරනු වගාකරුවන් වෙත ඔවුන්ගේ කජු වගාව ගුණාත්මක, ලාභදායී හා සාර්ථක ලෙස පවත්වා ගැනීමට අවශ්‍ය උපදෙස් හා මඟපෙන්වීම් ලබා දීම ද සිදු කරනු ලබයි.

සංස්ථාවේ වැවිලි අංශය මඟින් සිදුකරනු ලබන කාර්යභාරය පහත පරිදි සංක්ෂිප්තව දැක්විය හැකිය.

- සංස්ථාව සතු වතුයායන් සහ පැළ තවාන් නඩත්තු කරමින් ලාභදායීව පවත්වාගෙන යාම.
- කජු සංස්ථාවේ වාර්ෂික නිමි කජු අවශ්‍යතාවය සඳහා අවශ්‍ය ලෙලි කජු නිෂ්පාදනය කිරීම.
- වතුයායන්වල නව වගාව ඇති කිරීම හා පැරණි වගාවන් පුනරුත්ථාපනය කිරීම.
- වාණිජ තවාන් වාර්ෂිකව ස්ථාපනය කර, රෝපණ ද්‍රව්‍ය ලෙස අව්‍යාජ (Authentic) බද්ධ පැළ හා බීජ පැළ නිෂ්පාදනය කිරීම.
- ස්වාභාවික පරිසරය සංරක්ෂණය වන පරිදි වගා කටයුතු සිදු කිරීම.
- වතුයායන් හා පැළ තවාන් ආශ්‍රිත ගම්බද ප්‍රදේශයන්හි ජනතාව සමඟ ඒකාබද්ධව කටයුතු කරමින් නිෂ්පාදනය තත්ත්වය සහ ප්‍රමාණය ඉහළ නැංවීම හා ඵලදායීතාවය ඉහළ නැංවීම.
- කජු වගාව ආදර්ශ වගාවක් ලෙස පවත්වා ගනිමින් ආයෝජකයින් සහ පිරිසැකසුම්කරුවන් ආකර්ශනය කරගැනීම.
- වගාකරුවන්ට, නව ව්‍යවසායකයින්ට, විශ්වවිද්‍යාල සිසුන්ට, රාජ්‍ය හා පෞද්ගලික ආයතනවල සේවකයන්ට හා කෘෂිකාර්මික සංවිධානවල සාමාජිකයන්ට කජු කර්මාන්තය සම්බන්ධයෙන් දැනුවත් කිරීම් වැඩසටහන් සිදුකිරීම.

ඉහත කාර්යයන් ඉටු කිරීම උදෙසා ශ්‍රී ලංකා කජු සංස්ථාවේ වැවිලි අංශය යටතේ වතුයායන් 08ක් හා රෝපණ ද්‍රව්‍ය මධ්‍යස්ථාන (Planting Material Production Centers) 05ක් දිවයින පුරා පිහිටා ඇත. එමෙන්ම සංස්ථාවේ වැවිලි අංශය මඟින් කජු වගාව ව්‍යාප්ත කිරීමට අවශ්‍ය අව්‍යාජ (Authentic) කජු බද්ධ පැළ නිෂ්පාදනය කර, දිවයින පුරා කජු වගාව සිදු කරනු ලබන ගොවීන් වෙත බෙදා හැරීම සිදුකරනු ලබයි.

2.5.6 අලෙවි සහ පිරිසැකසුම් අංශය

අලෙවි හා පිරිසැකසුම් අංශය විසින් දේශීය කජු පරිභෝජන අවශ්‍යතා සපුරාලීම සඳහා ගුණාත්මක තත්ත්වයෙන් යුතු කජු පිරිසැකසුම් කටයුතු සිදු කරනු ලබයි. ශ්‍රී ලංකා කජු සංස්ථාව යටතේ කජු පිරිසැකසුම් කටයුතු සිදු කරනු ලබන මධ්‍යස්ථාන 02ක් පවතී. අලෙවි අංශය විසින් සිදුකරනු ලබන සමස්ත කාර්යභාරය පහත ලෙස සංක්ෂිප්තව දැක්විය හැකිය.

- නිෂ්පාදන පිරිවැය අවම කිරීමත්, ඵලදායිතාව ඉහළ නැංවීමත් මඟින් කජු පිරිසැකසුම් කර්මාන්තය ඉහළ නැංවීම.
- අන්තර්ජාතික ප්‍රමිති තත්ත්වයන්ට ගැළපෙන පරිදි අගය එකතු කළ කජු නිෂ්පාදනයන්ගේ ප්‍රමිතිය සහ රසය ඉහළ නැංවීම.
- කජු අලෙවි සහ පිරිසැකසුම් කර්මාන්තයේ උන්නතිය සඳහා රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන සමඟ යහපත් සම්බන්ධතා පවත්වා ගනිමින් වාර්ෂිකව එම ක්ෂේත්‍රයේ සංවර්ධනය ඇති කිරීම.
- ලාභදායිත්වය ඉහළ නංවාගනිමින් සහ වෙළඳපොල තරඟකරුවන් සමඟ යහපත් සම්බන්ධතා පවත්වා ගනිමින්, අලෙවි අංශය කාර්යක්ෂමව සහ ඵලදායිතාවයෙන් යුක්තව පවත්වා ගෙන යාම.
- සේවකයන්ගේ දැනුම යාවත්කාලීන කිරීමත්, කුසලතා සංවර්ධනය කිරීමත් මඟින් ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සහ බලගැන්වීම.

2.5.7 ප්‍රතිපත්ති හා සැලසුම් අංශය

- සංයුක්ත සැලැස්ම හා ක්‍රියාත්මක සැලැස්ම වාර්ෂිකව සම්පාදනය කිරීම.
- සංයුක්ත සැලැස්ම සහ ක්‍රියාත්මක සැලැස්මට අදාළ අරමුණු සහ ඉලක්ක සත්‍ය ක්‍රියාකාරකම් සමඟ සංසන්දනය කර ඇගයීම් කටයුතු සිදුකිරීම, ඉහළ කළමණාකාරිත්වය, අධ්‍යක්ෂ මණ්ඩලය අනෙකුත් පාර්ශවයන් වෙත දැනුම් දීම සහ ඉලක්ක සපුරාගැනීමේ බාධක සඳහා විසඳුම් සොයා ගැනීම, සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම, කාර්යසාධනය සහ ගැටළු වාර්තා කිරීම.
- කජු ගොවීන් සහ පිරිසැකසුම්කරුවන්ගේ ක්‍රියාකාරකම් සහ සංස්ථාවේ සියලුම වාණිජ කාර්යයන් පිළිබඳව දත්ත ගබඩාවක් පවත්වාගෙන යාම.
- ඉලක්ක සපුරාගැනීමේ බාධාවන් හඳුනාගැනීම, එයට අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කිරීම මෙන්ම සංස්ථාවේ දැක්ම, මෙහෙවර, අරමුණු සහ ඉලක්ක ජයගැනීම් සඳහා සැලසුම් අවම පිරිවැයකින් යුක්තව සම්පාදනය කිරීම.
- කජු සංස්ථාව ලබාගන්නා ජයග්‍රහණ සහ කීර්තිනාමය ඉහළ නැංවීම, කජු වගා කිරීමේ ප්‍රතිලාභයන් මහජනතාව වෙත දැනුම්දීම සඳහා ප්‍රචාරණ කටයුතු සිදුකිරීම.

2.6 ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය කාර්යාල

2.6.1 ප්‍රධාන කාර්යාලය

ශ්‍රී ලංකා කජු සංස්ථා ප්‍රධාන කාර්යාලය අංක 1334, පරණ කෝට්ටේ පාර, රාජගිරිය යන ලිපිනයෙහි පිහිටා ඇත.

දුරකථන :

සභාපති	-	0112 - 871005
නියෝජ්‍ය සභාපති	-	0112 - 869844
සාමාන්‍යාධිකාරී	-	0112 - 876134
ෆැක්ස්	-	0112 - 867843
ඊ මේල්	-	cashewco@sltnet.lk
වෙබ් අඩවිය	-	www.cashew.gov.lk

2.6.2 ශ්‍රී ලංකා කජු සංස්ථාවට අයත් ප්‍රාදේශීය කාර්යාල, වතුයායන්, රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදන මධ්‍යස්ථාන හා පිරිසැකසුම් ඒකක

2.6.2.1 ප්‍රාදේශීය කාර්යාල

වගුව 2.6.2.1 : ප්‍රාදේශීය කාර්යාල

	නම හා තනතුර	ආවරණය වන දිස්ත්‍රික්කය	ලිපිනය	දුරකථන අංකය
1.	සී.ඒ. දෙනගම මිය ප්‍රාදේශීය කළමනාකරු (වැ.බ)	අනුරාධපුරය	ශ්‍රී ලංකා කජු සංස්ථාව, කිරි නිපදවන්නන්ගේ සමූපකාර සමිති ගොඩනැගිල්ල, ගොඩගේ මාවත, අනුරාධපුරය.	025-2227071 071-8046790
2.	බුද්ධික සඳරුවන් මයා සහකාර ප්‍රාදේශීය කළමනාකරු	බදුල්ල/මහනුවර	ශ්‍රී ලංකා කජු සංස්ථාව සී.ටී.සී.හන්දිය, අළුත්තරම, මහියංගනය.	055-3555257 077-3410225
3.	රංජිත් ගමගේ මයා සහකාර ප්‍රාදේශීය කළමනාකරු(වැ.බ)	හම්බන්තොට රත්නපුර	ශ්‍රී ලංකා කජු සංස්ථාව, මධ්‍යම පැළ තවාන, කිරලවැල්කොටුව, ඇඹිලිපිටිය.	077-6263358
4.	එල්. සංජීවන් මයා සහකාර ප්‍රාදේශීය කළමනාකරු	කිලිනොච්චි/ මුලතිව්/යාපනය/ වවුනියාව/ මන්නාරම	ශ්‍රී ලංකා කජු සංස්ථාව, පරණ කච්චේරිය ගොඩනැගිල්ල, කිලිනොච්චිය.	021-2283830 077-9850497

	නම හා තනතුර	ආවරණය වන දිස්ත්‍රික්කය	ලිපිනය	දුරකථන අංකය
5.	බුද්ධික සඳරුවන් මයා සහකාර ප්‍රාදේශීය කළමනාකරු	අම්පාර	ශ්‍රී ලංකා කජු සංස්ථාව, 40 සැතපුම් කණුව, මංගලගම, අම්පාර.	077-3410225
6.	කේ.ඒ.ඒ.එන්. අමරසිංහ මයා සහකාර ප්‍රාදේශීය කළමනාකරු	මොණරාගල	හෝමාගම වත්ත, 22 වන සැතපුම් කණුව, නක්කල, මොණරාගල.	055-2252090 071-8159195
7.	කේ.බී.එස්.ජේ කාරියවසම් මයා සහකාර ප්‍රාදේශීය කළමනාකරු	හම්බන්තොට	ශ්‍රී ලංකා කජු සංස්ථාව සිල්වාස්, මල්පෙත්තාව, අම්බලන්තොට.	071-8576359
8.	එච්.එම්.ඒ.එස්. ජයවර්ධන මයා සහකාර ප්‍රාදේශීය කළමනාකරු	පුත්තලම	ශ්‍රී ලංකා කජු සංස්ථාව, ශාන්ත මරියාපාර, සේනකුදිරිප්පුව, පුත්තලම.	032-2265998 070-3324319
9.	එච්.ටී.ඩී. දයාරත්න මයා සහකාර ප්‍රාදේශීය කළමනාකරු	මඩකලපුව/ පොළොන්නරුව	ශ්‍රී ලංකා කජු සංස්ථාව, මහජන පුස්තකාලය, වී.සී පාර, වදුරමුලෙයි.	077-6181734
10.	කේ.ඩී.මදුසංඛ මයා ස්ථානභාර නිලධාරී	මාතලේ	ශ්‍රී ලංකා කජු සංස්ථාව නාලන්ද බීජ උද්‍යානය, මඩවල උල්පත, මාතලේ.	071-0144631
11.	ආර්.එස්. නරේෂ් කුමාර් මයා ස්ථානභාර නිලධාරී	ත්‍රිකුණාමලය	ශ්‍රී ලංකා කජු සංස්ථාව, නුවර පාර, තඹලගමුව, ත්‍රිකුණාමලය.	077-1303648

2.6.2.2 ශ්‍රී ලංකා කජු සංස්ථාවට අයත් වතුයායන්

වගුව **2.6.2.2:** වතුයායන් සහ ඉඩම් අක්කර ප්‍රමාණය

අනු අංකය	වතුයායේ නම	පිහිටි දිස්ත්‍රික්කය	මුළු අක්කර ප්‍රමාණය	වගාකර ඇති අක්කර ප්‍රමාණය
01.	කමන්දළුව වතුයාය	පුත්තලම	548	494
02.	ආච්චිගෙවත්ත වතුයාය	පුත්තලම	961	761
03.	හාඩි වතුයාය	මඩකලපුව	365	190
04.	කොණ්ඩච්චි වතුයාය	මන්නාරම	6498	2385
05.	මාන්කර්ණි වතුයාය	මඩකළපුව	1075	115

අනු අංකය	වතුයායේ නම	පිහිටි දිස්ත්‍රික්කය	මුළු අක්කර ප්‍රමාණය	වගාකර ඇති අක්කර ප්‍රමාණය
06.	පුනරීන් වතුයාය	මන්නාරම	479	479
07.	වෙල්ලන්කුලම වතුයාය	කිළිනොච්චි	500	265
08.	තිරියාය වතුයාය	ත්‍රිකුණාමලය	10	10
	එකතුව		**10436**	**4699**

2.6.2.3 ශ්‍රී ලංකා කජු සංස්ථාවට අයත් බීජ උද්‍යාන

වගුව **2.6.2.3 :** බීජ උද්‍යාන පිහිටි ඉඩම් අක්කර ප්‍රමාණය

අනු අංක	බීජ උද්‍යාන	පිහිටි දිස්ත්‍රික්කය	මුළු අක්කර ප්‍රමාණය	වගාකර ඇති අක්කර ප්‍රමාණය
01.	එළුවන්කුලම බීජ උද්‍යානය	පුත්තලම	651	245
02.	විලච්චිය බීජ උද්‍යානය	අනුරාධපුරය	25	17
03.	සුදුවතුර ආර බීජ උද්‍යානය	මොණරාගල	200	45
04.	මහඔය බීජ උද්‍යානය	අම්පාර	81	45
05.	නාලන්ද බීජ උද්‍යානය	මාතලේ	135	50
	එකතුව		**1092**	**402**



ඡායාරූපය **2.6.2.3 :** නාලන්ද බීජ උද්‍යානය - මාතලේ දිස්ත්‍රික්කය

2.6.2.4 ශ්‍රී ලංකා කජු සංස්ථාවට අයත් පැළ තවාන්

වගුව 2.6.2.4: පැළ තවාන් පිහිටි ඉඩම් අක්කර ප්‍රමාණය

අනු අංක	මධ්‍යම පැළ තවානේ නම	අවරණය වන දිස්ත්‍රික්ක	අක්කර	නිෂ්පාදන ධාරිතාවය (පැළ ගණන)
01.	මිහින්තලේ පැළ තවාන	අනුරාධපුර/වව්නියා/ කිලිනොච්චි/ මුලතිව්/මන්නාරම	2.5	160000
02.	දඹුල්ල පැළ තවාන	මාතලේ/පොළොන්නරුව	3.0	50000
03.	කමන්දළුව පැළ තවාන	පුත්තලම/ කුරුණෑගල	1.0	240000
04.	හාඩි පැළ තවාන	මඩකළපුව/ ත්‍රිකුණාමලය	1.0	40000
05.	කුඹුක්කන පැළ තවාන	මොණරාගල	3.0	150000
06.	මහියංගණය පැළ තවාන	බදුල්ල/ මහනුවර	2.0	60000
07.	වන්දිකා වැව පැළ තවාන	හම්බන්තොට/ රත්නපුර	0.5	60000
08.	මංගලගම පැළ තවාන	අම්පාර	0.25	15000
එකතුව			**13.25**	**775000**



ඡායාරූපය 2.6.2.4 : කමන්දළුව බද්ධ කජු පැළ තවාන - ආඩිගම

2.6.2.5 ශ්‍රී ලංකා කජු සංස්ථාවට අයත් කජු පිරිසැකසුම් මධ්‍යස්ථාන

වගුව 2.6.2.5: ශ්‍රී ලංකා කජු සංස්ථාවට අයත් කජු පිරිසැකසුම් මධ්‍යස්ථාන

අනු අංක	කජු පිරිසැකසුම් මධ්‍යස්ථාන	දිස්ත්‍රික්කය
01.	නැඳගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානය	ගම්පහ
02.	පුත්තලම පිරිසැකසුම් මධ්‍යස්ථානය	පුත්තලම





ඡායාරූපය 2.6.2.5 - නැදගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානය

2.6.2.6 ශ්‍රී ලංකා කජු සංස්ථාවට අයත් කජු පර්යේෂණ ඒකක

වගුව 2.6.2.6 : ශ්‍රී ලංකා කජු සංස්ථාවට අයත් කජු පර්යේෂණ ඒකක

අනු අංක	පර්යේෂණ ඒකක	දිස්ත්‍රික්කය
01.	කමන්දළුව පර්යේෂණ ඒකකය	පුත්තලම
02.	පුත්තලම පර්යේෂණ ඒකකය	පුත්තලම

2.6.2.7 ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ප්‍රධාන ඒකාබද්ධ පර්යේෂණ සහයෝගීතාවය

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය හා ඒකාබද්ධව පර්යේෂණ වැඩසටහන් වාර්ෂිකව ක්‍රියාත්මක කරනු ලැබේ. මෙමඟින් කජු භෝගයේ ගුණාත්මකභාවය හා අස්වැන්න වැඩිදියුණු කිරීම, තිරසාර හා කාර්යක්ෂම කජු වගා ක්‍රම සංවර්ධනය, කජු අගය එකතු කළ නිෂ්පාදන සහ කජු ආශ්‍රිත නිෂ්පාදන නවීකරණය කිරීම, කජු භෝගවලට බලපාන පළිබෝධ සහ රෝගවලට විරුද්ධව පර්යේෂණ සිදු කිරීම හා ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ආර්ථික වර්ධනයට සහාය වීම වැනි අරමුණු රාශියක් මුදුන් පමුණුවා ගැනීමට හැකියාව ලැබේ. 2022 වර්ෂයේදී ද මෙම කමිටුවේ අඛණ්ඩතාවය පවත්වා ගනිමින් පර්යේෂණ වැඩසටහන් අඛණ්ඩව සිදු කර ඇ

2.6.2.8 ශ්‍රී ලංකා කපු සංස්ථාවේ අලෙවි සැල්

වගුව 2.6.2.8 : ශ්‍රී ලංකා කපු සංස්ථාවේ අලෙවි සැල්

අනු අංකය	සංස්ථා කපු අලෙවිසැල්	දිස්ත්‍රික්කය
01.	අංක 1334, පරණ කෝට්ටේ පාර, රාජගිරිය.	කොළඹ
02.	අංක 518, ගාලු පාර, කොළඹ 03.	කොළඹ
03.	නාරාහේන්පිට කපු අලෙවිසැල, ආර්ථික මධ්‍යස්ථානය, රාජ්‍ය වෙළඳ සංස්ථා ගොඩනැගිල්ල.	කොළඹ
04.	බලංගොඩ කපු අලෙවිසැල, 122 D, බාන්ස් රත්වත්ත මාවත, බලන්ගොඩ.	රත්නපුර
05.	පැල්මඩුල්ල කපු අලෙවිසැල, රත්නපුර පාර, පැල්මඩුල්ල.	රත්නපුර
06.	අඹේපුස්ස කපු අලෙවිසැල, “අවන්හල”, අඹේපුස්ස, වරකාපොල.	කෑගල්ල
07.	බඩගමුව කපු අලෙවිසැල, සංචාරක පහසුකම් මධ්‍යස්ථානය, කුරුණෑගල.	කුරුණෑගල

2.6.2.9 ශ්‍රී ලංකා කපු සංස්ථාවේ වරලත් අලෙවි සැල්

වගුව 2.6.2.9 : ශ්‍රී ලංකා කපු සංස්ථාවේ වරලත් කපු අලෙවි සැල්

අනු අංකය	සංස්ථා වරලත් කපු අලෙවිසැල්	දිස්ත්‍රික්කය
1.	රන්දිය පෘට්ස් ඇන්ඩ් නට්ස්, පයාගල, මග්ගොන.	කළුතර
2.	ආනන්ද ෆුඩ් සිටි, අංක 272, අඟුරුවාතොට පාර, හොරණ.	කළුතර
3.	පානදුර කෝප් සිටි, සී/ස පානදුර විවිධ සේවා සමූපකාර සමිතිය, ජනප්‍රිය මාවත, පානදුර.	කළුතර
4.	නිව් ඇමරිකන් චිකන් හට්, නො.16, ශ්‍රී සාරානන්ද මාවත, කළුතර.	කළුතර
5.	ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය, නාරාහේන්පිට.	කොළඹ
6.	ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාරය, අංක 21, ගාලු පාර, දෙහිවල.	කොළඹ
7.	ලයන් ග්‍රොසරි, මාකුඹුර, පන්නිපිටිය පාර, කොට්ටාව.	කොළඹ
8.	තලගල ස්ටෝර්ස්, තලගල.	කොළඹ
9.	පැනොරාමා චයිනීස් රෙස්ටුරන්ට්, කොට්ටාව.	කොළඹ
10.	රෝයල් බේකරි, වැල්ලවත්ත.	කොළඹ
11.	කපුවත්ත මිය, නාවල.	කොළඹ
12.	නවමිණි (Pvt) Ltd, පිටකෝට්ටේ.	කොළඹ
13.	Dairy Products and Milk Bar, නාරාහේන්පිට.	කොළඹ
14.	State Trading Corporation.	කොළඹ

අනු අංකය	සංස්ථා වරලත් කජු අලෙවිසැල්	දිස්ත්‍රික්කය
15.	Namunukula Dairy Stores, වත්තල.	ගම්පහ
16.	ජාතික ත්‍රිපෝෂ ආයතනය.	ගම්පහ
17.	ප්‍රෙෂ් ෆාම් ෂොප්, ගාලු පාර, හික්කඩුව.	ගාල්ල
18.	සුනිලා ග්‍රොසරි, අංක 35, අළුත් පාර, අම්බලන්ගොඩ.	ගාල්ල
19.	ගෝල්ඩන් මේඩ්, 144, ගාලු පාර, අහංගම.	ගාල්ල
20.	DGM Agriculture Dept., ලබුදුව, ගාල්ල.	ගාල්ල
21.	සම්පත් ෆාමසි ඇන්ඩ් ග්‍රොසරි, 39 E, මාතර පාර, අකුරැස්ස.	මාතර
22.	DGM Agriculture Dept, මාතර.	මාතර
23.	අබේගුණවර්ධන ස්ටෝර්ස්, දෙනියාය.	මාතර
24.	DGM Agriculture Dept., තෙලිජ්ජවිල.	මාතර
25.	සීමාසහිත යටිනුවර ගඟපළාත විවිධ සේවා සමූපකාර සමිතිය, පොල්ගහමුල හන්දිය, පේරාදෙණිය.	මහනුවර
26.	සීමාසහිත යටිනුවර මැද පළාත විවිධ සේවා සමූපකාර සමිතිය, ඇඹිල්මීගම, පිළිමතලාව.	මහනුවර
27.	සීමාසහිත මධ්‍යම පළාත් සමූපකාර සමිතිය, ඇහැලේපොළ කුමාරිහාමි මාවත බෝගම්බර, මහනුවර.	මහනුවර
28.	සීමාසහිත පූජාපිටිය සමූපකාර සමිතිය, පූජාපිටිය.	මහනුවර
29.	සීමාසහිත මහනුවර විවිධ සේවා සමූපකාර සමිතිය, කෝප්සිටි අලෙවිහල, පල්ලෙකැලේ.	මහනුවර
30.	කෝප් සිටි, කුණ්ඩසාලේ.	මහනුවර
31.	සෙප්කෝ සුපර්, බෝගම්බර.	මහනුවර
32.	විවිධ සේවා සමූපකාර සමිතිය, මහනුවර.	මහනුවර
33.	Royal Mall (Pvt) Ltd, මහනුවර.	මහනුවර
34.	Sunrise Super, කුණ්ඩසාලේ.	මහනුවර
35.	කඩුගන්නාව විවිධ සේවා සමූපකාර සමිතිය.	මහනුවර
36.	සීමාසහිත මහනුවර විවිධ සේවා සමූපකාර සමිතිය, කෝප්සිටි අලෙවිහල, මාතලේ.	මාතලේ
37.	සීමාසහිත මහනුවර විවිධ සේවා සමූපකාර සමිතිය, කෝප්සිටි අලෙවිහල, ලග්ගල.	මාතලේ
38.	ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය, බෙලිගම.	මාතලේ
39.	EPPCO Mini Mart, ප්‍රධාන පාර, මාවනැල්ල.	කෑගල්ල
40.	ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය, මැල්සිරිපුර.	කුරුණෑගල

2.6.2.10 ශ්‍රී ලංකා කජු සංස්ථාවේ සංචාරක බංගලා


සංචාරක බංගලා		දිස්ත්‍රික්කය
1. පුත්තලම සංචාරක බංගලාව	-	පුත්තලම
2. හාඩි සංචාරක බංගලාව	-	මඩකලපුව

2.6.2.11 ශ්‍රී ලංකා කපු සංස්ථාවේ කාර්ය මණ්ඩලය - 2022


වැටුප් කේතය	තනතුර	අනුමත සංඛ්‍යාව	2022 වර්ෂයේදී සිටින සේවක ප්‍රමාණය		පුරප්පාඩු
			ස්ථිර	කොන්ත්‍රාත්	
HM 1-3	සාමාන්‍යාධිකාරී	01	-	-	01
HM 1-1	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී	01	-	-	01
MM 1-1	සහකාර සාමාන්‍යාධිකාරී- මූදල්	01	01	-	-
	සහකාර සාමාන්‍යාධිකාරී - ව්‍යාප්ති හා පර්යේෂණ	01	01	-	
	සහකාර සාමාන්‍යාධිකාරී - අභ්‍යන්තර විගණන	01	01	-	-
	සහකාර සාමාන්‍යාධිකාරී - අලෙවි හා පිරිසැකසුම්	01	01	-	-
	සහකාර සාමාන්‍යාධිකාරී - වැවිලි	01	01	-	-
	සහකාර සාමාන්‍යාධිකාරී - මානව සම්පත් හා පාලන	01	-	-	01
	සහකාර සාමාන්‍යාධිකාරී - ප්‍රතිපත්ති හා සැලසුම්	01	-	-	01
JM 1-1	ප්‍රාදේශීය කළමනාකරු/ ස.ප්‍රාදේශීය කළමනාකරු	11	05	01	05
	ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි/ පර්යේෂණ නිලධාරි	02	01	-	01
	වැවිලි නිලධාරි	01	01	-	-
	ව්‍යාප්ති නිලධාරි	01	01	-	-
	වතු අධිකාරි	04	02	-	02
	තත්ත්ව සහතික කිරීමේ නිලධාරී	02	01	-	01
	පරිපාලන නිලධාරි	01	01	-	-
	මූල්‍ය නිලධාරි	01	01	-	-
	අලෙවි ප්‍රවර්ධන නිලධාරි	01	01	-	-
	අභ්‍යන්තර විගණන නිලධාරි	01	-	-	01
	සැලසුම්, අධීක්ෂණ හා ඇගයීම් නිලධාරි	01	-	-	01
MA - 4	භාෂා පරිවර්තක	01	-	-	01
MA 2-1	වැවිලි සහකාර	37	15	01	21
	තොරතුරු තාක්ෂණ සහකාර	01	01	-	-
	විගණන සහකාර	02	02	-	-
	මූල්‍ය සහකාර	01	01	-	-
	ප්‍රවාහන සහකාර	01	01	-	-
MA 1-1	කළමනාකරණ සහකාර	57	42	6	09
	ක්ෂේත්‍ර සහකාර	22	10	-	12
PL - 3	රියැදුරු	26	22	02	02
	බොයිලර් යන්ත්‍ර ක්‍රියාකරු	02	-	01	01
PL - 2	කම්කරු පරිපාලක	07	08	-	-
	සංචාරක බංගලා භාරකරු	03	-	-	03
PL - 1	කාර්යාල සහායක	16	15	08	-
	මුරකරු	11	06	04	01
	වාහන සහායක	02	02	-	-
		224	144	**23**	**65**

- සේවා අවශ්‍යතාවය මත සිදුකළ බඳවා ගැනීම් හේතුකොට ගෙන 2022.12.31 දිනට කම්කරු පරිපාලක 01ක්, හා කාර්යාල සහායක 07ක් වශයෙන් සමස්තය 08ක් වන සේවක අතිරික්තයක් පවතී.

ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ව්‍යාප්ති හා සේවා ජාලය



ශ්‍රී ලංකා කජු සංස්ථාවේ සංවිධාන ව්‍යුහය



3. සංස්ථාවේ සංවර්ධන කාර්යයන්

ශ්‍රී ලංකා කජු සංස්ථාවේ සංවර්ධන කාර්යයන් ඉටුකිරීම සඳහා සංස්ථාව ප්‍රධාන වැඩසටහන් 04ක් ක්‍රියාත්මක කරයි.

1. **ව්‍යාප්ති සහනාධාර වැඩසටහන.**
2. **වතු සංවර්ධනය, පුනරුත්ථාපනය හා ඵලදායිතාවය වර්ධනය කිරීම.**
3. **අලෙවි සහ පිරිසැකසුම් කර්මාන්ත සංවර්ධනය.**
4. **පර්යේෂණ සහ සංවර්ධනය.**

3.1 ව්‍යාප්ති සහනාධාර වැඩසටහන

3.1.1 ශ්‍රී ලංකාවේ කජු වගාවේ ව්‍යාප්තිය

ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ව්‍යාප්ති හා පර්යේෂණ අංශය මඟින් 2022 වර්ෂයේදී වාණිජ පැළ තවාන් තුළ පැළ නිෂ්පාදනය නොකිරීම සහ කොවිඩ් 19 වසංගත රෝගී තත්ත්වය හේතුවෙන් රට තුළ පැවති ආර්ථික හා දේශපාලනික අර්බුදකාරී තත්ත්වය මත සහනාධාර වගා ව්‍යාපෘතිය අක්කර 1530.5 දක්වා අඩු කිරීමට කටයුතු කරන ලදී.

2022 වර්ෂය සඳහා අක්කර 1 530.5ක් ලෙස සහනාධාර වැඩසටහන සැලසුම් කළ ද එය අක්කර 1637.76ක ව්‍යාප්ති වැඩසටහන් ලෙස ක්‍රියාත්මක කරන ලදී. එය දිස්ත්‍රික්ක 20ක සහනාධාර යෝජනා ක්‍රමය යටතේ බද්ධ කජු අක්කර 860.7ක් හා බීජ කජු අක්කර 411ක් වගා කරන ලද අතර මෙම සහනාධාර යෝජනා ක්‍රමයේ ගෙවතු වගාව සඳහා බද්ධ අක්කර 308.56ක් හා බීජ අක්කර 57 වගා කරන ලදී. එම දිස්ත්‍රක්කයන් 20ක් තුළ බද්ධ කජු හා බීජ කජු වගා කර ඇති අක්කර ප්‍රමාණයන් පිළිබඳ තොරතුරු පහත වගුව මඟින් දක්වා ඇත.

වගුව 3.1.1 : 2022 වර්ෂයේ සහනාධාර කජු වගා භූමි ප්‍රමාණය

	දිස්ත්‍රික්කය	බද්ධ කජු (අක්කර)	බීජ කජු (අක්කර)	ගෙවතු වගාව	
				බද්ධ කජු (අක්කර)	බීජ කජු (අක්කර)
1	පුත්තලම	65.5	40.5	10	25
2	කුරුණෑගල	43.1		10.9	

	දිස්ත්‍රික්කය	බද්ධ කපු (අක්කර)	බීජ කපු (අක්කර)	ගෙවතු වගාව	
				බද්ධ කපු (අක්කර)	බීජ කපු (අක්කර)
3	ගම්පහ	20.6		0.4	
4	අනුරාධපුර	130.5	20	69.5	
5	වව්නියාව	20			
6	මන්නාරම	5.5			
7	මුලතිව්	25	17		
8	යාපනය	6.5			
9	කිලිනොච්චිය	53	6		
10	මොණරාගල	175	100	25	
11	මාතලේ	50		5.71	
12	අම්පාර	40	115	50	
13	පොළොන්නරුව	44		10	
14	මහනුවර			12.05	
15	බදුල්ල	60		54	
16	හම්බන්තොට	70			
17	රත්නපුර	7	8	13	22
18	මාතර	2		48	
19	මඩකළපුව	13	90		
20	ත්‍රිකුණාමලය	30	15		10
එකතුව		**860.7**	**411.5**	**308.56**	**57**

3.1.2 කපු වගා සහනාධාර වැඩසටහන යටතේ ගොවීන්ට ප්‍රතිලාභ ලබාදීම

බද්ධ කපු වගාකිරීම සඳහා අක්කරයකට රු. 9,500/=ක මුදලක් සහ බීජ කපු වගා කිරීම සඳහා අක්කරයකට රු. 3,500/=ක් වශයෙන් මෙම සහනාධාර වැඩසටහන යටතේ ප්‍රතිපාදන වෙන් කර ඇත. එසේ වුවද, මෙම වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණයන් මෙම කාර්යය සඳහා කිසිසේත් ප්‍රමාණවත් නොවේ. එබැවින් වර්තමානයේදී සහනාධාර වැඩසටහන යටතේ තෝරාගත් ගොවීන්හට ගොවි පුහුණුව හා තාක්ෂණය ලබාදීම ඇතුළු අනෙකුත් ව්‍යාප්ති සේවාවන් නොමිලයේ ලබාදෙන අතර, වගාභූමි ප්‍රමාණයට අවශ්‍ය බද්ධ පැළ සහ බීජ පැළඳ නොමිලයේ ලබාදීම සිදුකරනු ලබයි. මෙම කටයුතු සංස්ථාවේ ප්‍රාදේශීය කාර්යාල 11ක් හරහා කපු වගා කරනු ලබන දිස්ත්‍රික්ක 20ක් මඟින් සිදුකරනු ලබයි.

3.2 වතු සංවර්ධනය, පුනරුත්ථාපනය හා ඵලදායිතාවය වර්ධනය කිරීම

3.2.1 කජු වගාවේ ඵලදායිතාවය ඉහළ නැංවීම

3.2.1.1 රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

ශ්‍රී ලංකා කජු සංස්ථාව යටතේ පවතින කජු රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදන මධ්‍යස්ථානවල යහපත් කෘෂිකාර්මික ක්‍රමවේද යටතේ (GAP) උසස් නිෂ්පාදන තත්ත්වයන් පවත්වා ගනිමින් මව් ශාක නඩත්තු කර, එම ශාකවලින් අංකුර 39200ක් ලබා ගන්නා ලදි. 2022 වර්ෂයේදී බද්ධ පැළ නිෂ්පාදනය කිරීම සඳහා මව්බීජ 49000ක ප්‍රමාණයක් භාවිතා කරන ලදි.

3.2.1.2 තවාන් කළමනාකරණය

ශ්‍රී ලංකා කජු සංස්ථාව යටතේ පවතින මධ්‍යම පැළ තවාන් තුළ ඉහළ ගුණාත්මයෙන් යුතු නව ප්‍රභේදවලින් සමන්විත බද්ධ පැළ 23296ක් හා බීජ පැළ 3494ක් සාර්ථකව නිෂ්පාදනය කර, සහනාධාර වැඩසටහන් සහ පෞද්ගලික වතු හිමියන් සඳහා නිකුත් කරන ලදි. 2022 වර්ෂයේදී රටේ පැවති කොවිඩ් වසංගත රෝගී තත්ත්වය සහ රට තුළ පැවති ආර්ථික, දේශපාලනික අස්ථාවරත්වය හේතුවෙන් පැළ නිෂ්පාදනය සීමා කිරීමට සිදු විය. එම වර්ෂය තුළදී කමන්දළුව හා මිහින්තලේ පැළ තවාන් තුළ නිපදවන ලද බද්ධ පැළ ප්‍රමාණයන් පහත දැක්වේ.

වගුව 3.2.1.2 : 2022 වර්ෂයේ කජු පැළ නිෂ්පාදනය

පැළ තවානේ නම	නිපදවන ලද බද්ධ පැළ ප්‍රමාණය	නිපදවන ලද බද්ධ පැළ ප්‍රමාණය
1. කමන්දළුව	10974	524
2. මිහින්තලේ	12322	2970
එකතුව	**23296**	**3494**

3.2.1.3 වතුයායන්වල නව වගාව

2022 වර්ෂයේ ශ්‍රී ලංකා කජු සංස්ථාව යටතේ පවතින කොණ්ඩච්චි, පුත්තලම හා මහඔය යන වතුයායන් සංවර්ධන කටයුතු සිදු කළ අතර, පෙර වර්ෂයන්ට සාපේක්ෂව මෙම වර්ෂයේ රට තුළ පැවති ආර්ථික හා දේශපාලනික අස්ථාවරත්වය නිසා සංවර්ධන කටයුතු සීමා වී ඇත. ඒ අනුව කොණ්ඩච්චි වතුයායේ අක්කර 86ක්, පුත්තලම වතුයායේ අක්කර 20, මහඔය අක්කර 21ක ඉඩම් ප්‍රමාණයක පාළු පැළ සිටුවන ලදි. ඒ සඳහා බද්ධ පැළ පහත සඳහන් ප්‍රමාණයන් භාවිතා කරන ලදි.

කොණ්ඩච්චි - බද්ධ පැළ 5246
පුත්තලම - බද්ධ පැළ 1400
මහඔය - බද්ධ පැළ 1500
එකතුව - **බද්ධ පැළ 8146**

3.2.1.4 සංවර්ධන ව්‍යාපෘති සඳහා පැළ ලබාදීම

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන කෘෂි අපනයන ගම්මාන වැඩසටහන යටතේ 2022 වර්ෂයේදී කජු වගා කිරීම සඳහා ප්‍රතිලාභීන් වෙත බද්ධ කජු පැළ බෙදා දීම සිදු කරන ලදි. කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් වෙත බද්ධ කජු පැළ 11060ක් වව්නියා දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් වෙත බද්ධ කජු පැළ 250ක් මාතර දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් වෙත බද්ධ කජු පැළ 4000ක් ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් වෙත බද්ධ කජු පැළ 3895ක් මොණරාගල දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් වෙත බද්ධ කජු පැළ 7893ක් හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත බද්ධ කජු පැළ 7493ක් වශයෙන් මුළු බද්ධ පැළ 34591ක ප්‍රමාණයක් බෙදා හරින ලදි.

3.2.1.5 ඵලදායිතාවය වැඩි දියුණු කිරීම

කජු වගාවේ රෝග හා පළිබෝධ මර්දනය හා යහපත් කෘෂිකාර්මික ක්‍රමවේද (GAP) භාවිතයෙන් ඵලදායිතාවය ඉහළ නැංවීමේ අරමුණින් ‘‘හෙලෝපෙල්ටිස්’’ මකුණාගේ හානිය සහ කඳ හා මුල් විඳින පණු රෝග මර්දනය කිරීම සඳහා පළිබෝධ මර්දන වැඩසටහන් දිවයින පුරා ක්‍රියාත්මක කරන ලදී. මීට අමතරව, කජු සහනාධාර වැඩසටහන යටතේ 2022 වර්ෂය අවසානයේදී ප්‍රතිලාභී ගොවීන් 558 දෙනෙකු සඳහා ගොවි පුහුණු පංති 68ක් පවත්වා ඇත. එමෙන්ම කජු භෝගවල ගුණාත්මකභාවය, අස්වැන්න සහ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කළ හැකි ක්‍රමවේදයන් හඳුනා ගැනීමට අවශ්‍ය පර්යේෂණ සිදු කිරීම සඳහා කටයුතු සංවිධානය කරන ලදී.

එමෙන්ම මෙම වර්ෂයේ රටෙහි පැවති ආර්ථික අස්ථාවර තත්ත්වය හේතුවෙන් රසායනික පොහොර ආනයනය කිරීම සීමා කරන ලද අතර, මෙම තත්ත්වය මඟ හරවා ගැනීම සඳහා කමන්දලුව වතුයායේ කාබනික පොහොර මෙ.ටො. 10ක් නිෂ්පාදනය කර වගාව සඳහා යොදන ලදී.

3.3 අලෙවි සහ පිරිසැකසුම් කර්මාන්ත සංවර්ධනය

3.3.1 ලෙලි කජු මිලට ගැනීම

වෙළඳපොල තරඟකාරී තත්ත්වයන්ට මුහුණදීම හා පිරිවැය අවම කිරීමේ පරමාර්ථයෙන් දේශීය කජු පරිභෝජන ඉල්ලුම සපුරාලීම සහ ගුණාත්මක හා අගය එකතු කරන ලද නිෂ්පාදන වෙළඳපොළට ඉදිරිපත් කිරීම සඳහා මෙම වර්ෂයේදී සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව මඟින් ලෙලි කජු මෙ.ටො. 79.05ක් මිලදී ගන්නා ලදී. මේ නිසා තරඟකාරී වෙළඳපොල මිල පරාසයක් ස්ථාපිත විය. මෙම වර්ෂයේ සංස්ථා වතුයායන්ගෙන් ලැබුණු මෙ.ටො. 88.24ක අස්වැන්න ශ්‍රී ලංකා කජු සංස්ථාව යටතේ පවතින පුත්තලම හා නැදගමුව පිහිටි පිරිසැකසුම් මධ්‍යස්ථානවල පිරිසැකසුම් කටයුතු සඳහා යොදා ගන්නා ලදි.

3.3.2 කජු පිරිසැකසුම් කර්මාන්තය ශක්තිමත් කිරීම

උසස් ප්‍රමිතියෙන් යුක්ත වූ කජු මද නිෂ්පාදන වෙළඳපොලට ඉදිරිපත් කිරීම මඟින් ඉහළ මිලක් උපයාගැනීම පිණිස උසස් නිෂ්පාදන යාන්ත්‍රණයක් අත්‍යාවශ්‍ය වේ. මෙම වැඩසටහනට අනුකූලව කජු පිරිසැකසුම්කරුවන් සඳහා විජලන යන්ත්‍ර හා විදුලි බලයෙන් ක්‍රියාත්මක කරන කජු කැපීමේ යන්ත්‍ර ලබාදීම, යහපත් නිෂ්පාදන ක්‍රමවේද (GMP) භාවිතයෙන් හා අගය එකතු කිරීම හා ප්‍රමිති තත්ත්වයන් සම්බන්ධව පිරිසැකසුම්කරුවන් පුහුණු කිරීම, පිරිසැකසුම් සමිති සඳහා මූල්‍ය පහසුකම් ලබාගැනීම සඳහා සහායවීම හා වෙළඳපොල ප්‍රවර්ධනය සඳහා සහාය ලබා දීම සිදු කරන ලදි.

3.3.3 කජු පිරිසැකසුම් කිරීම හා අලෙවිකරණය

සංස්ථාවට අයත් කජු පිරිසැකසුම් මධ්‍යස්ථාන පුත්තලම හා නැදගමුව පිහිටා ඇත. සංස්ථා වතුයායන්ගෙන් ලබාගන්නා ලද ලෙලි කජු පිරිසැකසුම් කටයුතු සඳහා යොදාගෙන, අගය එකතු කරන ලද කජු මද කොල්ලුපිටිය, නාරාහේන්පිට, රාජගිරිය, බලංගොඩ, අඹේපුස්ස, බඩගමුව හා පැල්මඩුල්ල යන ස්ථානයන්වල පිහිටා ඇති කජු

අලෙවි සැල් 07ට අමතර දිවයිනේ ව්‍යාප්තව පවතින වරලත් අලෙවි සැල් 40ක් උපයෝගී කරගෙන පාරිභෝගිකයන් වෙත අලෙවි කිරීම පවත්වා ගෙන යන ලදී.

නව තාක්ෂණික ක්‍රම භාවිතය, අගය එකතු කිරීම හා උසස් කජු නිෂ්පාදන අලෙවි කිරීම මඟින් රු. මි. 112.39ක මුදලක් උපයා ගැනීමට සංස්ථාව සමත්විය.

3.3.4 කජු නිෂ්පාදන අපනයනය හා විදේශ විනිමය ඉපැයීම

2022 වර්ෂයේදී උසස් තත්ත්වයේ අගය එකතු කරන ලද කජු මද මෙ.ටො. 58.20ක් විදේශ වෙළඳපොළට ඉදිරිපත් කිරීම මගින් රු.මි. 212.83ක විදේශ විනිමය ඉපැයීමට ශ්‍රී ලංකාව සමත්විය. 2021 වර්ෂයේ අගය එකතු කරන ලද කජු මද මෙ.ටො. 26.26ක් අපනයනය කිරීමෙන් රු.මි. 89.07ක විදේශ විනිමයක් උපයා ගෙන ඇත. මේ අනුව, මෙම වර්ෂයේදී අපනයන ධාරිතාවය හා විදේශ විනිමය ඉපයීම 2021 වර්ෂයට වඩා වැඩිවීමක් පෙන්නුම් කරන අතර, මෙම වර්ෂයේදී ගෝලීයව පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හා දේශීය සංචාරක කර්මාන්තයේද සීඝ්‍ර පසුබැස්මක් පැවතිය ද මෙම වර්ෂයේදී විදේශ විනිමය ඉපැයීම් වැඩිවීම ලබාගත් මහඟු ජයග්‍රහණයක් ලෙස දැක්විය හැකිවේ.

3.3.5 කජු ආනයනය

3.3.5.1 දේශීය පරිභෝජනය සඳහා ආනයනය

දේශීය වශයෙන් නිෂ්පාදනය කරන කජු ප්‍රමාණවත් නොවීම නිසා විශේෂයෙන් ජනවාරි, පෙබරවාරි හා මාර්තු යන මාසවල කුඩා පරිමාණ කජු පිරිසැකසුම්කරුවන්ට අවශ්‍ය ලෙලි කජු දේශීය වෙළඳපොල තුළ හිඟතාවයක් ඇතිවිය. මේ සඳහා විසඳුමක් වශයෙන් කුඩා පරිමාණ කජු පිරිසැකසුම්කරුවන් සඳහා බදු සහන යටතේ ලෙලි කජු ආනයනය කිරීම සඳහා බලපත්‍ර ලබාදෙන ලදී.

මෙම ආනයන බලපත්‍ර තාවකාලික පදනම මත දේශීය නිෂ්පාදන වෙළඳපොලෙහි හිඟ කාලයේදී පමණක් ලබාදීම සිදු කරයි. ශ්‍රී ලංකා රේගුවේ වාර්තාවලට අනුව, ලෙලි කජු මෙ.ටො.207.57ක් ආනයනය කර කුඩා පරිමාණ නිෂ්පාදකයන්/පිරිසැකසුම්කරුවන් රාශියක් අතර බෙදාහරින ලදී. මේ අනුව, කජු පිරිසැකසුම් කර්මාන්තයේ නියැලෙන ගොවීන්ගේ ජීවනෝපාය ස්ථාවර කිරීමට හා ඔවුන්ගේ ආර්ථික හා සාමාජීය මට්ටම ඉහළ නංවාලීම සඳහා සංස්ථාවට මැදිහත්වීමට අවස්ථාව ලැබුණි.

3.4 පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන්

පර්යේෂණ අංශයේ ප්‍රධාන කාර්යය වන්නේ කජු වගා කිරීමේ ගුණාත්මකභාවය සහ කජු අස්වැන්න වැඩි දියුණු කිරීම සඳහා තිරසාර සහ කාර්යක්ෂම වගා ක්‍රමවල නවීකරණය සිදු කිරීම හා කජු වගා කිරීමට අවශ්‍ය නවීන තාක්ෂණික යෝජනා ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීමයි.

පර්යේෂණ අංශය විසින් සිදු කරනු ලබන බහු වාර්ෂික පර්යේෂණ අඛණ්ඩව පවත්වා ගැනීම 2022 වර්ෂයේද සිදු කරන ලදි. මීට අමතරව තිරසාර වගා ක්‍රම, පලිබෝධ හා රෝග කළමනාකරණය සහ පශ්චාත් අස්වැන්න සැකසුම් නවීකරණය පිළිබඳ පර්යේෂණයන් සිදු කරන ලදි. එමෙන්ම කජු ගස්වලට බලපාන පළිබෝධ සහ රෝගවලට පිළිතුරු සොයා ගැනීම සඳහා පර්යේෂණයන් සිදුකරන ලදි.

4. පරිපාලන කටයුතු

කුඩා පරිමාණ හා මහා පරිමාණ වශයෙන් කජු වගාව සිදුකරනු ලබන වගාකරුවන්, කජු පිරිසැකසුම් කර්මාන්තයේ නියැලෙන්නන් හා කජු නිෂ්පාදන මිලදී ගන්නා පාර්ශවයන් වෙත ගුණාත්මක හා කාර්යක්ෂම සේවාවක් ලබාදීමේ අරමුණ ඇතිව විධිමත් කළමනාකරණ භාවිතයන් සිදු කිරීමට හැකියාව ලැබුණි. රාජ්‍ය ව්‍යවසායක් ලෙස සේවාවන් සපයන අතර, ලාභ ඉපැයීම ද අරමුණු කර ඇති බැවින්, සංස්ථාවේ සියලුම පාර්ශවකරුවන්ගේ සහාය මේ සඳහා ලබා ගත හැකි විය.

මේ සඳහා ශ්‍රී ලංකා කජු සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය, සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සහ සහකාර සාමාන්‍යාධිකාරීවරුන් ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයේ සහාය ද නොමඳව ලැබුණි. රජයේ නව සංවර්ධන උපායමාර්ගවලට අනුකූලව ජනතාවගේ ආදායම් උත්පාදනය හා සංස්ථාවේ අරමුණු මුදුන්පත් කරගැනීම සඳහා ද මේ අනුව කටයුතු කළ හැකි විය.

4.1 2022.12.31 දිනට කාර්ය මණ්ඩල කළමනාකරණය

ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ජ්‍යෙෂ්ඨ, තෘතීක, ද්විතියික, ප්‍රාථමික හා කොන්ත්‍රාත් යන සේවා මට්ටම්වල සේවකයින් විසින් රාජකාරී කටයුතු සිදු කරනු ලබන අතර, 2022 වසරේ 167ක පමණ කාර්ය මණ්ඩලය විසින් සංස්ථාවේ ඉලක්ක හා අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් ලබාදී ඇත. මෙම කාර්ය මණ්ඩලය ප්‍රධාන කාර්යාලයේ හා දීප ව්‍යාප්ත අනෙකුත් ප්‍රාදේශීය කාර්යාලයන්වල සේවය කරනු ලැබීය. මෙම කාර්ය මණ්ඩලයට අමතරව සංස්ථාවේ වතුයායන්වල, පිරිසැකසුම් මධ්‍යස්ථාන හා අනෙකුත් කාර්යාලයන්වල කැළෑ එළි කිරීම, වලවල් කැපීම, පැළ සිටුවීම, පොහොර යෙදීම, වල් මර්දනය සිදු කිරීම, කජු අස්වැන්න එකතු කිරීම හා කජු කැපීම, කජු සුද්ද කිරීම ආදී කාර්යයන් ඉටු කිරීම සඳහා දෛනික පදනම මත කම්කරුවන් 200කට ආසන්න ප්‍රමාණයක් සේවය කරනු ලබයි.

වගුව 4.1 : 2022 වර්ෂයේ විවිධ සේවා මට්ටම් යටතේ සේවය කරන සේවක සංඛ්‍යාව

සේවා මට්ටම	සේවය කරන ලද සේවක සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ	05
තෘතීක	15
ද්විතියික	79
ප්‍රාථමික	68
එකතුව	**167**

4.2 2022 වර්ෂයේ ලබාගත් ජයග්‍රහණ

වර්ෂ 2020දී හා 2021 දී වාර්තාගත වූ අලෙවි කාර්යයන් මඟින් ලාභ ලබන තත්ත්වය වර්ෂ 2022දී ද අඛණ්ඩව පවත්වා ගැනීමට සමත්විය. මේ වෙනුවෙන් සංස්ථාවේ වාණිජමය ක්‍රියාකාරකම් උපයෝගි කරගත් අතර, අධ්‍යක්ෂ මණ්ඩලයේ ඵලදායි හා කාර්යක්ෂම මඟ පෙන්වීම සහ කාර්ය මණ්ඩලයේ කැපවීම ද මෙම තත්ත්වය සඳහා හේතු සාධක විය.

පහත සඳහන් බාධක නිසා කාර්යසාධනය ඉහළ මට්ටමකට ගෙන ඒමට හැකියාව නොලැබුණි.

- 2020 - 2022 වර්ෂයන් තුළදී ගෝලීයව පැවති කොවිඩ් 19 වසංගත රෝගී තත්ත්වයේ බලපෑම හා රට තුළ පැවති ආර්ථික හා දේශපාලනික අස්ථාවරත්වය මෙන්ම එම කාලයේදී රට තුළ ඉන්ධන හිඟයන් වැනි අර්බුදයන් පැවතීම.
- අයහපත් කාලගුණ තත්ත්වයන් මත එනම්, මල් හටගන්නා කාලසීමාව තුළ අධික නියඟයකට ලක්වීම හේතුවෙන් මල් වියලීමකට ලක්වීම නිසා වතුයායන්වල අස්වැන්න අපේක්ෂිත මට්ටමට වඩා අඩුවීම.
- දේශීය ලෙලි කපු ඉල්ලුමට සරිලන සැපයුමක් වාර්තා නොවීම.
- කම්කරු වියදම් හා ද්‍රව්‍ය වියදම් ඉහළ යාම.
- පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රදානයන් සීමාකිරීම හේතුවෙන් නව කාර්යයන් ආරම්භ කිරීමේදී මෙන්ම අත්‍යාවශ්‍ය සේවාවන් ඉටුකර ගැනීමේදී බාධා ඇති විය. මේ අනුව මෙම කාර්යයන් අඛණ්ඩව සිදුකර ගැනීම සඳහා සංස්ථාව විසින් උපයාගත් අරමුදල් උපයෝගී කර ගැනීමට ද සිදුවිය. මෙහි ප්‍රතිඵලයක් ලෙස වාණිජමය හා සංවර්ධන කාර්යයන්හි ආයෝජනය සඳහා අරමුදල් හිඟතාවය ඇතිවිය.
- සැලසුම් කරන ලද පුහුණු වැඩසටහන් පැවැත්වීමට නොහැකි වීම.

5. අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා කජු සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මේ සමඟ ඉදිරිපත් කරමි.

මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් 2003 ජූනි මස 02 වනදා නිකුත් කළ චක්‍රලේඛ අංක පී.ඊ.ඩී/12 ට අනුව ශ්‍රී ලංකා කජු සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන 2023 සැප්තැම්බර් 12 වන දින විගණකාධිපතිතුමා වෙත ඉදිරිපත් කරන ලදී.

5.1 ආරම්භය

1972 අංක 11 දරණ රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ 2 වන වගන්තියේ 1 වන උප වගන්තිය යටතේ අංක 60/7 දරණ ගැසට් නිවේදනය මඟින් 1973 මැයි 25 දින ශ්‍රී ලංකා රජයේ අනුමැතිය හා එවකට වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගේ නියෝගය මත රු.මි. 40ක මූලික ප්‍රාග්ධනයකින් යුක්තව ශ්‍රී ලංකා කජු සංස්ථාව පිහිටුවන ලදී.

5.2 ප්‍රතිඵල

ප්‍රවර්තන වසරෙහි මූල්‍ය ප්‍රතිඵල සහ ස්කන්ධය වෙනස්වීම පිළිබඳ දත්ත ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය හා මූල්‍ය ප්‍රකාශන මඟින් අනාවරණය කර ඇත.

5.3 ව්‍යාපාර සමාලෝචනය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ ශ්‍රී ලංකා කජු සංස්ථාවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දක්වා ඇති අතර, ඒ පිළිබඳ ඇගයීමක් සභාපතිතුමාගේ වාර්තාවේ ඇතුළත් කර ඇත.

5.4 දේපළ, පිරියත හා උපකරණ

මූල්‍ය ප්‍රකාශනයෙහි ප්‍රවර්තන වසරට අදාළව දේපළ, පිරියත හා උපකරණවල සිදුවූ වෙනස්කම් මෙම වාර්තාවෙහි පිටු අංක 54හි සටහන් අංක 07 මඟින් පැහැදිලි කර ඇත. මෙම සටහනෙහි පෙන්වන වටිනාකම් සහ ඒවායේ වර්තමාන වෙළඳපොල අගය හා ප්‍රමාණාත්මක වෙනස්කම් නොපවතී.

5.5 සංචිත

මෙම වාර්තාවෙහි පිටු අංක 67හි සඳහන් ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය තුළ සංස්ථාවේ මුළු සංචිතවල සංයුතිය සඳහන්ව ඇත.

5.6 අධ්‍යක්ෂ මණ්ඩලය

වගුව 5.6 : 2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටි සාමාජිකයන්

අනු අංකය	නම	තනතුර
01.	ආර්.ඒ.එස්.කේ. රත්නායක මිය	සභාපතිනිය
02.	අශෝකා ලංකාතිලක මෙය	නියෝජ්‍ය සභාපතිනිය
03.	තිලකා ජයසුන්දර මිය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, විෂයභාර අමාත්‍යාංශයේ නියෝජිත, (2022.01.01 සිට 2022.01.31 දක්වා)
04.	ඒ.යූ.කේ.දොඩම්වල මිය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, විෂයභාර අමාත්‍යාංශයේ නියෝජිත, (2022.06.06 සිට 2022.12.31 දක්වා)
05.	කේ.ඒ.සී.ප්‍රියදර්ශනී මෙය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, මහා භාණ්ඩාගාර නියෝජිත, (2022.06.06 සිට 2022.12.31 දක්වා)
06.	චාමර සුභසිංහ මයා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
07.	උපාලි වඩුආරච්චි මයා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
08.	එච්.එම්.සී.කේ. හේරත් මයා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (2022.01.01 සිට 2022.01.31 දක්වා)
09.	අයි.ඩබ්.ඒ. සමන් කුමාර මයා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
10.	පී.බී. කොඩිකාර මයා	වැ.බ. සාමාන්‍යාධිකාරී, අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්, (2022.01.01 සිට 2022.08.15 දක්වා)
11.	කේ.එස්.විජයකීර්ති මයා	වැ.බ. සාමාන්‍යාධිකාරී, අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්, (2022.09.06 සිට)

5.7 විගණන හා කළමනාකරණ කමිටුව

රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශනයන්ට (Public Enterprises Guideline) අනුකූලව සංස්ථාවේ විගණන හා කළමනාකරණ කමිටුව පිහිටුවා ඇත.

5.8 ව්‍යවස්ථාපිත ගෙවීම්

රජයට සහ සේවකයන්ට ගෙවිය යුතු සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් නිසියාකාරව මෙම වර්ෂයේදී ගෙවා ඇත.

5.9 පාරිසරික ආරක්ෂාව

පරිසරයට අහිතකර හා පරිසරය දූෂණයට ලක්වන කිසිදු ක්‍රියාකාරකමකට සංස්ථාව විසින් මැදිහත් වී නොමැත.

5.10 මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනට පසු සිදුවීම්

ශේෂපත්‍ර දිනට පසු ගිණුම් මහින් ගැලපීම් කිරීමට හෝ හෙළිදරව් කිරීම සඳහා කිසිදු සිදුවීමක් වාර්තා වී නොමැත.

5.11 විගණකවරු

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට අදාළ ශ්‍රී ලංකා කපු සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන රජයේ විගණකාධිපති විසින් විගණනය කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය මත,



කේ.එස්.විජයකීර්ති මහතා
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

6. විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව

පූර්ව චක්‍රලේඛ උපදෙස් හා 2021.11.16 දිනැතිව නිකුත් කර ඇති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 01/2021 හි සඳහන් උපදෙස් ප්‍රකාරව 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා කපුු සංස්ථාවේ විගණන කමිටුව ස්ථාපිත කරන ලද අතර, එය සාමාජිකයන් පස් දෙනෙකුගෙන් හා එක් නිරීක්ෂකයෙකුගෙන් සමන්විත සමස්තය 06 දෙනෙකුගෙන් යුත් කමිටුවක් විය. එම විගණන හා කළමණාකරන කමිටුවේ සංයුතිය පහත පරිදි වේ.

වගුව 6.6 : 2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා විගණන හා කළමනාකරණ කමිටුවේ සිටි සාමාජිකයන්

අනු අංකය	නම	තනතුර
01	කේ.ඒ.සී. ප්‍රියදර්ශනී මෙය	කමිටු සභාපති, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික මහා භාණ්ඩාගාර නියෝජිත
02.	ඒ.යූ.කේ. දොඩම්වල මිය	කමිටු සාමාජික, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (විෂයභාර අමාත්‍යාංශයේ නියෝජිත)
03.	චාමර සුභසිංහ මයා	කමිටු සාමාජික, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
04.	පී.බී. කොඩිකාර මයා	කමිටු ලේකම් (වැ.බ.), සාමාන්‍යාධිකාරී (වැ.බ.) (2022.01.01 දින සිට 2022.08.15 දින දක්වා)
05.	කේ.එස්. විජයකීර්ති මයා	කමිටු ලේකම් (වැ.බ.), සාමාන්‍යාධිකාරී (වැ.බ.) (2022.09.02 දින සිට2022.12.31 දින දක්වා)
06.	වී.යු. ලියනගේ මයා	කමිටු කැඳවුම්කරු හා කමිටු සාමාජික, සහකාර සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන)
07.	ආර්.එම්.පී.ඒ. ජානක මයා	කමිටු නිරීක්ෂක, විගණන අධිකාරී ජාතික විගණන කාර්යාලය (2022.01.01 දින සිට 2022.11.16 දින දක්වා)
08.	ජී.කේ.යූ. අබේරත්න මිය	කමිටු නිරීක්ෂක, විගණන අධිකාරී ජාතික විගණන කාර්යාලය (2022.12.29 දින සිට 2022.12.31 දින දක්වා)

2022 වර්ෂය තුළදී මහා භාණ්ඩාගාරය නියෝජනය කරනු ලබන විධායක නොවන අධ්‍යක්ෂවරයා විගණන කමිටුවේ සභාපතිවරයා ලෙස කටයුතු කළ අතර, කමිටු ලේකම්වරයෙකු පත් කර නොතිබූ හෙයින් විගණන කමිටුවේ වැඩ බලන ලේකම්වරයා ලෙස මෙම සංස්ථාවේ වැඩ බලන සාමාන්‍යාධිකාරීවරයා කටයුතු කරන ලදී. 2022 වර්ෂයේදී පවත්වන ලද මුළු විගණන කමිටු රැස්වීම් ගණන 04කි.

සමාලෝචිත 2022 වර්ෂය තුළදී පවත්වනු ලැබූ විගණන කමිටු රැස්වීම්වලදී පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමට හා එම නිර්දේශ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් ලබාදුන් අනුමැතීන් ප්‍රකාරව අදාළ වැඩකටයුතුවල ප්‍රගතිය පිළිබඳව පසුවිපරම් කටයුතු සිදුකිරීමට විගණන කමිටුව විසින් කටයුතු කරන ලදී.

1. ශ්‍රී ලංකා කජු සංස්ථාව වෙත වගා අයිතිය පවරා ඇති නමුත් අදාල රාජ්‍ය ආයතන විසින් මෙතෙක් නීතිමය අයිතිය පවරා නොමැති සංස්ථා වතුයායන් හා බීජ උද්‍යාන ඉඩම්වල නීතිමය අයිතිය නිරවුල් කරගැනීම සඳහා විෂයභාර අමාත්‍යාංශයේ සහයෝගය ලබා ගනිමින් අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකිරීම.

2. විවිධ ප්‍රායෝගික ගැටළු හේතුකොටගෙන ප්‍රමාද වී තිබූ ශ්‍රී ලංකා කජු සංස්ථාවේ 2020 හා 2021 වර්ෂවල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ කටයුතු කඩිනමින් සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

3. සමාලෝචිත වර්ෂය තුළදී සංස්ථාවේ ක්‍රියාකාරකම්වලට අදාල ජාතික විගණන කාර්යාලය මඟින් නිකුත් කර තිබූ විගණන විමසුම්වල අන්තර්ගත නිරීක්ෂණ සම්බන්ධයෙන් සාකච්ඡා කර, ඊට අදාලව අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම.

4. සමාලෝචිත වර්ෂය තුළදී සංස්ථාවේ කටයුතුවලට අදාලව අභ්‍යන්තර විගණන අංශය මඟින් නිකුත් කර තිබූ වාර්තාවල අන්තර්ගත නිර්දේශ ක්‍රියාත්මක කිරීම්වල පැවති ගැටළු හඳුනාගෙන ඒ සම්බන්ධයෙන් අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම.

5. සමාලෝචිත වර්ෂය තුළදී සංස්ථාවේ වතුයායන් හා බීජ උද්‍යානවලින් එක්රැස් කරගත් ලෙලි කජු අස්වනු සම්බන්ධයෙන් වාර්තා වූ කරුණුවලට අනුව එම කටයුතුවල ප්‍රගතිය පිළිබඳ අවශ්‍ය සමාලෝචනයක් සිදුකිරීම.

6. සංස්ථාවේ වරලත් සහ වරලත් නොවන අලෙවිසැල්වල ණයගැති ශේෂ අයකරවා ගැනීමේදී සිදුවී ඇති ද්‍රව්‍යාත්මක ප්‍රමාදයන් සම්බන්ධයෙන් හේතු විමසා බලා ඊට අදාලව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම හා වරලත් හා වරලත් නොවන අලෙවිසැල් සඳහා කඩු මද ණයට විකුණුම් සිදුකිරීමේදී ඒ සඳහා අනුගමනය කළ යුතු විධිමත් ක්‍රමවේදය සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම.

7. සංස්ථාවේ පුත්තලම වතුයායේ ඇතිවූ හදිසි ගිනිගැනීම් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අංක 104 හි විධිවිධාන ප්‍රකාරව සිදුකර තිබූ පරීක්ෂණ වාර්තා සමාලෝචනය කර අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකිරීම.

8. සමාලෝචිත කාලසීමාව තුළදී සංස්ථාව මඟින් සිදුකර ඇති විවිධ ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් සමාලෝචනයක් සිදුකිරීම.

කේ.ඒ.සී. ප්‍රියදර්ශනී
සභාපති - විගණන හා කළමනාකරණ කමිටුව

7. 2022 වර්ෂය සඳහා කාර්යසාධන වාර්තාව

7.1 කජු වගා සහනාධාර යෝජනා ක්‍රමය හා සංවර්ධන වැඩසටහන්

භාණ්ඩාගාර ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද කජු වගා සහනාධාර යෝජනා ක්‍රමය යටතේ මෙම වර්ෂය තුළ බද්ධ කජු අක්කර 1169.26ක් හා බීජ කජු අක්කර 468ක් වශයෙන් මුළු අක්කර 1637.76ක් දිස්ත්‍රික්ක 20ක් ආවරණය වන පරිදි වගා කර ඇත. ගොවි පවුල් 3590ක් සඳහා මෙමඟින් ප්‍රතිලාභ ලැබුණි. 2022 වර්ෂයේදී මෙම සහනාධාර වැඩසටහන යටතේ විශේෂයෙන් ගෙවතු වගාව සඳහා ද පැළ ලබා දෙන ලදි. මෙම වැඩසටහන සඳහා වැයවුණු මුළු වියදම රු. මි.7.00කි. මෙම වර්ෂයේදී ද පෙර වර්ෂවල මෙන්ම පැවති කොරෝනා වසංගත තත්ත්වය නිසා අපේක්ෂිත මට්ටම කරා ළඟාවීමට නොහැකි වුවද, මෙම ව්‍යාපෘතිය සාර්ථකව නිම කිරීමට සංස්ථාවට හැකි විය.

7.2 වගාවේ ඵලදායිතාවය ඉහළ නැංවීම

7.2.1 රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

විවිධ ප්‍රදේශවලට උචිත නව ප්‍රභේද නිෂ්පාදනය කර කුඩා කජු ඉඩම් හිමියන් වෙත ලබාදීම සඳහා මාතලේ දිස්ත්‍රික්කයේ නාලන්ද, අනුරාධපුර දිස්ත්‍රික්කයේ විලච්චිය, අම්පාර දිස්ත්‍රික්කයේ මහඔය, මොණරාගල දිස්ත්‍රික්කයේ සුදුවතුර ආර සහ පුත්තලම දිස්ත්‍රික්කයේ එළුවන්කුලම යන බීජ උද්‍යාන නඩත්තු කරන ලදී. ව්‍යාප්ති සේවා සඳහා සහ වාණිජමය කාර්යයන් සඳහා අවශ්‍ය බද්ධ පැළ නිෂ්පාදනයට අවශ්‍ය ඉහළ ගුණාත්මයෙන් යුතු මව්බීජ 49000ක් හා අංකුර 39200ක් මෙමඟින් ලබාගන්නා ලදී. මේ සඳහා වැයවූ මුළු මුදල රු.මි.7.12කි. මෙම වර්ෂයේ රට තුළ පැවති ආර්ථික හා දේශපාලනික අස්ථාවර තත්ත්වය හේතුවෙන් මෙම වර්ෂයේදී පැළ නිෂ්පාදනය සීමා කිරීමට සිදු විය.

7.2.2 නිෂ්පාදනය වැඩිදියුණු කිරීම

කජු වගාවේ රෝග හා පළිබෝධ මර්දනය හා යහපත් කෘෂිකාර්මික ක්‍රමවේද (GAP) භාවිතයෙන් ඵලදායිතාවය ඉහළ නැංවීමේ අරමුණින් ‘‘හෙලෝපෙල්ටිස්’’ මකුණාගේ හානිය සහ කඳ හා මුල් විඳින පණු රෝග මර්දනය කිරීම සඳහා පළිබෝධ මර්දන

වැඩසටහන් දිවයින පුරා ක්‍රියාත්මක කරන ලදී. මීට අමතරව මෙම වර්ෂයේ රට තුළ පැවති ආර්ථික අස්ථාවර තත්ත්වය හේතුවෙන් සැලසුම් කරන ලද පුහුණු වැඩසටහන් පැවැත්වීමට නොහැකි විය.

එමෙන්ම මෙම වර්ෂයේ රටෙහි පැවති ආර්ථික අස්ථාවර තත්ත්වය හේතුවෙන් රසායනික පොහොර ආනයනය කිරීම සීමා කරන ලද අතර, මෙම තත්ත්වය මහහරවා ගැනීම සඳහා කමන්දළුව වතුයායේ කාබනික පොහොර මෙ.ටො. 10ක් නිෂ්පාදනය කර වගාව සඳහා යොදන ලදී.

7.2.3 පැළ තවාන් කළමනාකරණය

ශ්‍රී ලංකා කජු සංස්ථාව යටතේ මධ්‍යම පැළ තවාන් 08ක්, කමන්දළුව, මහියංගණය, හාඩි, මිහින්තලේ, චන්ද්‍රිකාවැව, දඹුල්ල, කුඹුක්කන හා මංගලගම පිහිටා ඇත. නවීන තාක්ෂණික තත්ත්වයන් යටතේ බද්ධ පැළ නිෂ්පාදනය කිරීම සඳහා සකසන ලද පොලි දැල් ගෘහ 06ක් කමන්දළුව, මිහින්තලේ, හාඩි, මහියංගනය පැළ තවාන්වල ඉදිකර ඇත.

මෙම තවාන්වල 2022 වර්ෂය සඳහා උසස් තත්ත්වයේ බද්ධ පැළ 440650ක් හා බීජ පැළ 21500ක් නිෂ්පාදනය කිරීමට සැලසුම් කර පැවතිය ද එම වර්ෂයේ රට තුළ පැවති අර්ථික අස්ථාවර තත්ත්වය හේතුවෙන් මහා භාණ්ඩාගාරයෙන් ලැබීමට නියමිතව තිබූ ප්‍රාග්ධන ප්‍රදානයන් සීමා වූ බැවින් පැළ නිෂ්පාදනය සීමා කිරීමට සිදු විය. 2021 වර්ෂයේ නිෂ්පාදන කර ඉතිරිව තිබූ බද්ධ පැළ හා බීජ පැළ නඩත්තු කිරීම මඟින් මෙම වසරේ පැළ අවශ්‍යතාවයන් සපුරා ගැනීමට කටයුතු කරන ලදි. මීට අමතරව 2022 වර්ෂය සඳහා බද්ධ පැළ 23296ක් හා බීජ පැළ 3494ක් සාර්ථකව නිෂ්පාදනය කරන ලදි.

7.2.4 සංවර්ධන ව්‍යාපෘති සඳහා පැළ ලබාදීම

2022 වර්ෂයේදී **"අපනයන ආශ්‍රිත කජු පොකුරු ගම්මාන ව්‍යාපෘතිය"** උක්, බඩ ඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය දායකත්වයෙන් බද්ධ කජු පැළ 34591ක් අක්කර 494ක වගා කිරීම සඳහා ප්‍රතිලාභීන් වෙත බෙදා දෙන ලදී. මෙම ව්‍යාපෘතිය සඳහා රාජ්‍ය අමාත්‍යාංශයෙන් රු.මි. 10.05ක් ලබාදෙන ලදී.

7.3 පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන්

ශ්‍රී වයඹ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය හා ඒකාබද්ධව පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. ශාක අභිජනනය, පොහොර භාවිතය, පැළ ඝනත්වය, කජු වගාවේ රෝග හා පළිබෝධ මර්දනය, අතුරු භෝග වගාව, බද්ධ හා බීජ වගාවන්, බද්ධ කිරීමේ තාක්ෂණික ක්‍රමවේද අස්වැන්න පිළිබඳව පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. අදාළ පර්යේෂණ ප්‍රතිඵල සම්බන්ධයෙන් වැඩමුළු සහ ව්‍යාප්ති සේවාවන් මඟින් ගොවීන් දැනුවත් කරනු ලැබේ. මීට අමතරව 2022 වර්ෂයේ පර්යේෂණ අංශය විසින් සිදු කරනු ලබන බහු වාර්ෂික පර්යේෂණ අඛණ්ඩව හා සංවර්ධන කටයුතු අඛණ්ඩව පවත්වා ගැනීම මෙම වර්ෂයේද සිදු කරන ලදි. මේ සඳහා වැයවූ මුදල රු.මි. 1.94කි.

7.4 සංස්ථා වතුයායන්වල නව වගාව සහ වගා පුනරුත්ථාපනය

2021 වර්ෂයේදී පුත්තලම වතුයායේ ආරම්භ කළ අක්කර 25ක නව වගා කටයුතු මෙම වර්ෂයේ සිදුකර, අවසන් කරන ලදි. මීට අමතරව කොණ්ඩච්චි වතුයායේ අක්කර 86ක් ද, පුත්තලම වතුයායේ අක්කර 20ක හා මහඔය වතුයායේ අක්කර 21ක ප්‍රමාණයක පාළු පැළ සිටුවන ලදි. මෙම වර්ෂයේ වතුයායන්ගෙන් ලැබුණු ලෙලි කජු අස්වැන්න මෙ.ටො.88.24ක් සහ පොල් ගෙඩි 92639ක් ලබා ගෙන ඇත. මෙම ව්‍යාපෘති සඳහා මහා භාණ්ඩාගාරයෙන් වෙන් කරන ලද ප්‍රතිපාදන තුළින් රු.මි 10.02ක මුදලක් හා සංස්ථාව විසින් උපයන ලද ආදායම් තුළින් රු.මි. 32.74ක මුදලක් වැය කර ඇත.

7.5 පසු අස්වනු තාක්ෂණය

7.5.1 අලෙවිකරණය හා පිරිසැකසුම් කර්මාන්ත ප්‍රවර්ධනය

සංස්ථා වතුයායන්ගෙන් ලද ලෙලි කජු අස්වැන්න, කජු පිරිසැකසුම් කටයුතු සිදු කරනු ලබන කුඩා පරිමාණ පිරිසැකසුම්කරුවන්ගෙන් මිලදී ගත් කජු මද පුත්තලම සහ නැදගමුවෙහි පිහිටි පිරිසැකසුම් මධ්‍යස්ථානවල පිරිසැකසුම් කරන ලදි. ඒවා අගය එකතු කළ නිෂ්පාදන ලෙස සංස්ථාවේ ප්‍රධාන අලෙවිසැල් මඟින් අලෙවි කරන ලදී. මේ සඳහා වරලත් අලෙවි සැල් 40කින් සමන්විත සංස්ථා අලෙවි සැල් ජාලයක් උපයෝගී කරගන්නා ලදි.

2022 වර්ෂයේ අලෙවි කටයුතු මඟින් සංස්ථාව උපයන ලද මුළු ආදායම රු.මි. 112.39කි. මෙයට අමතරව සංස්ථාව උපයන ආදායම් මඟින් පුත්තලම සහ නැදගමුව කජු පිරිසැකසුම් මධ්‍යස්ථානවල නඩත්තු කටයුතු සිදු කරනු ලැබේ. මේ සඳහා වැයවූ මුදල රු.මි. 26.65කි.

7.6 මානව සම්පත් සංවර්ධනය

කාර්ය මණ්ඩලයේ සියලුම තනතුරුවල නිලධාරීන්ගේ පුහුණුව හා සංවර්ධනය සඳහා අවශ්‍ය සේවාස්ථ පුහුණු සැසි පැවැත්වීමට කටයුතු සිදු කරන ලදී. මෙමඟින් කාර්ය ඵලදායිතාවය ඉහළ නැංවීමටත් ඔවුන්ගේ විෂය දැනුම යාවත්කාලීන කිරීමටත්, නව දැනුම ලබා ගැනීමටත් අවස්ථාව සැලසුණු අතර, ස්වයං පෙළඹවීම මඟින් කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට ද ඉඩ ප්‍රස්ථාව සැලසුණි.

2022 වසර තුළදී එක් නිලධාරියෙකු ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ පුහුණුව ලබා දීම සඳහා ජාතික වැවිලි කළමනාකරණ ආයතනය වෙත යොමු කරන ලදි. එසේම කළමනාකරණ සහකාර නිලධාරීන් දොළොස් 12ක් සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අනුග්‍රහය යටතේ පුහුණු වැඩසටහනක් පවත්වන ලදි.

8. කාර්යසාධනය ඉහළ නැංවීම පිණිස ගැනීමට අපේක්ෂිත මධ්‍යකාලීන ක්‍රියාමාර්ග

කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා සංස්ථාව විසින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ප්‍රධාන මධ්‍යකාලීන ක්‍රියාමාර්ග කිහිපයකි.

01. ශ්‍රී ලංකාවේ කජු වගා වපසරිය ඉහළ නැංවීම.
02. කජු වගා ඉඩම්වල ඵලදායිතාවය ඉහළ නැංවීම.
03. කජු වගාවේ පසු අස්වනු තාක්ෂණය ප්‍රවර්ධනය.
04. මානව සම්පත් සංවර්ධනය හා ඵලදායිතාවය ඉහළ නැංවීම.

8.1 ශ්‍රී ලංකාවේ කජු වගා වපසරිය ඉහළ නැංවීම

8.1.1 ව්‍යාප්ති වැඩසටහන් යටතේ කජු වගාව

ශ්‍රී ලංකාවේ කජු වගාව ප්‍රධාන වශයෙන් වියළි කලාපය තුළ ව්‍යාප්තව ඇත. පසුගිය දශක 03ක පමණ කාලයක පැවති යුධමය වාතාවරණය හේතුවෙන් උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල පිහිටි කජු වගා බිම් අක්කර 30000ක් පමණ විනාශ විය. එහෙත් වර්ෂ 2010 සිට සංස්ථාව විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාප්ති වැඩසටහන් යටතේ වර්ෂයකට අක්කර 5000කට අධික ඉඩම් ප්‍රමාණයක් කජු වගාවට නැඹුරු කරවීමට සමත්විය.

භාණ්ඩාගාර අරමුදල් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාප්ති සහනාධාර යෝජනා ක්‍රමය යටතේ බද්ධ හා බීජ කජු වගාව වර්ෂයකට අක්කර 3500 බැගින් ඉදිරි වසර 03 තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන අතර, ගෙවතු වගාව යටතේ වර්ෂයකට අක්කර 1000ක් පමණ වගා කිරීමට ද සැලසුම් කර ඇත.

8.1.2 වගා පුනරුත්ථාපනය

සංස්ථා වතුයායන්වල නව වගාව හා පැරණි වගා පුනරුත්ථාපනය කිරීම 2011 වර්ෂයේ සිට ආරම්භ කරන ලදී. මේ යටතේ උතුරු පළාතේ කොණ්ඩච්චි වතුයාය, පුනරීන් වතුයාය, වෙල්ලන්කුලම වතුයාය හා නැගෙනහිර පළාතේ මාණ්කර්නි වතුයාය හා

තිරියාය වතුයාය සංවර්ධනය සහ පුනරුත්ථාපන කටයුතු සංස්ථාව විසින් සිදුකරගෙන යනු ලබයි.

8.1.3 නව වගාව

ශ්‍රී ලංකාවේ කජු වගාව සිදු කරනු ලබන කුඩා සහ මධ්‍යම ප්‍රමාණයේ ඉඩම් හිමියන් සතු කජු වගාවන්වල නව වගාව වාර්ෂිකව අක්කර 500ක පමණ සිදු කෙරෙන අතර, ඉදිරි වසර 03 තුළ මෙම වගා නැඹුරුව අඛණ්ඩව පවතිනු ඇත. ඉහත සියලු වගා වැඩසටහන් මඟින් අවම වශයෙන් වාර්ෂිකව අක්කර 5000 බැගින් කජු වගා භූමි ප්‍රමාණය ඉහළ නැංවීමට කටයුතු කරනු ඇත.

මෙම කාර්යයන් සාර්ථකව ඉටු කිරීම සඳහා ප්‍රාදේශීය කාර්යාල 11කින් සමන්විත ව්‍යාප්ති සේවා ජාලයක් ක්‍රියාත්මක කරනු ලබන අතර, දිස්ත්‍රික්ක 20ක කජු වගා සංවර්ධන කටයුතු මෙමඟින් ආවරණය කරනු ලබයි.

8.1.4 සංවර්ධන ව්‍යාපෘති සඳහා කජු පැළ ලබාදීම

2022 වර්ෂයේදී උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැට්ටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය දායකත්වයෙන් **"අපනයන ආශ්‍රිත කජු පොකුරු ගම්මාන ව්‍යාපෘතිය"** යටතේ බද්ධ කජු පැළ 34591ක් කුරුණෑගල, වවුනියාව, ගම්පහ, මොණරාගල හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත අක්කර 494ක පමණ භූමි ප්‍රමාණයක වගා කිරීම සඳහා ලබා දෙන ලදි.

මෙමඟින් ගොවීන්ගේ ආර්ථික හා සාමාජීය මට්ටම ඉහළ නැංවීමට බලාපොරොත්තු වේ. එසේම මෙවැනි සංවර්ධන ව්‍යාපෘති ඉදිරි වර්ෂවලදී ද ක්‍රියාත්මක කිරීම තුළින් කජු වගා වපසරිය ඉහළ නැංවීම මෙහි මූලික අරමුණක් වේ.

8.2 කජු වගා ඉඩම්වල ඵලදායිතාවය ඉහළ නැංවීම

ශ්‍රී ලංකාවේ කජු වගා වපසරිය අක්කර 38853ක් පමණ වන අතර මින් 80%ක් පමණ කුඩා ඉඩම් හිමියන් වේ. බහුතරයක් ඉඩම්වල බීජ කජු ගස් වගා කර ඇති අතර, සංස්ථා වතුයායන්වල මෙන්ම මෙම ඉඩම්වලද කජු ගස්වල වයස අවුරුදු 20-35ක පමණ වන අතර, එක් ගසකින් ලෙලි කජු කි.ග්‍රෑ. 3-5ක අතර ප්‍රමාණයක් ලැබේ. වැඩි දියුණු කරන ලද නව කජු ප්‍රභේදවලින් සමන්විත කජු වගාවන් ඇති වියට්නාමය, ඉන්දියාව වැනි

රටවල ගසකින් කි.ග්‍රෑ. 10-15ක් අතර අස්වැන්නක් ලැබේ. මේ අනුව වගාවේ ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා සංස්ථාව විසින් පහත සඳහන් ක්‍රියාකාරකම් සිදුකරයි.

8.2.1 නව ප්‍රභේද හඳුන්වාදීම

මේ අනුව වැඩි අස්වැන්නක් ලබාදෙන වැඩිදියුණු කළ නව ප්‍රභේද 11ක් සංස්ථාව විසින් ගොවීන් වෙත හඳුන්වා දී ඇත. වයඹ විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය හා ඒකාබද්ධව පර්යේෂණ කටයුතු සිදු කෙරෙන අතර, WUCC 01, WUCC 02, WUCC 05, WUCC 07, WUCC 08, WUCC 09, WUCC 13, WUCC 16, WUCC 19, WUCC 21, WUCC 23 යන ප්‍රභේද 11ක් එළුවන්කුලම, විලච්චිය, නාලන්ද, මහඔය හා සුදුවතුර ආර යන බීජ උද්‍යානවල වගා කර ඇත. මෙම මව්ශාකවලින් අංකුර ලබාගෙන දිවයිනේ විවිධ දේශගුණික කලාපවලට උචිත නව ප්‍රභේද නිෂ්පාදනය කර, ගොවීන් වෙත ලබාදීමට කටයුතු කරනු ලැබේ. වාර්ෂිකව නව ප්‍රභේද 02 බැගින් හඳුන්වාදීමට කටයුතු කරන අතර, මෙමඟින් හෙක්ටයාරයකට ලැබෙන අස්වැන්න කි.ග්‍රෑ.1000ක් දක්වා ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ.

8.2.2 ප්‍රශස්ත කෘෂිකාර්මික ක්‍රමවේද භාවිතය

ඉතා අඩු අස්වැන්නක් ලබාදෙන බීජ කජු ගස් ඉවත් කර නැවත වගාව සිදුකිරීම සඳහා කුඩා ඉඩම් හිමියන් වාර්ෂිකව යොමු කරනු ලැබේ. යහපත් කෘෂිකාර්මික ක්‍රමවේද (GAP) භාවිතයෙන් කජු වගාවේ අස්වනු ඵලදායිතාවය ඉහළ නැංවීම අරමුණු කර ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ සහභාගීත්වය මත ගොවීන් පුහුණු කිරීමේ වැඩසටහන් වාර්ෂිකව සිදුකරනු ලැබේ. මෙය ඉදිරි වර්ෂ 03 තුළදී ද ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය. දෘෂ්‍ය මාධ්‍ය මේ සඳහා උපයෝගී කරගනු ලැබේ.

කජු ගස්වල මල් හටගන්නා කාලය තුළ අධික වර්ෂාපතනය පැවතීම නිසා දළු මැරීමේ රෝගය ව්‍යාප්ත විය. මේ නිසා කජු අස්වැන්න 30% - 40%ක් අතර ප්‍රමාණයකින් අඩුවේ. මේ සඳහා කුඩා ඉඩම් හිමියන් දැනුවත් කිරීම අත්‍යාවශ්‍ය වී ඇත. පරිණත කජු වගාවන් තුළ ඇති කඳ පණු හානිය මර්දනය කිරීම සඳහා පර්යේෂණ අංශ සමඟ ඒකාබද්ධ වැඩසටහනක් ක්‍රියාත්මක කරන අතර මෙය ඉදිරි වර්ෂ 03තුළදී ක්‍රියාත්මක කිරීමට නියමිතය.

8.2.3 මධ්‍යම පැළ තවාන්

සංස්ථාවේ මධ්‍යම පැළ තවාන් මිහින්තලේ, දඹුල්ල, කමන්දළුව (වතුයාය), මහියංගණය, කුඹුක්කන, හාඩි (වතුයාය), මංගලගම හා චන්ද්‍රිකාවැව යන ස්ථානවල ස්ථාපිත කර ඇත. මෙම තවාන් මඟින් නව ප්‍රභේදවලින් සමන්විත ඉහළ ගුණාත්මයෙන් යුක්ත බද්ධ පැළ සංස්ථා නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ නිෂ්පාදනය කර ගොවීන් වෙත නිකුත් කරනු ලැබේ.

වාර්ෂිකව බද්ධ පැළ 400000ක් පමණ නිෂ්පාදනය කරන අතර, මෙම වර්ෂයේදී රට තුළ පැවති අර්බුධකාරී තත්ත්වය හේතුවෙන් අපේක්ෂිත පැළ ප්‍රමාණයන් නිෂ්පාදනය කිරීමට නොහැකි වුවද ඉදිරි වර්ෂ 03 තුළදී වසරකට පැළ 400000ක් බැඟින් නිපදවීම අරමුණු කර ඇත. පැළ නිෂ්පාදනයේදී නව තාක්ෂණය භාවිතය වැඩිදියුණු කෙරෙනු ඇත.

8.3 කජු වගාවේ පසු අස්වනු තාක්ෂණය ප්‍රවර්ධනය

ශ්‍රී ලංකාවේ නිපදවන කජු මදවල රසවත් බව, ගුණාත්මකභාවයෙන් යුතු බව, විශාලත්වය හා ආවේණික වර්ණයෙන් යුක්ත වීම නිසා ලෝක වෙළඳපොල තුළ අධික ඉල්ලුමක් ඇතිවී ඇත. එහෙත් වාර්ෂිකව නිෂ්පාදනය වන ලෙලි කජු මෙ.ටො.10,000-12,000ක පමණ වාර්ෂික අස්වැන්න මඟින් මෙම අපනයන ධාරිතාවය ක්ෂණිකව ඉහළ නැංවීම දුෂ්කරවී ඇත. දේශීය කජු මද පරිභෝජනය ද ඉහළ ගොස් ඇත.

මීට අමතරව කජු මද කිලෝවක නිෂ්පාදන වියදම ඉහළ යාම නිසා කජු මද කිලෝවක මිල රු. 5,000/=ත් රු. 6,000/=ත් අතර පරාසයක පවතී. මෙම කරුණු සැළකිල්ලට ගෙන කජු මද නිෂ්පාදනවල ගුණාත්මය හා ලාභය ඉහළ නැංවීම සඳහා සංස්ථාව විසින් ක්‍රියාමාර්ග රාශියක් ගෙන ඇත.

8.3.1 ප්‍රශස්ත නිෂ්පාදන ක්‍රමවේද භාවිතය

සංස්ථාව විසින් කුඩා පරිමාණ ව්‍යවසායකයන් සඳහා ප්‍රමිතිකරණය, අගය එකතු කිරීම හා යහපත් නිෂ්පාදන ක්‍රමවේද (GMP) භාවිතයෙන් නිෂ්පාදනවල තත්ත්වය ඉහළ නැංවීම, සෞඛ්‍යාරක්ෂිත නිෂ්පාදන ක්‍රමවේද භාවිතය, නව තාක්ෂණය සහිතව පිරිසැකසුම් ක්‍රියාවලිය නවීකරණය කිරීම, අඩු වියදම් විජලන යන්ත්‍ර භාවිතය හා නව ඇසුරුම් ක්‍රම හා නව නිෂ්පාදන සඳහා ව්‍යවසායකයන් උනන්දු කිරීම සිදු කෙරේ. මේ

සඳහා නැඳගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානයේ පවතින පුහුණු මධ්‍යස්ථානය උපයෝගී කරගනු ලැබේ.

8.3.2 පුහුණු වැඩසටහන්

කුඩා පරිමාණ නිෂ්පාදකයින්ගේ නිෂ්පාදන ජාත්‍යන්තර ප්‍රමිති තත්ත්වයන් දක්වා ඉහළ නැංවීමට සංස්ථාවේ දායකත්වය ලබා දුන් අතර, වාර්ෂිකව පිරිසැකසුම් කර්මාන්තයේ නියැලෙන්නන් 50ක් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීමට කටයුතු කර ඇත. මෙම වැඩසටහන් ඉදිරි වසර 03 තුළ අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලැබේ.

කජු පිරිසැකසුම් කර්මාන්තය ආරම්භ කරන්නන්හට අවශ්‍ය විදුලි බලයෙන් ක්‍රියා කරන කැපීමේ යන්ත්‍ර (Shelling Machine) හා විජලන යන්ත්‍ර (Ovens) සංස්ථාවේ මැදිහත්වීම මත පහසු මිලට ලබා දීමේ වැඩසටහනක් ද ක්‍රියාත්මක කෙරෙන අතර, මෙය අඛණ්ඩව ක්‍රියාත්මක කෙරේ.

8.3.3 ලෙලි කජු මිලදී ගැනීම

සංස්ථා වතුයායන්වලින් ලැබෙන ලෙලි කජු අස්වැන්නට අමතරව පිරිසැකසුම් කර්මාන්තශාලාවල අඛණ්ඩව වාර්ෂික නිෂ්පාදනය සිදුකිරීම සඳහා අවශ්‍ය ලෙලි කජු සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව මඟින් මිලදීගැනීම පසුගිය වසර තුළදී සිදු කරන ලදී. සංස්ථා වතුයායන්ට අයත් කොණ්ඩව්වි වතුයායේ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව මඟින් අක්කර 935ක් පමණ වගාකර ඇති අතර, එම කජු වෙළඳපොල මිලට වඩා අඩු මිලට සංස්ථාවට සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව මඟින් ලබාදෙනු ලැබේ. වෙළඳපොල තරඟකාරී තත්ත්වයන්ට මුහුණදීම සහ පිරිවැය අවම කිරීමේ පරමාර්ථයෙන් මෙම ලෙලි කජු මිලදීගැනීම සිදුකරන ලදී. ඉදිරි වර්ෂ 03 තුළදී ද මෙම ලෙලි කජු මිලට ගැනීමට කටයුතු කරනු ලැබේ.

8.3.4 කජු අතුරු නිෂ්පාදන ප්‍රවර්ධනය

කජු අස්වැන්න මඟින් ප්‍රධාන වශයෙන්ම ලෙලි කජු වෙන් කරගන්නා අතර කජු පුහුලන් ප්‍රයෝජනයට නොගෙන අපතේ යයි. මේ අනුව වාර්ෂිකව කජු පුහුලන් මෙ.ටො. 120000කට අධික ප්‍රමාණයක් ප්‍රයෝජනයට නොගෙන විනාශ වී යයි. මෙම කජු පුහුලන් භාවිතකර Non-Alcoholic Beverages, ජෑම්, කෝඩියල් වැනි අතුරු

නිෂ්පාදන සම්බන්ධයෙන් පර්යේෂණ කිරීම, පුහුණුව ලබා දීම සහ පෞද්ගලික අංශය සමඟ නිෂ්පාදන සහ අලෙවි කටයුතු සම්බන්ධයෙන් ඒකාබද්ධ වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලබයි. මීට අමතරව කජු පුහුලන් මඟින් වයින් සහ ස්ප්‍රීතු නිෂ්පාදනය කිරීම සඳහා ද ව්‍යාපෘති යෝජනාවක් සකස් කරමින් පවතින අතර ඉදිරි වර්ෂවලදී මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ.

8.4 මානව සම්පත් සංවර්ධනය හා ඵලදායිතාවය ඉහළ නැංවීම

8.4.1 මානව සම්පත් පුහුණු කිරීම හා සංවර්ධනය

කාර්ය මණ්ඩලයේ සියලුම තනතුරුවල නිලධාරීන්ගේ පුහුණුව හා සංවර්ධනය සඳහා අවශ්‍ය සේවාස්ථ පුහුණු සැසි පැවැත්වීමට කටයුතු සිදුකර ඇත. මෙමඟින් කාර්ය ඵලදායිතාවය ඉහළ නැංවීමටත් ඔවුන්ගේ විෂය දැනුම යාවත්කාලීන කිරීමටත්, නව දැනුම ලබාගැනීමටත් අවස්ථාව සැලසෙන අතර, ස්වයං පෙළඹවීම මඟින් කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමටත් ඉඩ ප්‍රස්ථා සැලසේ. මෙම පුහුණු වැඩසටහන් ඉදිරි වර්ෂ 03තුළ අඛණ්ඩව සිදුකිරීමට සැලසුම් කර ඇත.

8.4.2 කාර්ය මණ්ඩල ව්‍යුහය ප්‍රතිසංවිධානය හා කාර්යසාධන ඇගයීම

පුහුණු වැඩසටහන් මඟින් සේවකයන්ගේ කාර්ය ඵලදායිතාවය ඉහළ නැංවීමටත්, ඔවුන්ගේ විෂය දැනුම යාවත්කාලීන කිරීමටත්, නව දැනුම ලබා ගැනීමටත් අවස්ථාව සැලසෙන අතර ස්වයං පෙළඹවීම මඟින් කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට ඉඩ ප්‍රස්ථාව සැලසේ. මෙම පුහුණු වැඩසටහන් අඛණ්ඩව ඉදිරි වසරවල සිදු කිරීමට සැලසුම් කර ඇත. එමෙන්ම ප්‍රධාන කාර්යාලයේ හා ප්‍රාදේශීය කාර්යාලයන්වල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා ද සැලසුම් සකස් කර ඇත.

එමෙන්ම සියලුම තනතුරුවල කාර්යසාධනය ඇගයීම් සිදුකිරීමට ද අවශ්‍ය පියවර ගෙන ඇත. මීට අමතරව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ වැනි පරීක්ෂණයන් පවත්වා අදාළ උසස් වීම් ලබා දීම් වැනි කාර්යයන් සිදු කිරීමට සැලසුම් කර ඇත.

9. කාර්යසාධනය පිළිබඳ වසර 05ක සාරාංශය

	විස්තරය	2022	2021	2020	2019	2018
01	සහනාධාර යෝජනා ක්‍රමය යටතේ වගා කරන ලද කජු අක්කර ප්‍රමාණය	සහනාධාර වැඩසටහන 1169.26 ගෙවතු වගාව 468.00 එකතුව 1637.26	සහනාධාර වැඩසටහ 2920 ගෙවතු වගාව 1080 එකතුව 4000	සහනාධාර වැඩසටහන 2568 ගෙවතු වගාව 932 එකතුව 3500	සහනාධාර වැඩසටහන 3305 ගෙවතු වගාව 1195 එකතුව 4500	සහනාධාර වැඩසටහන 3305 ගෙවතු වගාව 1195 එකතුව 4500
02	සහනාධාර යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලබන ගොවි පවුල් සංඛ්‍යාව	3590	5384	7676	11069	11818
03	නිෂ්පාදනය කරන ලද පැළ ගණන	බද්ධ පැළ 23296 බීජ පැළ 18770 එකතුව 42066	බද්ධ පැළ 511230 බීජ පැළ 17360 එකතුව 528590	බද්ධ පැළ 422570 බීජ පැළ 54500 එකතුව 477070	බද්ධ පැළ 270294 බීජ පැළ 79945 එකතුව 350239	බද්ධ පැළ 197353 බීජ පැළ 80007 එකතුව 277360
04	එක්රැස් කරන ලද මව්බීජ සංඛ්‍යාව	49000	799785	500000	500000	484753
05	එක්රැස් කරන ලද අංකුර ප්‍රමාණය	39200	800000	520000	310000	164500
06	ලබාගත් අස්වැන්න (මෙ.ටො.)	88.24	106.0	149.46	157.81	83.52
07	සංස්ථා වතුයායන්වල නව වගාව (අක්කර)	25	90	346	52.5	65
08	වරලත් අලෙවිසැල් සංඛ්‍යාව	40	69	74	56	60

විස්තරය		2022	2021	2020	2019	2018
09	තාක්ෂණ හුවමාරු හා පළිබෝධ පාලනය සහ පසු අස්වනු තාක්ෂණය යටතේ පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව	-	30	82	166	139
10	පුහුණු කරන ලද ගොවීන් සංඛ්‍යාව	558	663	1,369	2,320	3,550
11	ආනයනය කරන ලද කෘෂි ප්‍රමාණය (මෙ.ටො.)	ලෙලි කෘෂි 207.57 කෘෂි මද -	ලෙලි කෘෂි 0.051 කෘෂි මද 0.047	ලෙලි කෘෂි 549.2 කෘෂි මද 0.025	ලෙලි කෘෂි 527.26 කෘෂි මද 0.826	ලෙලි කෘෂි 2,378.02 කෘෂි මද 156.41
12	කෘෂි ආනයන බලපත්‍ර නිකුත් කරන ලද ප්‍රමාණය (මෙ.ටො.)	100	-	500	-	4,255
13	කෘෂි අපනයනය කරන ලද ප්‍රමාණය (මෙ.ටො.)	58.20	26.26	34.32	47.40	60.81
14	කෘෂි අපනයනය කරන ලද වටිනාකම (රු.මී)	212.83	89.07	81.13	93.57	144.62
15	ලෙලි කෘෂි සහ කෘෂි මද මිලදි ගැනීම (මෙ.ටො.)	ලෙලි කෘෂි 79.05 කෘෂි මද -	ලෙලි කෘෂි 54.81 කෘෂි මද -	ලෙලි කෘෂි 64.0 කෘෂි මද -	ලෙලි කෘෂි 20.0 කෘෂි මද -	ලෙලි කෘෂි - කෘෂි මද 5.3
16	අගය එකතු කරන ලද කෘෂි මද විකුණුම් ප්‍රමාණය (මෙ.ටො.)	21.55	26.8	16.91	21.72	24.74
17	අගය එකතු කරන ලද කෘෂි මද විකුණුම් වටිනාකම (රු.මී)	112.39	92.12	47.23	79.08	83.15

10. විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ පදනම් කරගත් ගිණුම් ප්‍රතිපත්ති - 2022

10.1 පදනම් කරගත් ගිණුම් ප්‍රතිපත්ති - 2022

01. පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත මත ගිණුම් පිළියෙල කර ඇත.

02. ස්ථාවර වත්කම් සරළ මාර්ග ක්‍රමය මත ක්ෂය කරන ලදී. වර්ෂය තුළ මිලට ගත් වත්කම් ගත් දිනය පදනම් කරගෙන ක්ෂය ගණනය කරන ලදී. වර්ෂය තුළ නිම කරන ලද ගොඩනැගිලි නිම කරන ලද දිනය පදනම් කරගැනීමෙන් නොව මුළු වර්ෂය සඳහාම ක්ෂය ගණනය කරන ලදී.

ක්ෂය කිරීමේ ප්‍රතිශත පහත සඳහන් පරිදි වේ

මෝටර් වාහන	20%
යන්ත්‍ර සූත්‍ර	10%
මෙවලම් හා උපකරණ	10%
කාර්යාලීය උපකරණ	10%
නළ ලිං/වගා ලිං	10%
ලී බඩු උපකරණ සහ සවිකිරීම්	06%
ස්ථිර ගොඩනැගිලි	03%
අර්ධ ස්ථිර ගොඩනැගිලි	33 1/3%

03. දේපල පිරියත සහ උපකරණ ලෙස හඳුනාගත් වත්කම් පිරිවැයට ගිණුම්ගත කර ඇත. දේපල පිරියත සහ උපකරණවල අගය ප්‍රත්‍යාගණන වටිනාකම මත සමුච්චිත ක්ෂය හා හානිකරණ ලද අලාභ අඩුකර දක්වා ඇත.

04. පහත සඳහන් පදනම මත තොග ගණනය කරන ලදී.

කජු මද	:	ශුද්ධ විකුණුම් මිලෙන්
ලෙලි කජු	:	සහනික කළ වෙනස් වන මිල/වෙළෙඳ පොළ මිල
ගව සහ බැටළු	:	ඒ ඒ පළාත්වල වෙළෙඳ මිල/ජීව බර අනුව
පොල්	:	ශුද්ධ විකුණුම් මිල
අනෙකුත් සියලුම තොග	:	පිරිවැයට ගණනය කරන ලදී.

05. ප්‍රධාන කාර්යාලීය වියදම් පිරිවැය මධ්‍යස්ථාන අතර එහි අන්තර්ගත මුළු වැටුප් වියදමට අදාලව බෙදා හරින ලදී

06. වතුයායන්හි සාමාන්‍ය වියදම් ඵල දරණ සහ ඵල නොදරණ වගාවන්, පැළ තවාන් සහ සත්ත්ව පාලනය අතර බෙදීම එම ප්‍රදේශ සඳහා වැයවූ සත්‍ය කම්කරු දින ගණනේ අනුපාතය අනුව බෙදා හරින ලදි.

07. ඵල දරණ වගාවල ක්‍රමක්ෂය කිරීම වර්ෂයකට 5% බැගින් ගණනය කරන ලදි.

08. බොල් ණය සහ අඩමාන ණය වෙන් කිරීම මුළු ණයගැතියන්ගෙන් 3.53% බැගින් ගණනය කර ඇත. වෙන් කිරීම් ගිණුමේ වෙනස වර්ෂය තුළ බොල් ණය කපා හැරීම සඳහා මාරු කරන ලදී.

09. පාරිතෝෂික දීමනා සඳහා වෙන් කිරීම පාරිතෝෂික දීමනා පනතේ සඳහන් පරිදි සේවය කරන ලද සම්පූර්ණ වර්ෂ ගණනකට අනුව ගණනය කරන ලදී. පාරිතෝෂික හිමිකම් ලැබීම සඳහා පනතේ සඳහන් අවම සේවා කාලය ගිණුම් වර්ෂය තුලදී සම්පූර්ණවූ අයගේ සේවා පිරිවැය ආදායම් ගිණුමට හර කර ඇත.

10. ලැබූ හා ලැබිය යුතු දෑවල වටිනාකම මත ආදායම ගිණුම්ගත කර ඇත.

පහත සඳහන් දෑ සැලකිල්ලට ගෙන භාණ්ඩ විකිණීමේ ආදායම හඳුනාගෙන ඇත.

- ආයතනය අවදානම හා ප්‍රතිලාභ යන දෙකම ගැණුම්කරුට ලබාදේ.
- ආයතන කළමනාකාරිත්වයේ මැදිහත්වීමක් විකුණන භාණ්ඩවල හිමිකාරිත්වයට හෝ කාර්යක්ෂම පාලනයක් තබා ගැනීම සඳහා මැදිහත් නොවේ.
- ආදායම විශ්වාසනීය ලෙස හඳුනාගත හැකි වීම.
- ගණුදෙනු හා අදාල ආර්ථික ප්‍රතිලාභයන් ආයතනයට ගලායා හැක.
- ගණුදෙනුවට අදාල වූ හෝ අදාල විය හැකි පිරිවැය විශ්වාසනීය ලෙස අගය කිරීම

11. ප්‍රාග්ධන වත්කම්හි ක්ෂයවීම් හා ක්‍රමක්ෂය ලෙස ගිණුම් පොත්වලට ඇතුළත් කර ඇති සත්‍ය වටිනාකම්, අදාල ප්‍රාග්ධන වත්කම්වලින් කපා හැරීමෙන් අනතුරුව ඊට සමාන වටිනාකමක් ප්‍රාග්ධන ප්‍රදානවලින් ඉවත් කර ගිණුම්පොත්වල ආදායමක් ලෙස හඳුනාගනු ලැබේ.

12. මෝටර් වාහන ප්‍රත්‍යාගණනය 2009.01.01 දින සිට බලපැවැත්වෙන දිනය ලෙස නිශ්චය කරන අතර, පිළිගත් රාජ්‍ය ආයතනයක කාර්මික ඉංජිනේරුවරයෙකුගේ මූලිකත්වයෙන් යුතු ස්වාධීන කොමිසමක් මඟින් කරන ලදී.

13. බද්ධ සහ බීජ පැළ නිෂ්පාදනයට අදාළ පරිපාලන වියදම් සේවා වාණිජ අංශ අතර, නිෂ්පාදිත සත්‍ය පැළ හා බෙදාහරින ලද පැළ පදනම් කරගෙන ඇත.

10.2 විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන

ශ්‍රී ලංකා කපු සංස්ථාව

31.12.2021 **2022.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

රු.	වත්කම්	සටහන්	රු.	රු.
	ජංගම නොවන වත්කම්			
117,553,407.32	දේපල පිරියත හා උපකරණ	07	116,124,752.11	
28,053,376.57	ඵල දරන වගා නඩත්තු වියදම්	08	25,316,396.38	
71,591,554.11	ඵල නොදරන වගා නඩත්තු වියදම්	09	98,080,023.96	
627,768.04	අනෙකුත් කුඩා ව්‍යාපෘති	10	588,524.09	
6,362,983.10	කෙරීගෙන යන වැඩ-ප්‍රාග්ධන		6,542,597.00	
224,189,089.14	**මුළු ජංගම නොවන වත්කම්**			**246,652,293.54**
	ජංගම වත්කම්			
90,952,157.31	තොග	11	76,769,613.94	
47,390,219.63	වෙළඳ ණයගැතියෝ සහ ලැබිය යුතු අනෙකුත් දෑ	12	31,800,793.00	
43,812,917.85	තැන්පතු අත්තිකාරම් හා පූර්ව ගෙවීම්	13	50,638,657.60	
159,875,737.30	මුදල් සහ මුදල් සමාන දෑ	14	143,842,699.56	
342,031,032.09	**මුළු ජංගම වත්කම්**			303,051,764.10
566,220,121.23	**මුළු වත්කම්**			**549,704,057.64**
	ස්කන්ධ සහ වගකීම්			
	ස්කන්ධ			
40,000,000.00	මූලික ප්‍රාග්ධනය		40,000,000.00	
289,534,925.21	රාජ්‍ය ප්‍රදාන		281,565,222.86	
286,736,184.04	අනෙකුත් පාර්ශවයන්ගෙන් ලැබුණු ප්‍රදාන	15	280,919,046.17	
17,441,846.85	ප්‍රාග්ධන සංචිත	16	17,441,846.85	
(167,065,129.24)	ලාභ අලාභ ගිණුම		(152,058,776.37)	467,867,339.51
466,647,826.86	**මුළු ස්කන්ධ**			
	ජංගම නොවන වගකීම්			
42,948,044.00	පාරිනෝෂික දීමනා සඳහා	17	35,789,916.00	
3,500,000.00	දිගුකාලීන ණය	18	3,500,000.00	
46,448,044.00	**මුළු ජංගම නොවන වගකීම්**			39,289,916.00
	ජංගම වගකීම්			
53,124,250.37	වෙළඳ ණයහිමියෝ සහ ගෙවිය යුතු අනෙකුත් දෑ	19	42,546,802.13	
	මුළු ජංගම වගකීම්			42,546,802.13
566,220,121.23	**මුළු ස්කන්ධ සහ වගකීම්**			**549,704,057.64**

ආර්.ඒ.එස්.කේ. රත්නායක සභාපතිනි	අශෝකා ලංකාතිලක නියෝජ්‍ය සභාපතිනි	කේ.එස්.විජයකීර්ති සාමාන්‍යාධිකාරි (වැ.බ)	එම්.ටී.එස්.කේ.පිරිස් ස.සාමාන්‍යාධිකාරි - මුදල්

(සටහන් 07) දේපළ, පිරියත සහ උපකරණ

විස්තරය	පිරිවැය/ ප්‍රත්‍යාගණන අගය 2022.01.01 (රු.)	අදාල වසරේ වත්කම් එකතුවීම්/ ප්‍රත්‍යාගණනය (රු.)	අදාල වසරේ වත්කම් ඉවත්කිරීම්/ විකුණුම් (රු.)	වත්කමේ වර්තමාන පිරිවැය/ ප්‍රත්‍යාගණන වටිනාකම 2022.12.31 (රු.)	2022.01.01 දිනට සමුච්චිත ක්ෂය (රු.)	2022 වර්ෂය සඳහා ක්ෂය කිරීම් (රු.)	2022.12.31 දිනට සමුච්චිත ක්ෂය (රු.)	ලියා හරින ලද අගය 2022.12.31 (රු.)
සින්නක්කර ඉඩම්	28,335,084.54	-	-	28,335,084.54	-	-	-	28,335,084.54
ස්ථාවර ගොඩනැගිලි	62,147,027.78	505,273.30	-	62,652,301.08	24,641,689.70	1,695,332.49	26,340,617.19	36,311,683.89
අර්ධ ස්ථිර ගොඩනැගිලි	825,751.00	-	-	825,751.00	626,377.97	108,406.70	734,784.67	90,966.33
වාහන	129,792,682.84	-	-	128,075,837.84	103,536,165.63	5,752,818.66	109,288,984.29	18,786,853.55
යන්ත්‍ර සූත්‍ර	31,539,163.45	7,902,000.00	-	39,441,163.45	16,800,467.60	2,247,163.34	19,047,630.94	20,393,532,51
මෙවලම් හා උපකරණ	13,130,916.20	755,826.25	-	13,886,742.45	8,627,756.27	649,502.84	9,277,259.11	4,609,483.34
කාර්යාලීය උපකරණ	13,182,407,09	-	-	13,182,407.09	10,760,367.50	438,430.40	11,198,797.90	1,983,609.19
ලී බඩු හා සවිකිරීම්	8,835,948.82	132,600.00	-	8,968,548.82	5,832,683.93	306,690.05	6,139,373.98	2,829,174.84
නළ ළිං	1,065,218.18	1,762,404.00	-	2,827,622.18	803,258.58	104,319.41	907,577.99	1,920,044.19
වගා ළිං	1,333,680.40	-	-	1,333,680.40	967,951.58	110,233.71	1,078,185.29	255,495.11
වැව්	608,824.62		-	608,824.62	-	-	-	608,824.62
	290,796,704.92	**1,158,103.55**	-	**300,137,963.47**	**172,596,718.76**	**11,412,897.60**	**184,013,211.36**	**116,124,752.11**

❖ නැඳගමුව සහ පුත්තලම කජු පිරිසැකසුම් මධ්‍යස්ථාන දෙක පිහිටා ඇත්තේ ශ්‍රී ලංකා කජු සංස්ථාවට අයිති ඉඩමක වේ. අනෙකුත් ඉඩම්වල අයිතිය රජය සතු හෝ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව (LRC) සතුවේ. මෙම ඉඩම් දීර්ඝකාලීන කල්බදු පදනම යටතේ අත්පත් කරගැනීම සඳහා කටයුතු සිදුකරමින් පවතී.

2022.12.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සඳහා සටහන්

31.12.2021 (රු.)		31.12.2022 (රු.)
	එල දරන වගාව වියදම්	
26,732,690.52	කජු සටහන් - 8 (අ)	24,159,358.85
1,320,686.05	පොල් සටහන් - 8 (ආ)	1,157,037.53
28,053,376.57	එකතුව	**25,316,396.38**

සටහන් - 8 (අ)

එල දරන වගාව-කජු

31.12.2021 (රු.)	වතුයාය	2022.01.01 දිනට පිරිවැය (රු.)	2022.12.31 දිනට සමුච්චිත ක්‍රම ක්ෂය (රු.)	2022.12.31 දිනට ශුද්ධ වටිනාකම (රු.)
838,197.25	හාඩි වතුයාය	3,180,107.38	2,455,222.26	724,885.12
4,429,531.19	කමන්දළුව වතුයාය	18,387,204.86	14,381,929.41	4,005,275.45
4,173,188.27	පුත්තලම වතුයාය	11,089,242.26	7,470,516.10	3,618,726,16
880,991.90	එළුවන්කුලම ශා.අභි.මධ්‍යස්ථානය	13,933,185.28	13,403,426.78	529,758.50
328,493.12	විලව්විය ශා.අභි.මධ්‍යස්ථානය	655,569.86	359,855.23	295,714.63
3,364,049.08	නාලන්ද ශාක අභි.මධ්‍යස්ථානය	5,963,253.57	2,897,367.17	3,065,886.40
1,082,841.82	මහඔය ශාක අභි. මධ්‍යස්ථානය	1,641,264.30	640,485.70	1,000,778.60
1,498,010.61	මොණරාගල ශාක අභි. මධ්‍යස්ථානය	2,331,959.19	950,546.54	1,381,412.65
1,128,538.04	මාන්කර්ණි වතුයාය	1,410,672.56	352,668.15	1,058,004.41
9,008,849.24	කොණ්ඩව්වි ශාක අභි.මධ්‍යස්ථානය	10,598,646.17	2,119,729.24	8,478,916.93
26,732,690.52	**එකතුව**	**69,191,105.43**	**45,031,746.58**	**24,159,358.85**

සටහන - 8 (ආ)

එල දරන වගාව-පොල්

31.12.2021 (රු.)	වතුයාය	2022.01.01 දිනට පිරිවැය (රු.)	2022.12.31 දිනට සමුච්චිත ක්ෂය (රු.)	2022.12.31 දිනට ලියා හරින ලද අගය (රු.)
774,998.93	හාඩි වතුයාය	1,650,793.13	958,333.86	692,459.27
545,686.12	කමන්දළුව වතුයාය	2,437,612.22	1,973,034.96	464,577.26
1.00	පුත්තලම වතුයාය	431,998.76	431,997.76	1.00
1,320,686.05		**4,520,404.11**	**3,363,366.58**	**1,157,037.53**

ශ්‍රී ලංකා කජු සංස්ථාව

2021.12.31 දිනට	එල නොදරන වගාවේ වියදම්			2022.12.31 දිනට
(රු.)				(රු.)
68,404,053.37	කජු සටහන් 9 (අ)			93,717,023.22
3,187,500.74	පොල් සටහන් 9 (ආ)			4,363.000.74
71,591,554.11	**එකතුව**			**98,080,023.96**

සටහන් 9 (අ)

2021.12.31 දිනට පිරිවැය	**එල නොදරන වගාව - කජු**	**2022.01.01 දිනට පිරිවැය (රු)**	2022.12.31 දිනට සෘජු වියදම් (රු.)	**2022.12.31 දිනට පිරිවැය (රු.)**
	වතුයාය			
2,280,660.86	භාඩි වතුයාය	2,280,660.86	220,108.91	2,500,769.77
768,465.60	කමන්දළුව වතුයාය	768,465.60	68,108.65	836,574.25
16,466,684.48	පුත්තලම වතුයාය	16,466,684.48	2,061,096.33	18,527,780.81
3,288,527.13	එළුවන්කුලම ශාක අභි.මධ්‍යස්ථානය	3,288,527.13	1,623,348.32	4,911,875.45
937,705.06	මාන්කර්ණි වතුයාය	937,705.06	438,337.87	1,376,042.93
680,972.05	මහඔය ශාක අභි. මධ්‍යස්ථානය	680,972.05	189,954.40	870,926.45
81,552.00	මොණරාගල ශාක අභි.මධ්‍යස්ථානය	81,552.00	-	81,552.00
2,103,465.79	පර්යේෂණ හා සංවර්ධන	2,103,465.79	-	2,103,465.79
135,360.40	නැදගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානය	135,360.40	-	135,360.40
1,628,450.40	පුනරීන් වතුයාය	1,628,450.40	-	1,628,450.40
4,436,749.44	වෙල්ලන්කුලම් වතුයාය	4,436,749.44	5,847.00	4,442,596.44
188,524.12	විලව්චිය ශාක අභිජනන මධ්‍යස්ථානය	188,524.12	141,760.50	330,284.62
33,403,107.83	කොණ්ඩව්චි ශාක අභි. මධ්‍යස්ථානය	33,403,107.83	19,669,606.99	53,072,714.82
2,003,828.21	තිරියාය ශාක අභිජනන මධ්‍යස්ථානය	2,003,828.21	894,800.88	2,898,629.09
68,404,053,37	**එකතුව**	**68,404,053.37**	**25,312,969.85**	**93,717,023.22**

සටහන් 9 (ආ)

2021.12.31 දිනට පිරිවැය (රු.)	**එල නොදරණ වගාව - පොල්**	**2022.01.01 දිනට පිරිවැය (රු)**	**2022.12.31 දිනට සෘජු වියදම් (රු)**	**2022.12.31 දිනට පිරිවැය (රු.)**
1,667,021.57	භාඩි වතුයාය	1,667,021.57	166,500.00	1,833,521.57
1,520,479.17	කමන්දළුව වතුයාය	1,520,479.17	1,009,000.00	2,529,479.17
3,187,500.74		**3,187,500.74**	**1,175,500.00**	**4,363,000.74**

සටහන් 10

අනෙකුත් කුඩා ව්‍යාපෘති

2021.12.31 දිනට පිරිවැය (රු.)		2022.12.31 දිනට පිරිවැය (රු.)
482,874.09	තේක්ක පැළ ව්‍යාපෘතිය	482,874.09
93,650.00	දිවුල් ව්‍යාපෘතිය	93,650.00
39,243.95	මඤ්ඤොක්කා	-
12,000.00	ගම්මිරිස්	12,000.00
627,768.04		**588,524.09**

සටහන් 11

ජංගම වත්කම්

තොග

3,894,533.06	කජු මද - අලෙවිසැල්	10,685,093.21
7,400,301.51	- පිරිසැකසුම් මධ්‍යස්ථාන	30,113,893.39
20,530,888.30	කජු පැළ	16,343,218,51
54,705,437.34	ලෙලි කජු	14,951,472.29
293,650.00	කුළුබඩු නිෂ්පාදන	-
1,842,931.94	ඇසුරුම් ද්‍රව්‍ය	2,573,074.23
2,284,415.16	විවිධ	2,102,862.31
90,952,157.31		**76,769,613.94**

2021.12.31 (රු.)	සටහන් 12		2022.12.31 (රු.)
	වෙළෙඳ ණයගැතියෝ හා ලැබිය යුතු අනෙකුත් දෑ		
6,443,158.44	වෙළඳ ණයගැතියෝ	8,263,310.76	
227,443.00	**අඩු කළා:- බොල්ණය වෙන් කිරීම**	291,695.00	7,971,615.76
6,215,715.44			
43,280,688.61	ලැබියයුතු අනෙකුත් දෑ	25,935,361.66	
2,106,184.42	**අඩු කළා:- හානි වීම් වලින්වන අලාභ**	2,106,184.42	23,829,177.24
47,390,219.63			**31,800,793.00**

සටහන් 13

තැන්පතු අත්තිකාරම් සහ පෙර ගෙවුම්

10,765,975.00	අත්තිකාරම්	14,541,184.00
16,000.00	වේතන අත්තිකාරම්	16,000.00
29,267,519.65	පෙර ගෙවුම්	30,793,050.40
3,763,423.20	කුලී සහ වෙනත් තැන්පතු	5,288,423.20
43,812,917.85		**50,638,657.60**

සටහන් 14
මුදල් හා මුදල් සමාන දෑ

162,408.83	ලංකා බැංකුව - කොල්ලුපිටිය	1633704	(ජංගම)	337,708.29
2,950,274.34	ලංකා බැංකුව - කොල්ලුපිටිය	1633705	(ජංගම)	8,487,922.27
580,522.08	ලංකා බැංකුව - කොල්ලුපිටිය	1633710	(ජංගම)	781,490.32
4,686,599.60	ලංකා බැංකුව - කොල්ලුපිටිය	1633711	(ජංගම)	659,122.04
146,393,432.10	ලංකා බැංකුව - කොල්ලුපිටිය	1649789	(ඉතුරුම්)	131,210,295.14
3,140,436.07	ලංකා බැංකුව - කොල්ලුපිටිය	1649970	(ඉතුරුම්)	91,973.77
15,593.10	ලංකා බැංකුව-ජා ඇල	813	(ජංගම)	15,593.10
7,750.00	මහජන බැංකුව-නුගේගොඩ	174-1-001-3007348	(ජංගම)	7,750.00
4,452.09	මහජන බැංකුව-නුගේගොඩ	174-2-001-10007348	(ඉතුරුම්)	4,587.44
252,855.41	මහජන බැංකුව-නුගේගොඩ	174-2-002-0-0007348	(ඉතුරුම්)	270,824.17
30,757.13	ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	134011100687	(ඉතුරුම්)	31,555.14
-	මුදල් -අත ඉතිරි (අඹේපුස්ස අලෙවිසැල)			37,840.00
-	මුදල් -අත ඉතිරි (බලංගොඩ අලෙවිසැල)			27,540.00
-	මුදල් -අත ඉතිරි (නාරාහේන්පිට අලෙවිසැල)			21,320.00
-	මුදල් -අත ඉතිරි (කොල්ලුපිටිය අලෙවිසැල)			91,960.00
-	මුදල් -අත ඉතිරි (රාජගිරිය අලෙවිසැල)			217,911.00
10,000.00	සුළු මුදල් අග්‍රිමය			10,000.00
50,000.00	ඉන්ධන අග්‍රිමය			80,000.00
5,000.00	මුදල් අග්‍රිමය- මුද්දර			10,000.00
280,000.00	කජු අලෙවිසැල් අග්‍රිමය			275,000.00
200,000.00	මුදල් කිරීම සඳහා ඇති වෙක්පත්			200,000.00
457,515.25	මුදල් -අත ඉතිරි (වාණිජ තවාන්)			300,330.25
5,878.00	මුදල්-අත ඉතිරි (ව්‍යාප්ති)			9,892.00
151,105.00	මුදල් -අත ඉතිරි (පර්යේෂණ හා සංවර්ධන)			151,105.00
31,016.52	මුදල් -අත ඉතිරි (නැදගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානය)			54,610.96
539,13	මුදල් -අත ඉතිරි (පුත්තලම පිරිසැකසුම් මධ්‍යස්ථානය)			168,521.23
393.25	මුදල් -අත ඉතිරි (හාඩ් වතුයාය)			7,404.84
263,009.02	මුදල්-අත ඉතිරි (කමන්දළුව වතුයාය)			28,327.52
705.45	මුදල්-අත ඉතිරි (මාන්කර්ණි ශාක අභිජනන මධ්‍යස්ථානය)			656.07
32,102.91	මුදල් -අත ඉතිරි (පුත්තලම වතුයාය)			40,579.91
137,515.12	මුදල්- අත ඉතිරි (එළුවන්කුලම වතුයාය)			11,589.25
14,496.00	මුදල් -අත ඉතිරි (ඇල්කඩුව ශාක අභිජනන මධ්‍යස්ථානය)			19,400.00
490.00	මුදල් -අත ඉතිරි (වෙල්ලන්කුලම ශාක අභිජනන මධ්‍යස්ථානය)			154.70
211.90	මුදල් -අත ඉතිරි (තිරියාය ශාක අභිජනන මධ්‍යස්ථානය)			160.15
-	මුදල් -අත ඉතිරි (පුනරීන් වතුයාය)			115.00
4,818.00	මුදල්-අත ඉතිරි (කොණ්ඩච්චි වතුයාය)			173,599.00
5,861.00	මුදල් -අත ඉතිරි (වයින් ව්‍යාපෘතිය)			5,861.00
159,875,737.30	**එකතුව**			**143,842,699.56**

2021 (රු.)	සටහන් 15 අනෙකුත් පාර්ශවයන්ගෙන් ලැබුණු ප්‍රදාන	2022 (රු.)
5,484,438.08	උතුරු නැගෙනහිර වෙරළබඩ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිය	5,275,688.03
9,542,335.45	සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය	9,381,298.63
271,709,410.51	උක්, බඩඉරිගු, කපු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැට්, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධන සහ අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	266,262,059.51
286,736,184.04		**280,919,046.17**
	සටහන් 16	
	ප්‍රාග්ධන සංචිත	
16,929,116.63	ප්‍රත්‍යාගණන සංචිතය-වාහන	16,929,116.63
512,730.22	අනෙකුත් ප්‍රාග්ධන සංචිත	512,730.22
17,441,846.85	**එකතුව**	**17,441,846.85**
	සටහන් 17	
	විශ්‍රාමික දීමනා ගෙවීම්	
		42,948,044.00
38,953,602.00	වර්ෂය ආරම්භයේදී තිබූ ශේෂය	4,656,007.00
	වර්ෂයට අදාල ගෙවීම්	(11,814,135.00)
4,679,120.00		
(684,678.00)	ගෙවන ලද/ ගෙවීමට ඇති පාරිතෝෂික දීමනා	
42,948,044.00	**එකතුව**	**35,789,916.00**
	සටහන් 18	
	දිගුකාලීන ණය	
3,500, 000.00	වී අලෙවි මණ්ඩලය	3,500,000.00
3,500,000.00	**එකතුව**	**3,500,000.00**
	සටහන් 19	
	වෙළඳ ණය හිමියෝ සහ අනෙකුත් ගෙවියයුතු දෑ	
43,853,682.11	විවිධ ණය හිමියෝ	35,448,561.19
9,270,568.26	උපචිත වියදම්	7,098,240.94
53,124,250.37	**එකතුව**	**42,546,802.13**

- පාරිතෝෂික ගෙවීම් සඳහා රු.35,789,916.00 ක මුදල ආයෝජනය කර නොමැත. මේ සඳහා අයෝජනය කිරීමට අදාල ක්‍රියාමාර්ග ඉදිරියේදී කඩිනමින් සිදුකිරීමට නියමිතයි.

අතිරේක සටහන් ඉදිරිපත් කිරීම.

සටහන් 20

ප්‍රාග්ධන ප්‍රයාපනයන් සහ අසම්භාව්‍යයන්

ප්‍රාග්ධන ප්‍රයාපනයන්

20.1 මෙම සංස්ථාව සතුව සැලකිය යුතු හා කැපී පෙනෙන ප්‍රාග්ධන ප්‍රයාපනයන් වාර්තා කරන දිනට වාර්තා නොවේ.

අසම්භාව්‍ය වගකීම්

20.2 වාර්තා කරන දිනට අදාලව කිසිදු අසම්භාව්‍ය වගකීමක් අණාවරණය වී නොමැත.

උසාවි නඩු අංකය	විස්තරය	වර්තමාන තත්ත්වය
ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක 185/2021	සංස්ථාවේ හිටපු සාමාන්‍යාධිකාරීවරයකු වන ඩී.මැදගෙදර මහතාගේ සේවය අත්හිටුවන ලද අතර, ඔහු විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් ගොණුකර, නැවත සේවයේ ස්ථාපිත කිරීමට හෝ වන්දියක් ලබාදීමට ඉල්ලුම්කර ඇත.	අදාල නඩුව විභාගවෙමින් පවතී.

සටහන් 21

වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසු සිදුවීම්

අදාල වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසුව සිදුකල යුතු ගැලපීම් හා අනාවරණය කිරීම් මෙම මූල්‍ය ප්‍රකාශවලට අදාලව නොමැත.

සටහන් 22

22.1 **සම්බන්ධිත පාර්ශව සමඟ සිදුකල ගණුදෙණු සම්බන්ධිත පාර්ශවයන්ට ගෙවිය යුතු ගෙවීම්.**

වී අලෙවි මණ්ඩලය	3,500,000.00

22.2 **සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු මුදල්**

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය	9,466,200.00
ජාතිය ගොඩනැගීමේ අමාත්‍යාංශය	1,962,800.00
	11,429,000.00

2022.12.31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ලාභාලාභ හා වෙනත් විස්තීරණ ආදායම් සඳහා ප්‍රකාශය

2021.12.31(රු)				(රු)
139,222,590.64	විකුණුම්	01		134,849,168.44
99,660,553.32	විකුණුම් පිරිවැය	02		83,472,666.14
39,562,037.32	දළ ලාභය (අලාභය)			**51,376,502.30**
64,800,000.00	රාජ්‍ය ප්‍රදාන (පුනරාවර්තන)			77,500,000.00
42,726,523.72	වෙනත් ආදායම්	03		69,390,183.13
147,088,561.04				**198,266,685.43**
15,682,534.12	විකුණුම් හා බෙදාහැරීමේ වියදම්	04	15,029,109.31	
135,189,584.58	පරිපාලන වියදම්	05	145,510,078.61	
12,192,843.64	වෙනත් වියදම්	06	23,101,087.38	
435,783.38	මූල්‍ය වියදම්		154,999.16	
163,500,745.72				183,795,274.46
(16,412,184.68)	වාර්ෂික ලාභය/ (අලාභය)			**14,471,410.97**
	වෙනත් විස්තීරණ ආදායම්			
(16,412,184.68)	වාර්ෂික ලාභය/ (අලාභය)			**14,471,410.97**
3,317,448.50	ආයුගණක ලාභය/(අලාභය)			(2,232,295.00)
-	වෙනත් විස්තීරණ ආදායම් සඳහා			-
(3,317,448.50)	ආදායම් බදු			**(2,232,295.00)**
	වර්ෂය සඳහා වෙනත් විස්තීරණ ආදායම්			
(19,729,633.18)	වර්ෂය සඳහා ඉපයූ මුළු විස්තීරණ ආදායම			**16,703,705.97**

ශ්‍රී ලංකා කපු සංස්ථාව

2022.12.31 දිනට අදාල ලාභාලාභ ගිණුමට අදාල සටහන්

සටහන් 1

විකුණුම්	**2022** වර්ෂය	**2021** වර්ෂය
කපු මද	113,791,178.44	92,633,678.85
අඩුකලා : ආපසු එවුම්		(517,524.00)
		92,116,154.85
	113,791,178.44	
පැළ		44,856,435.79
	21,057,990.00	
ලෙලි කපු		2,250,000.00
		-
	134,849,168.44	
		139,222,590.64

සටහන් 2	**2022** වර්ෂය	**2021** වර්ෂය
2022.12.31 දිනට වෙළඳ ගිණුම		
විකුණුම් පිරිවැය		
ආරම්භක තොගය		**16,130,255.10**
	24,425,421.36	
කපු මඳ		4,336,211.00
	3,894,533.06	
කපු පැළ		11,794,044.10
	20,530,888.30	
එකතු කලා - මිලට ගැනීම්		
මිලට ගැනීම්		
නිෂ්පාදන වියදම්-කපු මඳ		
	98,903,031.69	86,445,004.97
නිෂ්පාදන වියදම් - කපු පැළ		
	13,985,793.66	34,248,932.88
	112,888,825.35	120,693,937.85
		136,824,192.95
	137,314,246.71	
අඩුකලා - අවසන් තොගය		
කපු මඳ		3,894,533.06
	10,685,093.21	
කපු පැළ		20,530,888.30
	16,343,218.51	
		-
අඩුකලා:		
අභ්‍යන්තර මාරුකිරීම් (පැළ)		10,117,010.45
	21,303,755.70	
විශේෂ පැළ නිකුත් කිරීම්		
මැරුණු පැළ	936,400.21	1,882,876.90
	3,615,782.19	
නියැඳි සහ පැසසුම්		738,330.92
	957,330.75	
		37,163,639.63
		99,660,553.32

සටහන් 3

වෙනත් ආදායම්

	2022 වර්ෂය	**2021 වර්ෂය**
පොළී ආදායම් (ඉතුරුම් ගිණුම්)	4,667,302.86	2,690,393.70
පොළී ආදායම් (ආපදා ණය/ විශේෂ ණය)	220,972.45	9,369.89
ලෙලි කපු ආනයන සේවා ගාස්තු	1,000,000.00	750,000.00
විවිධ ආදායම්	15,875,290.90	3,240,012.15
සංචාරක බංගලා කුලී ආදායම්	117,200.00	25,250.00
ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රම ක්ෂයකිරීම	42,786,840.22	31,701,078.49
පොල් විකුණුම්		3,482,090.49
කුළුබඩු නිෂ්පාදන විකුණුම්		828,329.00
	614,659.00	
	69,390,183.13	**42,726,523.72**

ශ්‍රී ලංකා කෘෂි සංස්ථාව

සටහන් 4

විකුණුම් හා බෙදාහැරීමේ වියදම්	**සංස්ථාව ඉපැයූ ආදායම්**	**ප්‍රාග්ධන ප්‍රදාන**	**2022 වර්ෂය**	**2021 වර්ෂය**
විකුණුම් හා බෙදාහැරීමේ වියදම්	15,029,109.31	-	15,029,109.31	15,682,534.12
			15,029,109.31	15,682,534.12

සටහන් 5

පරිපාලන වියදම්	**සංස්ථාව ඉපැයූ ආදායම්**	**ප්‍රාග්ධන ප්‍රදාන**	**2022**	**2021**
වාණිජ පැළ තවාන්	2,618,117.96	-	2,618,117.96	3,137,581.45
ප්‍රධාන කාර්යාලය	129,447,214.74	-	129,447,214.74	117,500,277.66
අලෙවි කටයුතු	895,310.87	-	895,310.87	543,770.32
පළ නොදරන වගාව	-	981,754.00	981,754.00	1,446,741.94
මානව සම්පත් සංවර්ධනය	-	5000.00	5000.00	215,875.50
ව්‍යාප්ති අංශය	-	9,132,226.65	9,132,226.65	8,825,034.08
පර්යේෂණ සහ සංවර්ධනය	-	2,430,454.39	2,430,454.39	3,520,303.63
	132,960,643.57	**12,549,435.04**	**145,510,078.61**	**135,189,584.58**

සටහන් 6

	සංස්ථාව ඉපැයූ ආදායම්	**ප්‍රාග්ධන ප්‍රදාන**	**2022**	**2021**
වෙනත් වියදම්				
හෙලෝපෙල්ටිස් පාලන වැඩසටහන	-	91,433.80	91,433.80	120,367.78
ඵල දරන වගාව - පොල්	1,482,884.13	-	1,482,884.13	474,015,19
කුළුබඩු මිලදීගැනීමේ පිරිවැය	662,758.00	-	662,758.00	788,350.00
පැළ සඳහා පිරිවැය	-	17,248,229.26	17,248,229.26	8,927,233.77
මැරුණු පැළ	3,615,782.19	-	3,615,782.19	1,882,876.90
	5,761,424.32	**17,339,663.06**	**23,101,087.38**	**12,192,843,64**

ශ්‍රී ලංකා කජු සංස්ථාව

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2021.12.31		2022.12.31 දිනෙන් අවසන් වර්ෂය	
(රු)		(රු)	(රු)
	මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය		
(19,729,633.18)	වර්ෂය තුල ලාභ/අලාභය		16,703,705.97
2,302,852.99	පෙර වසර සඳහා ගැලපීම්		(1,697,353.10)
	මුදල් චලනයන් නොවූ අයිතමයන් සඳහා ගැලපීම්		
7,039,191.87	ක්ෂය වීම්	11,416,492.60	
3,082,406.05	ක්‍රමක්ෂය	2,736,980.19	
10,599,828,50	පාරිතෝෂික දීමනා සඳහා වෙන් කිරීම	4,656,008.00	
(10,760.00)	බොල්ණය සඳහා ලියා හැරීම හෝ වෙන් කිරීම	64,252.00	
-	පාරිතෝෂික දීමනා සඳහා අධි වෙන්කිරීම	(6,837,703.50)	
-	මෝටර් රථ සඳහා ලියාහරින ලද පිරිවැය	1,716,845.00	
-	මෝටර් රථ සඳහා ලියාහරින ලද සම්මුචිත ක්ෂය කිරීම්	(646,578.84)	
(854,581.20)	වෙනත් පාර්ශවයන්ගෙන් ලත් ප්‍රදාන ලියාහැරීම	(369,786.87)	
-	අනෙකුත් කුඩා ව්‍යාපෘති ලියා හැරීම	39,243.95	
(2,699,763.59)	පොලී ආදායම් ලැබීම්	(4,888,275.31)	
(30,846,497.29)	රාජ්‍ය ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම්	(36,969,702.35)	(29,082,225.13)
(31,116,955.85)	කාරක ප්‍රාග්ධනයේ වෙනසට පෙර මෙහෙයු ලාභය /අලාභය		(14,075,872.26)
	කාරක ප්‍රාග්ධන වෙනස්වීම්		
(26,484,483.71)	තොගය-(වැඩිවීම)/අඩුවීම	14,182,543.37	
(28,904,491.68)	ණය ගැනියෝ-(වැඩිවීම)/අඩුවීම	15,525,174.63	
(33,984,739.77)	අත්තිකාරම් සහ පෙර ගෙවුම්-(වැඩිවීම)/අඩුවීම	(6,825,739.75)	
(8,203,979.64)	ණය හිමියෝ -වැඩිවීම/(අඩුවීම)	(8,405,120.92)	
(5,030,826.04)	උපචිත වියදම්-වැඩිවීම/(අඩුවීම)	(2,172,327.32)	
(102,608,520.84)			12,304,530.01
(133,725,476.69)			(1,771,342.25)
(6,605,386.50)	පාරිතෝෂික ගෙවීම්		(4,976,432.50)
(140,330,863.19)	මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		**(6,747,774,75)**
	ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය		
(46,708,729.44)	ස්ථාවර වත්කම් මිලදී ගැනීම	(11,058,103.55)	
(6,240,640.10)	කෙරීගෙන යන ප්‍රාග්ධන වියදම	(179,613.90)	
(11,261,974.70)	නව වගාව සඳහා ආයෝජනය කිරීම	(26,488,469.85)	
2,699,763.59	පොලී ආදායම් ලැබීම්	4,888,275.31	
(51,243.95)	වෙනත් කුඩා ව්‍යාපෘති සඳහා ආයෝජනය	-	
(61,562,824.60)			**(32,837,911.99)**

	මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් ජනිත වූ මුදල් ප්‍රවාහය		
64,000,000.00	රාජ්‍ය ප්‍රදාන		29,000,000.00
255,253,204.84	අමාත්‍යාංශවලින් ලද ප්‍රදාන		(5,447,351.00)
117,359,517.05	මුදල් හා මුදල් හා සමාන දෑ වල ශුද්ධ වැඩිවීම		(16,033,037.74)
4,516,220.25	වසර ආරම්භයේ මුදල් හා මුදල් හා සමාන දෑ		159,875,737.30
159,875,737.30	වසර අවසානයේ මුදල් හා මුදල් හා සමාන දෑ		**143,842,699.56**
2021.12.31 දිනට			**31.12.2022**
1,650,656.55	අත ඇති මුදල්		1,943,877.88
8,403,147.95	බැංකුගත මුදල්		10,289,586.02
149,821,932.80	ඉතුරුම්		131,609,235.66
159,875,737.30			**143,842,699.56**

2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය

වෙනස්වීම්	මූලික ප්‍රාග්ධනය (රු.)	රාජ්‍ය ප්‍රාග්ධනය (රු.)	වෙනත් පාර්ශවයන්ගෙන් ලත් ප්‍රදාන	ප්‍රාග්ධන සංචිත (රු.)	ලාභාලාභ ගිණුම (රු.)	එකතුව (රු.)
2021.01.01 දිනට ශේෂය	40,000,000.00	256,381,422.50	32,337,560.40	17,441,846.85	(149,638,349.05)	196,522,480.70
පෙර වර්ෂයට අදාල ගැලපුම්	-	-	-	-	2,302,852.99	2,302,852.99
වර්ෂය තුලදී ලද ප්‍රදාන	-	64,000,000.00	255,253,204.84	-	-	319,253,204.84
ලාභ අලාභ ගිණුමට මාරු කිරීම	-	(30,846,497.29)	(854,581.20)	-	-	(31,701,078.49)
මුළු විස්තීරණ ආදායම	-	-	-	-	(19,729,633.18)	(19,729,633.18)
2021.12.31 දිනට ශේෂය	**40,000,000.00**	**289,534,925.21**	**286,736,184.04**	**17,441,846.85**	**(167,065,129.24)**	**466,647,826.86**
2022.01.01 දිනට ශේය	40,000,000.00	289,534,925.21	286,736,184.04	17,441,846.85	(167,065,129.24)	466,647,826.86
පෙර වර්ෂයට අදාල ගැලපුම්	-	-		-	(1,697,353.10)	(1,697,353.10)
වර්ෂය තුලදී ලද ප්‍රදාන	-	29,000,000.00	(5,817,137.87	-	-	29,000,000.00
ලාභ අලාභ ගිණුමට මාරු කිරීම	-	(36,969,702.35)			-	(42,786,840.22
වාර්ෂික ලාභය / (අලාභය)	-	-		-	14,471,410.97	14,471,410.97
ශුද්ධ සත්‍ය වැඩිවීම / (අඩුවීම)	-			-	2,232,295.0	2,232,295.0
2021.12.31 දිනට ශේෂය	**40,000,000.00**	**281,565,222.86**	**280,919,046.17**	**17,441,846.85**	**(152,058,776.37)**	**467,867,339.51**

11. විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. ARI/D/SLCC/FA/2022/02

ඔබේ අංකය / உமது இல. / Your No

දිනය / திகதி / Date 2023 දෙසැම්බර් 28 දින

සභාපතිනි

ශ්‍රී ලංකා කපු සංස්ථාව

ශ්‍රී ලංකා කපු සංස්ථාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 නත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා කපු සංස්ථාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තිර්ණ ආදායම ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ නත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 12 හි 15 වගන්තිය ප්‍රකාරව, සංස්ථාව විසින් විලම්භිත බදු වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගෙන නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 51 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් රු. 133,557,771 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවති අතර එම වත්කම්වල ඵලදායී ජීවිතකාලය නැවත තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. ඒ අනුව වූ

ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 8 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 79 වගන්තිය අනුව දැනට භාවිතයේ පවතින සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද දේපල, පිරියත හා උපකරණ වල දල ධාරණ අගය (Gross Carrying Value amount) මූල්‍ය ප්‍රකාශනවල හෙලිදරව් කල යුතු වුවද සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද පිරිවැය රු. 133,557,771 ක් වූ දේපල, පිරියත හා උපකරණ පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල හෙලිදරව් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 (සේවක ප්‍රතිලාභ) හි 139 වැනි වගන්තිය ප්‍රකාරව විශ්‍රාමික පාරිතෝෂික වෙන්කිරීම් විධිමත් ආයෝජන සැලැස්මකට අනුව ආයෝජනය කළයුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසාන දිනට විශ්‍රාමික පාරිතෝෂික වෙන්කිරීම් ගිණුමේ රු. 35,789,916 ක ශේෂයට අනුරූපිව කිසිදු ආයෝජනයක් සිදු කර නොතිබුණි.

(ඉ) හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය තුලින් සිදුකල යුතු පසුගිය වර්ෂයේ වාහන අලුත්වැඩියා කිරීම් ප්‍රාග්ධනීත කිරීම වෙනුවෙන් කරන ලද ක්ෂය වෙන්කිරීම් දෝෂය නිවැරදි කිරීම, සමාලෝචිත වර්ෂයේදී ක්ෂය ගිණුමට බැර කිරීම හේතුවෙන් මෙම වර්ෂයේ ලාභය රු. 646,579 කින් වැඩි වී තිබුණි.

(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 19 (සේවක ප්‍රතිලාභ) හි 135 (ආ) ඡේදය ප්‍රකාරව අස්ථීත්වයක් විසින් නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම (Defined benefit plans) සඳහා ආරම්භක ශේෂයේ පටන් අවසාන ශේෂය දක්වා සංසන්දනය කිරීමක් ඉදිරිපත් කර නොතිබුණි. සංස්ථාව විසින් එහි ප්‍රවර්තන සේවා පිරිවැය, පොලි ආදායම හෝ වියදම, සමාලෝචිත වර්ෂයට අදාලව සිදු කරන ලද ගෙවීම් සහ ආයුගණන ප්‍රතිලාභ ලාභය/අලාභය යනාදී අයිතමයන් වෙන් වශයෙන් දැක්විය යුතු වුවත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි නිර්වචිත ප්‍රතිලාභ සැලැස්මට අදාල සටහනෙහි එහි එකතුව වර්ෂය සඳහා වියදම් ලෙස පෙන්වා තිබුණි.

(උ) සංස්ථාවේ ණය අයකරගැනීමේ කාලසීමාව දින 60 ක් වුවද දින 90 ඉක්මවූ වෙළඳ ණයගැති ශේෂය රු.2,994,271 ක් වුවද, එම ශේෂය තුළ ඇතුළත් වසර දෙකකට වඩා වැඩි කාලයක සිට පවතින කොළඹ ප්‍රදේශයේ පිහිටි පෞද්ගලික ආයතනයකින් අයවිය යුතු රු. 1,499,410 ක ණය ශේෂය අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඌ) එවකට පැවති ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට රු.9,466,200 ක කඳු පැළ ලබාදී වසර 10 ක් ගත වී තිබුණි. අදාළ අමාත්‍යාංශය වර්තමානයේ අහෝසි කර ඇති හෙයින් එම ණය අයකර ගැනීමේ හැකියාවක් නොමැතිකම නිරීක්ෂණය කෙරේ.

(එ) වර්ෂ 01 කට වඩා වැඩි වෙනත් ණයගැති වටිනාකම රු.18,857,611 ක් සඳහා වෙන් කරන ලද හානිකරණ අලාභය රු.2,106,184 ක් වූ අතර 2018 වර්ෂයේ සිට එය සෑම වර්ෂයකම එකම අගයක් පවත්වා ඇතත් එම අගය වාර්ෂිකව යාවත්කාලීන කිරීමක් හෝ අගයන් කපාහැරීමක් හෝ වෙනත් පියවරක් ගෙන නොතිබුණි. වසර 02 ට වැඩි වෙළඳ ණයගැති ශේෂයන් වූ ආයතන දෙකකින් අයවිය යුතු රු.102,830 ක මුදලද මෙම හානිකරණ අලාභය තුළ ඇතුළත්ව තිබුණි.

(ඒ) සංස්ථාවේ පුත්තලම දිස්ත්‍රික්කයේ එළුවන්කුලම් වතුයායේ 2000 වර්ෂයේදී වගා කරන ලද තේක්ක පැළ 2022 වර්ෂය වන විට දැව ලබා ගැනීමේ තත්ත්වය දක්වා වර්ධනය වී ඇති ගස් ප්‍රමාණය 3,350 ක් පමණ වුවද, එම ගස්වල වටිනාකම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ නත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සංස්ථාවේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සංස්ථාවේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සංස්ථාවේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම් වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංස්ථාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම් මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් නිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරවිකිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවිකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල වැදගත් හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරන්නන වාර්තාවෙන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම් කොටසේ 1.2 (අ), (ඇ) , (ඌ) හා (එ) දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගත්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම් තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති/ විධානයට යොමුව	නිරීක්ෂණ
(අ)	2017 අංක 24 දරන දේශීය ආදායම් පනත	2011 වර්ෂයේ සිට ආදායම් බදු ගෙවීමට හා ආදායම් බදු වාර්තා යැවීමට කටයුතු කර නොතිබුණි. එහෙත් මූල්‍ය ප්‍රකාශන වල එම කාලපරිච්ඡේදවලට අදාළව රු.779,483 ක රඳවාගත් බදු (WHT) ලැබිය යුතු ශේෂයක් පෙන්නුම් කර තිබුණි.

(ආ)	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 18 වගන්තිය	ඉන්වොයිස් පත්‍රයේ සඳහන් දිනයේ සිට දින තිහක් ඇතුළත විගණන ගාස්තු නිරවුල් කළයුතු වුවත් 2023 ජුනි 23 දිනට විගණන ගාස්තුව වූ රු.930,000 ක් නිරවුල් කර නොතිබුණි.
(ඇ)	මුදල් රෙගුලාසි 105 හා 106	මුදල්, වෙක්පත් ආදිය නැතිවූ අවස්ථාවකදී සිදුවූ නත්‍ය අලාභය අයකර ගතයුතු අතර ඒ නැතිවූ මුදල වගකිම පැවරී ඇති නිලධාරියාගෙන් වහාම අයකර ගත යුතුය. සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයේ 2022 ජුනි 01 වන දින සිදු කරන ලද භෞතික මුදල් සත්‍යාපනයේදී රු.126,092 ක මුදල් ඌණතාවය අයකර ගැනීමට මේ දක්වා පියවරගෙන නොතිබුණි.
(ඈ)	2012 ජුලි 24 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා තීරණ	සංස්ථාවට නීත්‍යානුකූල අයිතිය නොමැති ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය ස්ථිර කරා ගැනීමට කටයුතු කරන ලෙස පොදු ව්‍යාපාර කාරක සභාව විසින් දැනුම් දී තිබුණද, 2012 ජුලි 24 දිනට පෙර සහ 2012 ජුලි 24 දිනට පසු සංස්ථාව භුක්ති විඳින ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් ලබාදී ඇති ඉඩම් අක්කර 11,363 ක නීත්‍යානුකූල අයිතිය සංස්ථාවට පවරා ගැනීමට අදාළ කටයුතු 2022 දෙසැම්බර් 31 දින දක්වා නිම කර නොතිබුණි.
(ඉ)	භාණ්ඩාගාර ලේකම්ගේ 2021 නොවැම්බර් 16 දිනැති අංක PED/01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ චක්‍රලේඛයේ, රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය සඳහා නිකුත්කරන ලද අත්පොතෙහි 66 ඡේදය	මූල්‍ය වර්ෂය අවසාන වී දින 60 ක් තුළදී කෙටුම්පත් වාර්ෂික වාර්තාව සහ ගිණුම්, විගණකාධිපතිට ද පිටපත් සහිතව රේඛීය අමාත්‍යාංශයට සහ භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතු වුවත් සංස්ථාවේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 න් අවසන් වර්ෂයේ ගිණුම් විගණකාධිපතිට ඉදිරිපත් කරන ලද්දේ 2023 සැප්තැම්බර් 12 දිනදීය.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) කොන්ඩව්වි වතුයාය ප්‍රතිසංස්කරණය යටතේ අලි වැට ඉදිකිරීම, ට්‍රැක්ටර් හා ජල බවුසර් මිලදී ගැනීම හා ගොඩනැගිලි ඉදිකිරීම යන ප්‍රධාන කාර්යයන් සඳහා උක්, බඩඉරිහු, කජු, ගම්මිරිස්,කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයෙන් ලද රු.225,000,000 ක මුදලින් 2022 දෙසැම්බර් 31 දින වන විට සංස්ථාව ලෙලි කජු මිලදී ගැනීම සඳහා රු.9,000,000 ක් භාවිතා කර නිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) සංස්ථාව පිහිටුවීම සඳහා නිකුත් කරන ලද අංක 60/07 හා 1973 මැයි 25 දිනැති ගැසට් නිවේදනයේ පළමු උපලේඛනයේ (අ), (ඇ), (ඈ) (ඊ) සහ (උ) වගන්තිවල සඳහන් කරුණු ඉටුකර ගැනීම කෙරෙහි 2013 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ ඉතා අඩු අවධානයක් යොමුවී තිබූ අතර එනම් අමාත්‍යවරයාට උපදෙස් ලබා දීම, කෘෂි නිෂ්පාදන පිරිසැකසුම් කිරීම, අලෙවිය හා අපනයනය දියුණු කිරීම, ප්‍රසිද්ධ කිරීම හා බෙදා හැරීම සම්බන්ධයෙන් බාහිර පාර්ශවයන් සමඟ එක්ව කටයුතු කිරීම සහ විමර්ශන හා පර්යේෂණ කටයුතු ඉටු කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ලෙලි කෘෂි, කෘෂි මද හා කෘෂි පැළ ඒකක පිරිවැය ගණනයේදී නිවැරදි පිළිගත් ක්‍රමවේදයක් ස්ථාපිත කර නොතිබීම හේතුවෙන් ගිණුම් වාර්තාවල දක්වා තිබෙන රු. 72,093,677 ක් වූ අවසන් තොග වටිනාකම නිවැරදිතාවය පරීක්ෂා කළ නොහැකි විය.

(ඇ) පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව විසින් රු. 14,471,411 ක ලාභයක් ලැබී තිබුණි. ඒ සඳහා සමාලෝචිත වර්ෂය තුළදී පුනරාවර්තන ප්‍රදාන රු.12,700,000කින් හා ආදායම ලෙස හඳුනාගත් මූලධන ප්‍රදාන රු.11,085,762 ක ප්‍රමාණයකින් වැඩිවීම, මන්නාරම දිස්ත්‍රික්කයේ කොන්ඩවිවි වතුයායේ අතුරුබෝග වගාව තුළින් වර්ෂය තුළ රු.6,437,392 ක ආදායමක් ලැබීම හේතුවී ඇතත් වර්ෂය තුල කෘෂි නිෂ්පාදන විකුණුම් ආදායම පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 3.1 කින් අඩුවී තිබුණු බව නිරීක්ෂණය විය. ආසන්නතම වර්ෂ 05 තුළ එනම් 2018 සිට 2022 දක්වා කාලපරිවිඡේදයේදී රජයේ ප්‍රදාන නොසලකා පසුගිය වර්ෂ 05 තුළ සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවල දෘෂ්‍ය අලාභය රු. මිලියන 134.8 සිට රු.මිලියන 102.3 දක්වා පරාසයක් වී තිබුණි. මේ අනුව අබණ්ඩව අලාභ ලැබීම ,කාර්යමණ්ඩල පුරප්පාඩු හා පවත්නා කෘෂි වතු උපරිම ලෙස වගා නොකිරීම නිසා නිෂ්පාදනය අඩුවීම වැනි හේතු මත සංස්ථාවේ අබණ්ඩ පැවැත්ම අභියෝගාත්මක වී ඇති බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

වර්ෂය	ලාභය / (අලාභය)	රජයේ ප්‍රදාන (පුනරාවර්තන)	රජයේ ප්‍රදාන (මූලධන)	ආදායම් ලෙස හඳුනාගත් රජයේ ප්‍රදාන (මූලධන)	රජයේ ප්‍රදාන හැර අලාභය
	රු.	රු.	රු.	රු.	රු.
	1	2	3	4	1-2-4
2018	(39,642,728)	50,000,000	66,520,000	35,263,122	(124,905,850)
2019	(30,185,251)	60,000,000	70,000,000	44,615,174	(134,800,425)
2020	(10,885,647)	60,000,000	84,650,000	31,426,876	(102,312,533)
2021	(16,412,185)	64,800,000	64,000,000	31,701,078	(112,913,263)
2022	14,471,411	77,500,000	29,000,000	42,786,840	(105,815,429)

(ඉ) සංස්ථාව සතුව බැංකු ජංගම ගිණුම් 06 ක් හා ඉතිරිකිරීමේ බැංකු ගිණුම් 05 ක් පැවති අතර ඉන් ජංගම ගිණුම් 02 ක් හා ඉතිරිකිරීමේ ගිණුම් 03 ක් දීර්ඝ කාලයක සිට ක්‍රියාත්මක වී නොමැති අතර ඒවායේ එකතුව පිළිවෙලින් රු. 23,343 ක් හා රු.306,966 ක් විය. එම අක්‍රිය ගිණුම් 05 වසා දැමීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ඊ) නිලධාරීන්ගේ හා සේවකයින්ගේ ඍත්තිය සමිති හා සුභසාධක සංගම්වල දායක මුදල ලෙස වැටුපෙන් අඩු කළ රු.1,807,121 ක වාරික මුදල් 2022 දෙසැම්බර් 31 දින වන විටත් එම සංගම්වලට බැර නොකර සංස්ථාවේ ගිණුමේ රඳවාගෙන තිබුණි.

(උ) සංස්ථා සේවකයින් වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන රක්ෂණාවරණය මඟින් සේවකයින්ට ගෙවිය යුතු සේවකයින්ගේ වෛද්‍ය බිල් ප්‍රතිපූර්ණයට වර්ෂ 02 කට පෙර ගෙවීමට නියමිතව තිබුණු රු.1,300,431 ක් හා වර්ෂයකට පෙර ගෙවීම සඳහා නියමිතව තිබුණු රු.2,653,907 ක් ලෙස එකතුව රු.3,954,338 ක් අදාළ ප්‍රතිලාභීන්ට නොගෙවා ගෙවිය යුතු ණයහිමි ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඌ) එවකට පැවති සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය මැදිහත්වීමෙන් ලෙලි කපු මිලදී ගැනීම සඳහා 2005 වර්ෂයේදී ආපසු ගෙවීමේ පදනම මත වී අලෙවි මණ්ඩලයෙන් ලබාගත් රු.3,500,000 ක් හා ඊට අදාළ පොලිය වන රු. 927,500 ක මුදල සමාලෝචිත වර්ෂය දක්වා ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(එ) සංස්ථාව සතුව/භාරයේ පවතින වතු 13 ක ඉඩම්වල ප්‍රමාණය අක්කර 11,363 ක් වූ අතර ඉන් අක්කර 3,449 ක කපු වගා කර තිබූ අතර, කපු වගා නොකල ඉඩම්වල ප්‍රතිශතය සියයට 70 ක් වී තිබුණි. එම හිස් ඉඩම් වගාකිරීම සඳහා සංස්ථාව විසින් ඵලදායී පියවර ගෙන නොතිබුණි.

(ඒ) සංස්ථාව කපු වගාකල ඉඩම් අක්කර 3,449 ක බද්ධ කපු පැල අක්කරයකට 70 ක් හා බීජ කපු පැල අක්කරයකට 40 බැගින් වගා කිරීමෙන් 2022 වර්ෂයේදී කපු ඵලදාව මෙට්‍රික් ටොන් 88.24 ක් වූයෙන් අක්කරයක අස්වැන්න කපු කි.ග්‍රෑම් 25.38 ක අඩු අගයක් ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වනවිට එම වතුවල ඵල දරන කපු ගස් ප්‍රමාණය 51,685 ක් ලෙස දක්වා තිබූ අතර ඒ අනුව එක් කපු ගසක සාමාන්‍ය අස්වැන්න කිලෝග්‍රෑම් 1.71 ක් වැනි දුර්වල තත්ත්වයක පැවතුණි.

(ඔ) සංස්ථාව සතු පුත්තලම කමන්දළුව හා අම්පාර හාඩි වතුවල පොල්ගස් සංඛ්‍යාව පිළිවෙලින් 3,358 ක් හා 826 ක් වූ අතර, නොමේරූ 1,147 , ඵලදා ලබන 2,391 ක් හා කනාටු 646 ක් ලෙස සමන්විත වී තිබුණි. 2022 වර්ෂයේ පොල් ඵලදාව ගෙඩි 90,304 ක් වූ අතර එහි විකුණුම් ආදායම රු. 4,427,439 ක් වී තිබුණි. ඒ අනුව ගසක වාර්ෂික පොල් ඵලදාව ගෙඩි 38 ක් වූ අතර විකුණුම් ආදායම රු. 1,863 ක් දක්වා අඩු වීමට පොල් ගස් නඩත්තු කිරීම, පොහොර යෙදීම දුර්වල මට්ටමක පැවතිණි.

2022 වර්ෂයේ සංස්ථාවේ ලෙලි කපු නිෂ්පාදනය මෙ.ටොන් 88.24 ක් වී තිබුණි. කිලෝ ග්‍රෑමයක් සඳහා ලෙලි කපු ගෙඩි 125 ක් පමණ අවශ්‍ය වේ. ඒ අනුව වාර්ෂිකව කපු පුහුලන් 11.030.000 ක් පමණ හටගනු අතර ඒවායේ බර දළ වශයෙන් කි.ග්‍රෑම් 1.103.000 ක් වේ. එසේම කපු නිෂ්පාදනයෙන් පසු
පමණ කපු ලෙලි ලෙස දළ වශයෙන් මෙ.ටොන් 59.4
ලෙස ඉවත් කරනු ලබන කපු පුහුලන් හා කපු ලෙලි ඵලදා අඟුල නිෂ්පාදනය සංවර්ධනය කිරීමට හෝ එම නිෂ්පාදන කර්මාන්තයේ කර්මාන්තකරුවන් සොයා ඒවා අලෙවි කිරීමේ හැකියාව සොයාබලා නොතිබුණි.

(ක) සංස්ථාව සතු මෝටර් රථ 3 ක්,ලොරි රථ 2 ක්,ට්‍රැක්ටර් රථයක් හා මෝටර් සයිකල් 2 ක් 2023 නොවැම්බර් 30 දින වන විටත් අලුත් වැඩියා නොකර ගරාජවල ගාල් කර තිබුණි.

(ග) පුත්තලම පිරිසැකසුම් මධ්‍යස්ථානයේ භෞතික තත්වය පරීක්ෂාවේදී රු. මිලියන 7.092 ක් වැය කර කෂ්ප ස්වයංක්‍රීයව පිරිසැකසුම් කිරීම සඳහා 2021 වර්ෂයේ මිලදීගත් යන්ත්‍රය නිශ්කාර්ය වී තිබුණි.

(ච) නැදගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානයේ පවතින විදුලිජනක යන්ත්‍රය (Generator),බොයිලේරුව (Boiler),කෂ්ප ලෙලිවලින් තෙල් නිපදවන යන්ත්‍රය හා පුත්තලම පිරිසැකසුම් මධ්‍යස්ථානයේ පවතින බොයිලේරුව (Boiler) අක්‍රිය වී තිබුණු අතර ඒවා අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඡ) නැදගමුව කෂ්ප පිරිසැකසුම් මධ්‍යස්ථානයේ කෂ්ප පිරිසැකසුම් බොයිලේරුව 2015 වසරේ සිට ක්‍රියාවිරහිත වී කෂ්ප තැම්බීමේ ක්‍රියාවලිය නතරවීම හේතුවෙන් ලෙලි කෂ්ප තැම්බීමකට (boil) ලක්කර සියයට 90 ත් 95 ත් අතර ප්‍රමාණයෙන් ලබා ගත හැකිව තිබුණු නිෂ්පාදන ඵලදායිතාවය සියයට 70ත් 80ත් අතර ප්‍රමාණයක් දක්වා පහත වැටී තිබුණි. ඒ හේතුවෙන් කෂ්ප මද විකිණීමෙන් ලබාගත හැකිව තිබුණු ආදායම් සියයට 15ත් 20 ත් අතර ප්‍රමාණයකින් අහිමි වී තිබුණි.

(ට) නැදගමුව කෂ්ප පිරිසැකසුම් මධ්‍යස්ථානයේ ශ්‍රේණිගත කිරීම් හා ඇසුරුම් කිරීමේ අංශයට 2021 වර්ෂයේ රු.8,100,000 ක් වැයකර විනාඩියකට පැකට් 60 ක් ඇසුරුම් කළ හැකි ස්වයංක්‍රිය ඇසුරුම් කිරීමේ යන්ත්‍රයක් මිලදීගෙන තිබුණි. 2022 වර්ෂය තුල ඇසුරුම් කරන ලද පැකට් ගණන 62,265ක් වී තිබුණු අතර මෙම යන්ත්‍රයෙන් උපරිම ධාරිතාවය ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඩ) නැදගමුව කෂ්ප පිරිසැකසුම් මධ්‍යස්ථානයේ ලෙලි කෂ්ප ගබඩාව වර්ෂ ගණනාවකින් අලුත්වැඩියා කර නොතිබුණු අතර ගබඩාවේ ලෙලි කෂ්ප ගබඩා කිරීමේදී, ලෙලි කෂ්ප වලට වාතාශ්‍රය ලැබෙන පරිදි ලණු ගෝනි හෝ දැල් ගෝනි භාවිතා නොකර පොලිසැක්ස් වර්ගයේ ඇසුරුම් භාවිතා කිරීම හේතුවෙන් හොඳ තත්ත්වයේ පවතින ලෙලි කෂ්ප නරක් වීම සිදුවී තිබුණි.

(ත) උක්, බඩඉරිහු, කෂ්ප, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැට්, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් මන්නාරම, කොන්ඩච්චි වතුයාය ප්‍රතිස්ථාපන ව්‍යාපෘතිය සඳහා අවස්ථා තුනකදී එකතුව රු.225,000,000 ක් ලබාදී 2021දෙසැම්බර් 31වන විට එම ව්‍යාපෘතිය අවසන් කිරීමට යෝජිතව තිබුණද 2022දෙසැම්බර් 31 වන විට රු.78,761,352 ක් වියදම් කර ශේෂය වූ රු.137,236,648 ක් නිෂ්කාර්ය ලෙස පැවතිණි.

මන්නාරම කොන්ඩච්චි වතු ව්‍යාපෘතිය සඳහා විදුලි බලය ලබා ගැනීමට 2022 වර්ෂය අවසන් වන විට රු. 28,209,434 ක් විදුලි බල මණ්ඩලයට ගෙවා ඇතත් 2022 දෙසැම්බර් 31 දින වන විට විදුලිය ලබා ගැනීමේ කටයුතු හා ඊට අදාළව ගොඩනැගිලි විදුලි පද්ධති සකස් කිරීමේ කටයුතු/වයරින් කිරීමේ කටයුතු සිදු කර නොතිබුණි.

ස්ථාන භාර නිලධාරීන් සඳහා නිල නිවාස ඉදිකිරීමට උක්, බඩඉරිහු, කෂ්ප, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැට්, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් රු.15,653,000 ක

මුදලක් වෙන් කර නිල නිවාස 07 ක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණි. 2022 දෙසැම්බර් 31 දින වන විට මෙම නිල නිවාස භාවිතයට ගත හැකි ලෙස සම්පූර්ණයෙන් ඉදි කර අවසන්කොට නොතිබුණි.

(ඵ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට කපු වගා කර තිබෙන බිම් ප්‍රමාණය දල වශයෙන් අක්කර 3,449 ක් වී තිබුණි. එම ගස් වල ලියා හළ ශුද්ධ අගය රු. 24,159,359 ක් ලෙස මූල්‍ය ප්‍රකාශවල දක්වා තිබුණ ද එම කපු ගස් සංගණනයක් සිදුකිරීම, ගස් අංකනය කිරීම හා ගස් පිළිබඳ රෙජිස්ටරයක් පිළියෙළ කිරීම සිදුකර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

12. විගණකාධිපති වාර්තාවේ සඳහන් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග

<u>ශ්‍රී ලංකා කපුු සංස්ථාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාරව නිකුත්කර ඇති විගණකාධිපති වාර්තාවේ අන්තර්ගත කරුණු සම්බන්ධයෙන් සංස්ථා පාර්ශවයෙන් අදහස් දැක්වීම්.</u>

1.2 (අ) එකඟ වෙමි.

අදාල පාර්ශවයන්ගෙන් අවශ්‍ය උපදෙස් ලබා ගනිමින් මෙම විලම්බිත බදු නිවැරදිව ගණනය කර ඒ හා සම්බන්ධ ගැලපීම් ඉදිරි වර්ෂයේ මුල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ.

1.2 (ආ) එකඟ වෙමි.

මෙම විගණන නිරීක්ෂණයෙහි සඳහන් සම්පූර්ණයෙන් ක්ෂය වූ නැතහොත් ධාරණ අගය ශූන්‍යව පවතින ස්පෘශ්‍ය ජංගම නොවන වත්කම් (දේපළ, පිරියත හා උපකරණ) ඇතුළුව සංස්ථාවේ සියලුම ස්පෘශ්‍ය ජංගම නොවන වත්කම්වල අගය නැවත තක්සේරු කිරීමේ කටයුතු ආරම්භ කිරීම සඳහා, මූලික වශයෙන් සංස්ථාවේ මෝටර් වාහනවල අගය නැවත තක්සේරු කිරීමට තීරණය කරන ලදුව ලැබී ඇති අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට අනුව එහි ආරම්භක පියවර වශයෙන් යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකුගේ හා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකුගේ නියෝජනයක් ද සහිතව විධිමත් පරිදි පත් කරන ලද කමිටුවක් මඟින් 2024.02.20 වන දින මෙම සංස්ථාවේ ප්‍රධාන කාර්යාල සංචිතයේ පවතින සියලු මෝටර් වාහනවල ප්‍රත්‍යාගණන කටයුතු අවසන් කර ඇත. ඉතිරි මෝටර් වාහනවල ප්‍රත්‍යාගණන කටයුතු ද 2024.06.30 දිනට හෝ ඊට පෙර නිම කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරගෙන යනු ලැබේ.

එසේම මෝටර් වාහන හැර අනෙකුත් ස්පෘශ්‍ය ජංගම නොවන වත්කම් සම්බන්ධයෙන් විධිමත් පරිදි සමීක්ෂණයක් සිදුකොට අදාල තොරතුරු එක්රැස් කර ගනිමින් එම වත්කම්වල ද අගය නැවත තක්සේරු කිරීමේ කටයුතු සම්පූර්ණ කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ.

1.2 (ඇ) එකඟ වෙමි.

ඉහත අංක 1.2 (ආ) යටතේ සඳහන් කළ පරිදි සංස්ථාවේ වත්කම් ප්‍රත්‍යාගණන කටයුතු නිම කළ වහාම මෙහි සඳහන් සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද දේපළ, පිරියත හා

උපකරණවල දළ ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල අදාල පරිදි දැක්වීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ.

1.2 (ඈ) එකඟ වෙමි.

මෙම විගණන නිරීක්ෂණයේ දැක්වෙන පරිදි මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන විශ්‍රාම පාරිතෝෂික වෙන්කිරීම් ශේෂයට අනුරූපිව මාසිකව රු. 100,000/- ක් බැගින් වන සේ ආයෝජනයක් සිදුකිරීම සඳහා සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලීය අනුමැතිය ලබාගත් අතර, ඒ සඳහා මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගැනීම සඳහා ලිපියක් යොමු කරන ලදුව, එම දෙපාර්තමේන්තුව විසින් අදාල ලිපිය විෂයභාර ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය ද සමඟ නැවත ඉදිරිපත් කරන ලෙසට උපදෙස් ලබාදෙන ලදී. ඒ අනුව විෂයභාර අමාත්‍යතුමාගේ අනුමැතිය ද සහිතව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද ලිපියේ අන්තර්ගත කරුණු සඳහා මේවනවිට අදාල අනුමැතිය ලැබී ඇති අතර, ඒ අනුව අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරගෙන යනු ලැබේ.

1.2 (ඉ) එකඟ නොවෙමි.

මෙහි සඳහන් දේපළ, පිරියත හා උපකරණ ක්ෂයවීම්වලට අදාල නිවැරදි කිරීම, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීමක් සේ සලකා ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීම් සිදුකර ඇත. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ ලාභය රු. 646,579/= කින් වැඩිවී ඇති බවට සිදුකර ඇති කරුණු දැක්වීම පිළිගත නොහැකිය.

1.2.(ඊ) එකඟ වෙමි.

මෙම විගණන නිරීක්ෂණයෙහි සඳහන් පරිදි නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම සඳහා වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කළයුතු තොරතුරු 2023 වර්ෂයේ සිට අදාල ගිණුම්කරණ ප්‍රමිතියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ.

1.2. (උ) පහත අදහස් දක්වමි.

මෙහි දැක්වෙන සහන කාලසීමාව ඉක්මවූ රු. 2,994,271/= ක වෙළෙඳ ණයගැති ශේෂවලින් 2023.12.31 දින වනවිට රු. . 1,296,771/= ක මුදලක් අයකරවා ගැනීමට කටයුතු කර ඇත.

එසේම මෙම විගණන නිරීක්ෂණයේ දැක්වෙන පරිදි ඉහත වෙළෙඳ ණයගැති ශේෂයෙහි ඇතුළත්ව ඇති රු. 1,499,410/= ක ණයගැති ශේෂය (ලිසල එන්ටප්‍රයිසස් ආයතනය) අයකරවා ගැනීමට දීර්ඝ කාලයක් පුරා ගත් උත්සාහය ව්‍යර්ථ වී ඇති බැවින් නීතිමය ක්‍රියාමාර්ග ගෙන එම ණයගැති ශේෂය අයකරවා ගැනීමට සඳහා අවශ්‍ය උපදෙස් ලබා ගැනීමට අදාල ණය ගනුදෙනු තොරතුරු ඇතුළත් ගොනුව විෂයභාර අමාත්‍යාංශයේ නීති නිලධාරී වෙත යොමු කරන ලදී. මේ අනුව ලද උපදෙස් පරිදි මෙම ණයගැති ආයතනයට එරෙහිව අදාල නීතිමය ක්‍රියාමාර්ගවලට ප්‍රවේශවීම සඳහා අවශ්‍ය අනුමැතීන් ලබා ගනිමින් ඉදිරි කටයුතු සිදුකරනු ලැබේ.

1.2 (ඌ) පහත අදහස් දක්වමි.

මෙහි සඳහන් රු. 9,466,200/- ක ණය වටිනාකම, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් අයකරවා ගැනීමට දැඩි උත්සාහයක් දැරූ නමුත් එය ව්‍යර්ථ විය. මෙම ණය වටිනාකම සම්බන්ධයෙන් 2023.06.15 වන දින පැවති සංස්ථාවේ විගණන කමිටු රැස්වීමේදී දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන ලදී.

එහිදී දැනට ක්‍රියාත්මක නොවන රජයේ අමාත්‍යාංශයකින් ලැබිය යුතුව පවතින මෙම ණය මුදල සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුකළ යුතු ආකාරය පිළිබඳව උපදෙස් ලබා ගැනීම සඳහා මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ලිපියක් යැවීමට එහිදී නිර්දේශ වූ අතර, මේ සම්බන්ධයෙන් සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කර අදාල ලිපිය යැවීමට කටයුතු කරන ලදී.

ඉහත සඳහන් ලිපිය සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් ලැබුනු ප්‍රතිචාර ලිපිය අවශ්‍ය උපදෙස් ලබා ගැනීම වෙනුවෙන් 2023.12.22 වන දින පැවති සංස්ථාවේ විගණන කමිටුව වෙත ඉදිරිපත් කළ අතර, ඒ අනුව මෙම ණය මුදල අයකරවා ගැනීමේ කටයුතු සඳහා තවදුරටත් උපදෙස් ඉල්ලුම් කිරීමට, මෙවැනි දැනට ක්‍රියාත්මක නොවන රජයේ අමාත්‍යාංශවල වත්කම් පැවරීම සිදුකර ඇති රජයේ අමාත්‍යාංශය වන මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය වෙත ලිපියක් යැවීමට තීරණය කරන ලදුව එම ලිපිය අදාල අමාත්‍යාංශය වෙත යැවීමට කටයුතු කර ඇත. එම ලිපිය සඳහා ලැබෙන ප්‍රතිචාරවලට අනුව අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරනු ලැබේ.

1.2 (එ) පහත අදහස් දක්වමි.

දැනට සංස්ථාව වෙත අයවීමට පවතින එහෙත් හානිකරන අලාභ වෙන්කිරීමක් සිදුකර නොමැති ද්‍රව්‍යාත්මක ණයගැති ශේෂ සම්බන්ධයෙන් ද අවධානය යොමු කර වර්තමාන හානිකරන අලාභ වෙන්කිරීම් සම්බන්ධයෙන් අවශ්‍ය සංශෝධන සිදුකිරීමට කටයුතු

කරනු ලබන අතර, එම ගැලපීම් 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට අදාල පරිදි ගිණුම් ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ.

එසේම මෙම විගණන නිරීක්ෂණයේ තවදුරටත් ඇතුළත් රු. 102,830/= ක අගයක් සහිත දීර්ඝ කාලයක් තිස්සේ අයකරවා ගැනීමට නොහැකිව පවතින ණයගැති ශේෂයන් ගිණුම් පොත්වලින් කපා හැරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල නිර්දේශය යටතේ අනුමැතිය ඉල්ලුම් කරමින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත මීට සැලකිය යුතු කාලයකට පෙර ලිපියක් යවා ඇති නමුත් ඒ සඳහා අවසර ලැබී නොමැත.

1.2 (ඒ) පහත අදහස් දක්වමි.

මෙහි සඳහන් එළුවන්කුලම වතුයායේ පවතින තේක්ක ගස් තක්සේරු කිරීමේ කටයුතු මේවනවිට අවසන් කර ඇති අතර, එම තක්සේරුවේ නිරවද්‍යභාවය තහවුරු කර ගැනීම සඳහා අදාල තක්සේරු වාර්තාව රාජ්‍ය දැව සංස්ථාව වෙත යොමු කර ඇත. කෙසේ නමුත්, එළුවන්කුලම වතුයායේ නීතිමය අයිතිය සංස්ථාව වෙත පවරා ගැනීමේ කටයුතු මෙතෙක් අවසන් වී නොමැති හෙයින් එම තේක්ක ගස්වල තක්සේරු වටිනාකම සංස්ථාවේ ගිණුම් පොත්වලට ඇතුළත් කිරීමේ හැකියාවක් නොමැත. අදාල වතුයායේ නීතිමය අයිතිය පවරා ගැනීමේ කටයුතු මේවනවිට බොහෝදුරට සම්පූර්ණ කර ඇති බැවින් ඉදිරි කෙටි කාලසීමාවක් ඇතුළත අදාල ගැලපීම් ගිණුම් පොත්වලට ඇතුළත් කිරීමට කටයුතු හැකිය.

2.2.2 (අ) පහත අදහස් දක්වමි.

මේවන විට අදාල ආදායම් බදු වාර්තා පිළියෙල කිරීමේ කටයුතු සම්පූර්ණ කරගෙන යනු ලබන අතර, වර්ෂ සැලකිය යුතු ගණනක ආදායම් බදු වාර්තා ද පිළියෙල කිරීමට පවතින බැවින් ඒ සඳහා සැලකිය යුතු කාලසීමාවක් ගතවේ. ඒ අනුව හැකි ඉක්මණින් අදාල කටයුතු සම්පූර්ණ කර එම වාර්තා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත යැවීමට කටයුතු කරනු ලැබේ.

2.2.2 (ආ) පහත අදහස් දක්වමි.

පැවති මුදල් ප්‍රතිපාදන උපයෝගී කර ගනිමින් මේවනවිට මෙහි සඳහන්ව පවතින රු. 930,000/= ක ගෙවිය යුතු විගණන ගාස්තුවලින් රු. 465,000/= ක් ජාතික විගණන කාර්යාලය වෙත ගෙවා ඇති අතර, ඉතිරි රු. 465,000/= ක මුදල ද හැකි ඉක්මණින් ගෙවීමට කටයුතු කරනු ලැබේ.

2.2.2 (ඇ) පහත අදහස් දක්වමි.

මෙහි සඳහන් 126,092/= ක මුදල් ඌණතාවයට එවකට සංස්ථා මුදල් භාරකරු විසින් වගකිවයුතු බවට ආයතනික අභ්‍යන්තර පරීක්ෂණයට අනුව සංස්ථා පාලනාධිකාරිය වෙත නිර්දේශ ඉදිරිපත් කර ඇතත්, මීට පෙර ද විගණනය වෙත ලිඛිතව දැනුවත් කර ඇති පරිදි අදාල මුදල් භාරකරු ඉහත කී ආයතනික පරීක්ෂණයේ ප්‍රතිඵල අභියෝගයට ලක්වන ආකාරයෙන් එවකට විෂයභාර රාජ්‍ය අමාත්‍යාංශය වෙත කරුණු ඉදිරිපත් කිරීමක් සිදුකර ඇති බැවින් මේ සම්බන්ධව අමාත්‍යාංශ පරීක්ෂණයක් සිදුකර ඇත. සිහි කැඳවීමකින් පසුවත් එම අමාත්‍යාංශ පරීක්ෂණයේ ප්‍රතිඵල මෙතෙක් මෙම සංස්ථාව වෙත වාර්තා කර නොමැති හෙයින් විෂයගත කරුණට අදාල ඉදිරි පියවර ගැනීමට නොහැකි වී ඇත.

මෙම තත්ත්වය යටතේ සංස්ථාවේ අභ්‍යන්තර පරීක්ෂණයේ ප්‍රතිඵල සැලකිල්ලට ගනිමින් ඉදිරි කටයුතු සිදුකිරීමට විෂයභාර රාජ්‍ය අමාත්‍යාංශයේ පරීක්ෂණයේ ප්‍රතිඵල බාධාවක් කර නොගත යුතු බවට ද , අදාල අභ්‍යන්තර පරීක්ෂණයේ ප්‍රතිඵලවලට අනුව මූලික විමර්ශනයක් පවත්වා කඩිනමින් අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීම සුදුසු වන බවට ද අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ කිරීමට කටයුතු කිරීම සුදුසු වන බවට 2023.12.22 වන දින පැවති රැස්වීමේදී සංස්ථා විගණන කමිටුව විසින් තීරණය කරන ලදී.

ඉහත සඳහන් විගණන කමිටු නිර්දේශය අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන ලද අතර. විෂයගත කරුණ සම්බන්ධයෙන් නැවත සිහිකැඳවීමක් යැවීමට එහිදී තීරණය වූ අතර, ඒ අනුව අදාල සිහිකැඳවීම් ලිපිය යැවීමට කටයුතු කර ඇත. ඒ සම්බන්ධයෙන් අදාල උපදෙස් ලද වහාම අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරනු ලැබේ.

2.2.2 (ඇ) පහත අදහස් දක්වමි.

2012 ජුලි මස 24 වන දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා තීරණය ලැබෙන අවස්ථාව වනවිට සංස්ථාව වෙත නීතිමය අයිතිය පවරාගෙන නොතිබූ වතුයායන්/ බීජ උද්‍යානයන් හි ඉඩම්වල මුළු අක්කර ප්‍රමාණය 2370 කි. එහි විශ්ලේෂණය පහත පරිදි වේ.

වතුයාය / බීජ උද්‍යානය	අයිතිය	දිස්ත්‍රික්කය	ප්‍රා.ලේ. කොට්ඨාශය	අක්කර ප්‍රමාණය
1. එළුවන්කුලම - අදියර I	රජය සතු	පුත්තලම	වනාතවිල්ලුව	210
2. ආච්චිගේවත්ත	ඉඩම් ප්‍රතිසංස්කරණ කොා.සෙ.	පුත්තලම	වනාතවිල්ලුව	961

වතුයාය / බීජ උද්‍යානය	අයිතිය	දිස්ත්‍රික්කය	ප්‍රා.ලේ. කොට්ඨාශය	අක්කර ප්‍රමාණය
3. කමන්දළුව	ඉඩම් ප්‍රතිසංස්කරණ කොා.ස.	පුත්තලම	රස්නායකපුර	548
4. හාඩි	ඉඩම් ප්‍රතිසංස්කරණ කොා.ස.	මඩකලපුව	වාලච්චේන	365
5. විලච්චිය	වන සංරක්ෂණ දෙපා.	අනුරාධපුර	මහවිලච්චිය	25
6. සුදුවතුර-ආර	වන සංරක්ෂණ දෙපා.	මොණරාගල	මොණරාගල	45
7. මහඔය	වන සංරක්ෂණ දෙපා.	අම්පාර	මහඔය	81
8.නාලන්ද (සටහන)	ඇල්කඩුව වැවිලි සමාගම	මාතලේ	මාතලේ	135
එකතුව (අක්කර)				**2,370**

සටහන :

ඉහත සඳහන් නාලන්ද බීජ උද්‍යානය පිහිටි ඉඩම විධිමත් පරිදි ගනු ලැබූ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත මේවනවිට නැවත ඇල්කඩුව වැවිලි සමාගම වෙත පවරා ඇති හෙයින් අදාල පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා තීරණය ලැබෙන අවස්ථාව වනවිට සංස්ථාව වෙත නීතිමය අයිතිය පවරාගෙන නොතිබූ හා සංස්ථාව මඟින් දැනට වගා කටයුතු සිදුකරනු ලබන ඉඩම්වල මුළු අක්කර ගණන 2,235 කි. (2370 – 135)

එසේම අදාල පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා තීරණය ගනු ලැබූ 2012 වර්ෂය වනවිට මෙම සංස්ථාවට අයත්ව නොතිබූ එහෙත්, පසුකාලීනව විවිධ පාර්ශව වෙතින් සංස්ථාව වෙත ලැබී ඇති නමුත් මෙතෙක් නීතිමය අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොමැති ඉඩම් අක්කර ප්‍රමාණය 8,988ක් වන අතර, එහි විශ්ලේෂණය පහත දැක්වේ. (ප්‍රවර්තන වර්ෂයේදී සිදුකළ තහවුරු කරවා ගැනීම්වලට අනුව)

වතුයාය / බීජ උද්‍යානය	අයිතිය	දිස්ත්‍රික්කය	ප්‍රා.ලේ. කොට්ඨාශය	ප්‍රමාණය අක්කර	සංස්ථාව වෙත ලැබී ඇති වර්ෂය
1. මාන්කර්නි	රජය සතු	මඩකලපුව	කෝරලේපත්තුව උතුර	1075	2013
2.කොණ්ඩච්චි	රජය සතු	මන්නාරම	මුසලි	6498	2014
3. තිරියාය	රජය සතු	ත්‍රිකුණාමලය	ගෝමරන්කඩවල	27	2017
4.එළුවන්කුලම අදියර II	රජය සතු	පුත්තලම	වනාතවිල්ලුව	409	2018

වතුයාය / බීජ උද්‍යානය	අයිතිය	දිස්ත්‍රික්කය	ප්‍රා.ලේ. කොට්ඨාශය	ප්‍රමාණය අක්කර	සංස්ථාව වෙත ලැබී ඇති වර්ෂය
5. පුනරින්	රජය සතු	කිළිනොච්චිය	පුනරින්	479	2019
6.වෙල්ලන්කුලම	රජය සතු	මන්නාරම	බටහිර මාන්තායි	500	2021
එකතුව (අක්කර)				**8988**	

මේ අනුව නීතිමය අයිතිය පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතු සමස්ත ඉඩම් අක්කර ගණන 11223 කි. (2235 + 8988)

ඉහත දැක්වෙන පුනරීන්, කොන්ඩච්චි, මාන්කර්නි හා වෙල්ලන්කුලම යන වතුයායන්වල ඉඩම් කොටස් 70 දශකයේදී පමණ ශ්‍රී ලංකා කජු සංස්ථාව සතුව පැවතිය ද වසර 30 ක උතුරු - නැගෙනහිර යුධමය වාතාවරණය හේතුකොටගෙන සංස්ථාවට අහිමිව ගොස් නැවත ඉහත සඳහන් වර්ෂවලදී සංස්ථාව වෙත හිමිවී ඇත.

ඉහත ඉඩම්වල නීතිමය අයිතිය දීර්ඝකාලීන බදු පදනම යටතේ මෙම සංස්ථාව වෙත පවරා ගැනීම සඳහා දැනට ගෙන ඇති ක්‍රියාමාර්ගවලට අනුව ඒ සඳහා බදු ලෙස ඉතා විශාල මුදලක් ගෙවීමට සිදුවන බවට කරුණු පැහැදිලි වී ඇති අතර, සංස්ථාවේ වර්තමාන මූල්‍ය තත්ත්වයට අනුව එම බදු මුදල් ගෙවීමේ හැකියාවක් මෙම සංස්ථාවට නොමැත. ඉහත සඳහන් ඉඩම්වලින් එක් ඉඩමක් වන එළුවන්කුලම අදියර I ඉඩමේ අයිතිය පවරා ගැනීම සඳහා බදු ලෙස රු. මිලියන 11කටත් වඩා වැඩි අගයක් රජයට ගෙවීම සිදුවී තිබීම ඒ සඳහා උදාහරණයක් ලෙස දැක්විය හැකිය.

මෙම තත්ත්වය යටතේ අදාල ඉඩම්වල අයිතිය දැනට සතුව පවතින ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ හා ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමඟ විෂයභාර අමාත්‍යාංශයේ මැදිහත්වීමෙන් පවත්වනු ලැබූ සාකච්ඡාවලට අනුව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව/ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා කජු සංස්ථාව හා බාහිර පුද්ගලික ආයතන යන පාර්ශවයන්ගේ නියෝජනය සහිත තෙපාර්ශවික ගිවිසුමක් යටතේ වගා කටයුතු සඳහා අතුරු බදුදීමේ පදනම මත ඉහත ඉඩම්වල දීර්ඝකාලීන බදු අයිතිය සංස්ථාව වෙත ලබා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම පිණිස සියලු තොරතුරු ඇතුළත් සංකල්ප පත්‍රිකාවක් මේ වනවිට විෂයභාර අමාත්‍යාංශය වෙත

ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇති අතර, ඒ අනුව හිමිවන අනුමැතීන් ප්‍රකාරව අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරනු ලැබේ.

2.2.2 (ඉ) එකඟ වෙමි.

විවිධ ප්‍රායෝගික හේතූන් මත පසුගිය වර්ෂවල මූල්‍ය ප්‍රකාශන අදාල රාජ්‍ය ආයතන වෙත ඉදිරිපත් කිරීමට ප්‍රමාද වුව ද මේ වනවිට එම සියලු ප්‍රමාදයන් මඟහරවාගෙන 2022 වර්ෂය තෙක් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ කටයුතු සම්පූර්ණ කර ඇති අතර, 2023 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට පිළියෙල කර අදාල රාජ්‍ය ආයතන වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ.

2.2.4 (අ) පහත අදහස් දක්වමි.

කොන්ඩච්චි වතුයායේ පවතින සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන කජු වගා කොටසෙන් ලැබෙන ලෙලි කජු අස්වනු, කැබිනට් මණ්ඩලයේ තීරණයකට අනුව මෙම සංස්ථාව වෙත මිලදී ගැනීමට බැදියාවක් පවතින බැවින් 2022 වර්ෂය තුළදී එම දෙපාර්තමේන්තුව විසින් ඉහත පරිදි එක්රැස් කොටගෙන තිබූ ලෙලි කජු අස්වනු මිලදී ගැනීම සඳහා මෙම රු. 9,000,000/= ක මුදල අදාල ප්‍රතිස්ථාපන ව්‍යාපෘති ප්‍රතිපාදනවලින් භාවිතා කර ඇති නමුත් මේ වනවිට එම මුදල් නැවත ප්‍රතිස්ථාපන ව්‍යාපෘතිය වෙත පියවීම සිදුකර ඇත.

2.3 (අ) පහත අදහස් දක්වමි.

<u>1972 අංක 11 දරණ රාජ්‍ය කෘෂිකර්ම සංස්ථා පනතේ විධිවිධාන යටතේ නිකුත් කර ඇති අංක 60/7 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනයේ පළමුවන උපලේඛනයේ (අ) ඡේදය.</u>

කජු වගා කිරීම, පිරිසැකසුම් කිරීම සහ අලෙවි කිරීම යන සියලු කාර්යයන් සම්බන්ධයෙන් ස්ථාපනය කර ඇති එකම රාජ්‍ය ආයතනය වශයෙන් අංක 60/7 හා 1973.05.25 දිනැති අති විශේෂ ගැසට්පත්‍රය ප්‍රකාරව එම කාර්යයන්ට අදාල ප්‍රතිපත්ති හා සැලසුම් සකස් කිරීම සම්බන්ධයෙන් විෂයභාර ගරු අමාත්‍යතුමා වෙත අදාල තොරතුරු හා උපදෙස් ලබාදීම ශ්‍රී ලංකා කජු සංස්ථාව මඟින් සිදුකළ යුතු වේ.

ගරු අමාත්‍යතුමා වෙත අදාල තොරතුරු හා උපදෙස් ලබාදීමේදී ආයතන ධුරාවලියේ ඉහළින්ම පවතින ආයතනය වන විෂයභාර අමාත්‍යාංශය (වර්තමානයේදී කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය) මඟින් අදාල තොරතුරු සංස්ථාව මඟින් ඉල්ලුම් කරනු ලබන අතර, සංස්ථාව මඟින් එම තොරතුරු ලබාදෙනු ලැබේ.

ඊට අමතරව පැන නඟිනු ලබන හදිසි, විශේෂ හා අනෙකුත් විෂයානුබද්ධ කරුණුවලදී විෂයභාර අමාත්‍යාංශය මඟින් පවත්වනු ලබන රැස්වීම්වලදී විෂය සම්බන්ධ නිලධාරීන් විසින් ඔවුන්ගේ අදහස්, අදාල තොරතුරු හා විශේෂඥ මත ඉදිරිපත් කරනු ලැබේ.

එසේම කෘෂි සංස්ථාව විසින් ස්වකීය සිද්ධි අධ්‍යයනයේදී හඳුනාගනු ලබන, රාජ්‍ය මැදිහත්වීම් අවශ්‍ය ගැටළු සහගත කරුණුවලදී සහ කෘෂි සංස්ථාව විසින් මැදිහත්විය යුතු එහි මූලික පරමාර්ථවලින් පරිබාහිර කරුණුවලදී ඒ පිළිබඳව ගරු අමාත්‍යතුමාගේ අවධානයට යොමු කිරීම සඳහා විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්තුමා වෙතින් ඉල්ලීමක් සිදුකර ලැබෙන අනුමැතියට අනුව අදාල කටයුතු සිදුකරනු ලැබේ.

<u>1972 අංක 11 දරණ රාජ්‍ය කෘෂිකර්ම සංස්ථා පනතේ විධිවිධාන යටතේ නිකුත් කර ඇති අංක 60/7 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනයේ පළමුවන උපලේඛනයේ (ඇ) ඡේදය.</u>

ශ්‍රී ලංකා කෘෂි සංස්ථාව මඟින් කෘෂි වගාව, කෘෂි වගාව ආශ්‍රිතව පැතිරෙන රෝග, පලිබෝධ නාශක, පොහොර හා කෘෂි වැවිලි ක්ෂේත්‍රයට අදාලව දැනට නිර්මාණය වී ඇති හා ඉදිරියේදී නිර්මාණය විය හැකි ගැටළු හා අභියෝගවලට මුහුණදීමට හා ඒවාට විසඳුම් සොයා ගැනීමට අවශ්‍ය පර්යේෂණ කටයුතු සිදුකරනු ලැබේ.

ඊට අමතරව කෘෂි පිරිසැකසුම් කටයුතු හා අලෙවි කටයුතුවලට අදාල සියලුම පර්යේෂණ මෙම සංස්ථාවේ තත්ත්ව සහතික කිරීමේ නිලධාරීගේ මැදිහත්වීමෙන් සංස්ථාවේ නැදගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානයේදී සිදුකරනු ලබන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස අගය එකතුකිරීමේ කෘෂි නිෂ්පාදන රාශියක් වෙළෙඳපොලට හඳුන්වාදීමට හැකිවී ඇත.
එසේම කෘෂි අලෙවිකරණය වැඩිදියුණු කිරීමේ පරමාර්ථයෙන් ලෝක වෙළෙඳපොලේ තත්ත්වයන් විමර්ශනය කරමින් කෘෂි සංස්ථාව සඳහා වෙළෙඳ සන්නාමයක්, (Trade mark) උද්‍යෝගී පාඨයක් (Slogan) සහ ජාත්‍යන්තර ප්‍රමිතීන් හා සැසඳෙන පරිදි ඇසුරුම් ආකෘති සකස් කිරීමක් සිදුකර ඇති අතර, වෙළෙඳ සන්නාමය හා උද්‍යෝගී පාඨය ලියාපදිංචි කිරීමේ කටයුතු සඳහා අදාල ලේඛන මේ වනවිටත් ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය වෙත යොමු කර ඇත.

<u>1972 අංක 11 දරණ රාජ්‍ය කෘෂිකර්ම සංස්ථා පනතේ විධිවිධාන යටතේ නිකුත් කර ඇති අංක 60/7 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනයේ පළමුවන උපලේඛනයේ (ඇ) ඡේදය.</u>

ශ්‍රී ලංකා කජු සංස්ථාවේ එක් එක් අංශය යටතේ ගැනෙන තොරතුරු විධිමත් ලෙස ඒකරාශී නොවීමේ ගැටළු හේතුවෙන් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවලින් වරින්වර සිදුකරන විමසීම් සඳහා සම්පූර්ණ තොරතුරු ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත. මෙම දුර්වලතාවය හඳුනාගෙන විෂයභාර අමාත්‍යාංශය වන වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය සමඟ එක්ව තොරතුරු ඒකරාශී කර ජාලගත කිරීමේ කටයුතු මේවනවිට ආරම්භ කර ඇත. මේ යටතේ අදාල දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, අපනයන සංවර්ධන මණ්ඩලය හා ශ්‍රී ලංකා ප්‍රමිත ආයතනය සමඟ ආයතනික මට්ටමින් කටයුතු කිරීම ආරම්භ කර ඇති අතර, එම ආයතන සමඟ තොරතුරු හුවමාරු කර ගනිමින් විෂයභාර අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන වැඩසටහනකට මෙම සංස්ථාව සම්බන්ධ වී ඇත.

<u>1972 අංක 11 දරණ රාජ්‍ය කෘෂිකර්ම සංස්ථා පනතේ විධිවිධාන යටතේ නිකුත් කර ඇති අංක 60/7 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනයේ පළමුවන උපලේඛනයේ (ඊ) ඡේදය.</u>

අන්තර්ජාතික වෙළෙඳපොලට පිවිසීම සඳහා ජාත්‍යන්තර පිරිවිතර හා ප්‍රමිත අවශ්‍යතා සපුරාලිය යුතු අතර, ශ්‍රී ලංකා කජු සංස්ථාව මේ වනවිට එයින් බහුතරයක් ක්‍රියාවට නැංවීමට අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇත. මීට පෙර ද සඳහන් කළ පරිදි වෙළෙඳ සන්නාමය හා උද්‍යෝගී පාඨය සහ ජාත්‍යන්තර ප්‍රමිතවලට සැසඳෙන ඇසුරුම් ආකෘති සංස්ථාව මඟින් සකස් කර ඇති අතර, පිරිසැකසුම්කරණය සඳහා වන ප්‍රමිත ලබා ගැනීමට සිදුකළයුතු පර්යේෂණ හා යටිතල පහසුකම් සකස් කිරීම සඳහා යෝජනා හා ව්‍යාපෘති වාර්තා විෂයභාර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එම කටයුතු සිදුකිරීම සඳහා විෂයභාර අමාත්‍යාංශයෙන් මූල්‍ය ප්‍රතිපාදන වෙන් කර ඇත. ඒ අනුව මේවනවිට මෙම සංස්ථාව මඟින් ඊට අදාල කටයුතු ආරම්භ කර ඇත.

<u>1972 අංක 11 දරණ රාජ්‍ය කෘෂිකර්ම සංස්ථා පනතේ විධිවිධාන යටතේ නිකුත් කර ඇති අංක 60/7 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනයේ පළමුවන උපලේඛනයේ (උ) ඡේදය.</u>

ශ්‍රී ලංකා කජු සංස්ථාව පිහිටුවීමේ එක් මූලික පරමාර්ථයක් වනුයේ කජු වගාව දිවයිනෙහි ව්‍යාප්ත කිරීමයි. ඒ සඳහා රජයේ කෘෂි සහනාධාර ප්‍රතිපත්තිය යටතේ විෂයභාර අමාත්‍යාංශය මඟින් ලබාදෙන ප්‍රතිපාදන මඟින් හා කජු වගා සහනාධාර වැඩසටහන හා කජු කෘෂි අපනයන ගම්මාන ව්‍යාපෘතිය තුළින් මෙම සංස්ථාවට අයත් පැළ තවාන්වල නියමිත ක්‍රියා පටිපාටීන් අනුගමනය කර නිෂ්පාදනය කරනු ලබන ඉහළ ගුණාත්මකභාවයෙන් යුතු බද්ධ හා බීජ කජු පැළ ලබාදීම මඟින් මෙන්ම යහපත්

කෘෂිකර්ම උපචාරයන් අනුගමනය කරමින් කජු පැළ සිටුවීම පිළිබඳ අවශ්‍ය තාක්ෂණික දැනුම ලබාදීමට අදාල ප්‍රතිලාභීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම මඟින් මෙම කජු වගා ව්‍යාප්ති කාර්යය සඳහා ශ්‍රී ලංකා කජු සංස්ථාව සක්‍රීය ලෙස දායක වේ. මීට අමතරව Dilma Conservation වැනි ධරණීය කෘෂිකර්මය සඳහා අතහිත ලබාදීම අරමුණු කරගත් ආයතන සමඟ ඒකාබද්ධව කජු වගා ව්‍යාප්තිය සඳහා මධ්‍යකලපුව දිස්ත්‍රික්කයේ සහන මිලට කජු පැළ ලබාදීම මෙන්ම නොමිලයේ විශේෂඥ දැනුම ලබාදීම මෙම සංස්ථාව මඟින් සිදුකරනු ලැබේ.

2.3 (ආ) පහත අදහස් දක්වමි.

සංස්ථා නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් මඟින් මේ වනවිට මෙහි සඳහන් පිරිවැය ගණනය කිරීම්වල මූලික කටයුතු පමණක් සම්පූර්ණ කර ඇති අතර, විවිධ ප්‍රායෝගික ගැටළු හේතුකොටගෙන අදාල කටයුතු සියල්ල මෙතෙක් අවසන් කර නොමැත. ඒ අනුව හැකි ඉක්මණින් අදාල පිරිවැය ගණනය කිරීමේ ක්‍රමවේදය සම්පූර්ණ කර, ඒ සඳහා ජාතික විගණන කාර්යාලයේ නිලධාරීන්ගෙන් එකඟතාවය ලබා ගනිමින්, ඉදිරි වර්ෂවල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අදාල ක්‍රමවේදය උපයෝගී කොටගෙන අවසන් තොගවල වටිනාකම් ගණනය කර එම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ.

2.3 (ඇ) පහත අදහස් දක්වමි.

මෙම සංස්ථාව පිහිටුවීමේදී ඊට අදාල වූ රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ සඳහන් සංස්ථාව පිහිටුවීමේ අරමුණුවලට අනුව කජු මද හා කජු පැළ අලෙවි කිරීම් වැනි වාණිජ ක්‍රියාකාරකම්වලට අතිරේකව දිවයිනෙහි කජු වගා ව්‍යාප්තිය හා කජු වගාවේ හා පොදුවේ කජු කර්මාන්තයේ කටයුතුවල ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා ක්‍රියාත්මක කළයුතු පර්යේෂණ හා සංවර්ධන කටයුතු යන සේවා ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වගකීම ද සංස්ථාව වෙත පැවරී ඇත.

ඉහත සඳහන් කළ පරිදි සංස්ථාවේ සේවා ක්‍රියාකාරකම් ලෙස ක්‍රියාත්මක වන ව්‍යාප්ති සහ පර්යේෂණ හා සංවර්ධන සේවා සඳහා වෙනමම ආදායම් හා වියදම් ගිණුමක් පිළියෙල නොකරන අතර, වාර්ෂිකව එම පිරිවැය මධ්‍යස්ථානයන්ට අදාල ද්‍රව්‍යාත්මක අගයකින් යුතු පිරිවැය ද සංස්ථාවේ වාණිජ ක්‍රියාකාරකම්වලට අදාල ලාභ මධ්‍යස්ථානවලට අදාල පිරිවැය සමඟ ඒකාබද්ධ කර ගිණුම්ගත කිරීම සිදුකරනු ලබයි.

සංස්ථාවේ සේවා ක්‍රියාකාරකම්වලට අදාල පිරිවැය ඉහත පරිදි ගිණුම්ගත කරනු ලැබුව ද එම සේවා සැපයීම් මඟින් පොදුවේ ආර්ථිකයට හිමිවන ප්‍රතිලාභ මුල්‍ය අගයකින් මැනිය නොහැකි බැවින් ඒවා ගිණුම්ගත කිරීමක් සිදුකළ නොහැකි හෙයින් මෙම විගණන නිරීක්ෂණයේදී එම තත්ත්වය සම්බන්ධයෙන් ද අවධානය යොමු කිරීම වැදගත් වන බව සඳහන් කළයුතු වේ. කෙසේ නමුත් සංස්ථාවේ විකුණුම් හා අනෙකුත් ආදායම් තවදුරටත් ඉහළ නංවා ගනිමින් හා වියදම් නිසි පරිදි කළමනාකරණය කර ගනිමින් ලාභදායීත්වය වර්ධනය කර ගැනීමට ගතයුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් දැඩි අවධානය යොමු කර අවශ්‍ය කටයුතු සිදුකර ඇති අතර, සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව රු. මිලියන 14.471 ක ශුද්ධ ලාභයක් ලබා තිබීම මඟින් එය පැහැදිලි වේ. ඒ අනුව අදාල ඉදිරි ක්‍රියාමාර්ග අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලැබේ.

2.3 (ඉ) පහත අදහස් දක්වමි.

මේ වනවිට සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන, ලංකා බැංකුවේ ජංගම ගිණුම් 02 ක් (අංක 1633704 හා 1633705 දරණ ජංගම ගිණුම්) හා ලංකා බැංකුවේ ඉතිරි කිරීමේ ගිණුම් 01 ක් (අංක 1649789 දරණ ඉතිරි කිරීමේ ගිණුම) හැරුනුකොට සංස්ථාවේ ඉතිරි සියළුම අනවශ්‍ය බැංකු ගිණුම් වසා දැමීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත.

2.3 (ඊ) පහත අදහස් දක්වමි.

මෙහි සඳහන් රු. 1,807,121/= ක වාරික මුදල් සියල්ල මේ වනවිට අදාල සංගම් වෙත ගෙවා අවසන් කර ඇත. සංස්ථාවේ පවතින මූල්‍ය දුෂ්කරතා හේතුකොටගෙන මෙහි සඳහන් තත්ත්වය උද්ගතවූ අතර, කෙසේ නමුත් ඉදිරියේදී මෙම වැටුපෙන් සිදුකරන අවකරණයන් අදාල අවස්ථාවේදීම එම සංගම් වෙත ප්‍රේෂණය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ.

2.3 (උ) පහත අදහස් දක්වමි.

මෙම විගණන නිරීක්ෂණයේ සඳහන්ව ඇති එකතුව රු. 3,954,338/= ක් වන මුළු වෛද්‍යාධාර මුදල මේ වනවිට අදාල කාර්ය මණ්ඩල සාමාජිකයන් වෙත ගෙවීමට කටයුතු කර ඇත.

2.3 (ඌ) පහත අදහස් දක්වමි.

මෙම විස්තරාත්මක විගණන වාර්තාවේ අංක 1.2 (ඌ) යටතේ මීට පෙර නිරීක්ෂණ ඉදිරිපත් කර ඇති පරිදි ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් මෙම සංස්ථාව වෙත ලැබිය යුතු රු. 9,466,200/= ක ණය මුදලට එරෙහිව මෙම වී අලෙවි මණ්ඩලය වෙත ගෙවිය යුතුව පවතින රු. 3,500,000/=ක ණය මුදල හිලව් කිරීම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ඉල්ලුම් කළ ද ඒ සඳහා අනුමැතිය හිමිවී නොමැත. ඒ අනුව මීට පෙර ද සඳහන් කර ඇති පරිදි අදාල ලැබිය යුතු රාජ්‍ය ණය අයකරවා ගැනීම සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය වෙත යවා ඇති ලිපිය සඳහා ඉදිරියේදී ලැබෙන ප්‍රතිචාරවලට අනුව මෙම වී අලෙවි මණ්ඩලය වෙත ගෙවිය යුතුව පවතින ණය වටිනාකම ගෙවා නිදහස් කළයුතු ආකාරය සම්බන්ධයෙන් නිගමනයකට පැමිණීමට කටයුතු කරනු ලැබේ.

2.3 (එ) පහත අදහස් දක්වමි.

මීට පෙර මෙම පිළිතුරු වාර්තාවේ අංක 2.2.2 (ඇ) යටතේ දක්වා ඇති පරිදි මැතකදී සිදුකරගනු ලැබූ තහවුරු කිරීම්වලට අනුව මෙම සංස්ථාවට අයත් මුළු ඉඩම් අක්කර ප්‍රමාණය වන අක්කර 11223 ක ප්‍රමාණයෙන් 80%ක්ම (8988/11223x100) මෙම සංස්ථාව වෙත හිමිවී ඇත්තේ 2012 වර්ෂයෙන් පසුව වේ.

අදාල මුළු ඉඩම් අක්කර 11223 ක ප්‍රමාණයෙන්, මන්නාරම කොන්ඩච්චි වතුයාය හා මඩකලපුව මාන්කර්නි වතුයාය යන ඉඩම්වලින් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත කජු වගාව සඳහා ලබාදී ඇති අක්කර 1600 ක භූමි කොටස්වල සාර්ථක ලෙස කජු වගාව සිදුකර ඇත. එසේම ඉහත මුළු අක්කර ප්‍රමාණය තුළ කජු වගාව හෝ වෙනත් වගාවක් සිදුකළ නොහැකි අක්කර 552 ක ප්‍රමාණයක් ද පවතී.

සංස්ථාවේ වතුයායන් හි ඉඩම්වල නව කජු වගා කටයුතු සඳහා සංස්ථාවේ ඉපයූ අරමුදල් භාවිතා කරන අතර, ඒ අනුව අදාල ඉපයීම්වලට අනුව වාර්ෂිකව වතුයායන් හි නව කජු වගා කටයුතු සිදුකරනු ලැබුව ද එය ඉතා කුඩා අක්කර ප්‍රමාණයකි. ඒ අනුව පවතින මූල්‍ය ප්‍රතිපාදනවලට අනුව හැකි උපරිම ආකාරයෙන් සංස්ථා වතුයායන් හි නව කජු වගාවන් සිදුකර අදාල සංවර්ධන කටයුතු හා පැරණි වගාවන් පුනරුත්ථාපනය කිරීමේ කටයුතු ද (එනම් නැවත වගාව හා යටි වගාව) සිදුකරනු ලැබේ. ඒ අනුව ප්‍රවර්තන වර්ෂයේදී ද (එනම් 2024 වර්ෂයේදී) සංස්ථාව සතු එළුවන්කුලම වතුයායේ හා තිරියාය වතුයායේ පිළිවෙලින් අක්කර 100 ක හා අක්කර 05 ක නව කජු වගාවන් සිදුකිරීමට සැලසුම් සකස් කොට ඇත.

එසේම අතුරු භෝග වගා කටයුතු සඳහා පෞද්ගලික අංශයේ වැවිලි කරුවන්ට ඉඩම් බදුදීම මඟින් ඔවුන්ගේ සහාය ලබාගෙන ද වතුයායන් හි නව කජු වගාවන් සිදුකිරීමට කටයුතු කරනු ලබන අතර, වගාව සඳහා උනන්දුවක් දක්වන පෞද්ගලික අංශයේ ආයෝජකයන් සමඟ විධිමත් පරිදි ගිවිසුම්ගතව ඔවුන්ගේ අරමුදල් භාවිතයෙන් ද නව කජු වගාවන් සඳහා යොමුවීමට අවශ්‍ය සැලසුම් සකස් කරමින් පවතී.

2.3 (ඒ) පහත අදහස් දක්වමි.

සංස්ථා වතුයායන් බොහොමයක ඉතා පැරණි කජු වගාවන් පවතින අතර, එම වගා භූමි තුළ පවතින කජු ගස් ප්‍රමාණය සම්මත කජු ගස් ගණනට වඩා බෙහෙවින් පහළ අගයක් ගනී. එමෙන්ම වන අලීන්ගේ හානිය, කඳ හා මුල් විදින කුරුමිණියාගේ හානිය වැනි හේතූන් නිසා ද අක්කරයකට තිබිය යුතු කජු ගස් ප්‍රමාණය විශාල වශයෙන් අඩුවීමකට ලක්වී ඇත.

එසේම 2022 වර්ෂයේදී ලෙලි කජු අස්වනු සමය තුළදී පැවති කජු වගාවට අහිතකර කාලගුණික හා දේශගුණික තත්ත්වයන් හේතුකොටගෙන සමස්ත දිවයිනෙහිම ලෙලි කජු අස්වනු පහළ මට්ටමක පැවති බව සඳහන් කළයුතු අතර, කජු වගාවට ඉතා යහපත් කාලගුණික හා දේශගුණික තත්ත්වයන් පැවති 2020 වර්ෂය තුළදී මෙම සංස්ථාවේ වතුයායන් මඟින් එක්රැස් කරගත් ලෙලි කජු අස්වනු ප්‍රමාණයට අනුව එලදරණ එක් කජු ගසකට සාමාන්‍ය අස්වැන්න කිලෝග්‍රෑම් 5.043කට ආසන්න අගයක පැවතී ඇති බව ද සඳහන් කළ යුතු වේ.

2.3 (ඔ) පහත අදහස් දක්වමි.

රටෙහි පැවති විවිධ අර්බුදකාරී තත්ත්වයන් හේතුකොටගෙන හා සංස්ථාවේ අයහපත් මූල්‍ය තත්ත්වයට අනුව පසුගිය ආසන්න වර්ෂ 05 ක පමණ කාලයක් පුරා පොල් වගාවට අවශ්‍ය රසායනික පොහොර යෙදීම් සිදුකර නොමැති වීමෙන් පොල් අස්වනු සැලකිය යුතු ප්‍රමාණයකින් අඩුවී තිබීම මෙම විගණන නිරීක්ෂණය යටතේ සඳහන් කර ඇති කරුණු සඳහා හේතුවී ඇත. කෙසේ නමුත් ප්‍රවර්තන වර්ෂයේදී (එනම් 2024 වර්ෂයේදී) පොල් වගාව සඳහා පොහොර මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇති හෙයින් ඉදිරි වර්ෂවලදී පොල් අස්වනුවල සැලකිය යුතු වර්ධනයක් අපේක්ෂා කළ හැකිය.

2.3 (ඕ) පහත අදහස් දක්වමි.

සංස්ථාව දීර්ඝ කාලයක පටන් කජු පුහුලන්වලින් වයින් නිෂ්පාදනය කර අලෙවි කරනු ලබන අතර, ඒ අනුව කජු පුහුලන් වයින්වලින් අතුරු නිෂ්පාදනයක් සිදුකිරීමට හා එම අතුරු නිෂ්පාදන අලෙවි කිරීමට මෙම සංස්ථාව විසින් අවශ්‍ය කටයුතු සිදුකර ඇත.

සාමාන්‍යයෙන් ලෙලි කජු අස්වනු එක්රැස් කර ගැනීම සිදුවන්නේ එම ලෙලි කජු ගෙඩි ගසෙන් පොළවට පතිත වූ පසුව වන හෙයින් එතෙක් කජු පුහුලන් ලෙලි කජු ගෙඩිවලින් ඉවත් කිරීම සිදුකළ නොහැකි නිසා කජු ගසෙන් සෘජුවම කජු පුහුලන් කඩා අතුරු නිෂ්පාදන සඳහා යොදා ගැනීමේ හැකියාවක් නොමැති අතර, ඒ අනුව කජු පුහුලන් නැවුම් තත්ත්වයෙන් අදාල වාණිජ නිෂ්පාදන සඳහා යොදා ගැනීමේ ගැටළුවක් පැවතී. එසේම කජු ගසේදීම සැලකිය යුතු කජු පුහුලන් ප්‍රමාණයක් නෂ්‍යවීම්වලට භාජනය බැවින් ලෙලි කජු අස්වනුවල පැවති කජු ගෙඩි ප්‍රමාණය අනුව එක්රැස් වූ කජු පුහුලන් ප්‍රමාණය ගණනය කිරීම ප්‍රායෝගික නොවේ.

වයින් නිෂ්පාදනය සම්බන්ධයෙන් මතු වූ තාක්ෂණික ගැටළු හේතුකොටගෙන දැනට සංස්ථාවේ වයින් නිෂ්පාදන කටයුතු තාවකාලිකව නතර කර ඇති නමුත් කජු පුහුලන් උපයෝගී කර ගනිමින් එතිල් ඇල්කොහොල්/ස්ප්‍රිතු නිෂ්පාදනය කිරීමට ඇති හැකියාව සම්බන්ධයෙන් සංස්ථාව මඟින් සිදුකරන ලද ප්‍රාථමික පරීක්ෂණ කටයුතු සාර්ථක වී ඇත. ඒ අනුව මෙම එතිල් ඇල්කොහොල් පර්යේෂණ මට්ටමෙන් නිෂ්පාදනය කිරීමේ කටයුතු දැනට අයි.ඩී.එල්. ආයතනය වෙත භාරදී ඇති අතර, එම ආයතනය විසින් මේවනවිට අදාල කටයුතු සිදුකරගෙන යනු ලබයි. එම නිෂ්පාදන කටයුතුවල ප්‍රගතිය අනුව ඉදිරියේදී වාණිජ මට්ටමින් එතිල් ඇල්කොහොල් නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට හැකියාව පවතී.

සංස්ථාවේ නැදගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානයේ පවතින කජු ලෙලි තෙල්/දියර නිපදවන යන්ත්‍රය උපයෝගී කරගනිමින් මීට පෙර කජු ලෙලි තෙල්/දියර නියැදි නිපදවා ඒවා තොග පදනම යටතේ අලෙවි කිරීම සඳහා ආයතනයක් සොයා ගැනීමට උත්සාහ කර ඇති නමුත් එම උත්සාහය ව්‍යර්ථ වී ඇත. කෙසේ නමුත් සංස්ථාව මඟින් දැනට මෙම කජු ලෙලි මුදලට විකිණීම සිදුකරන බැවින් එමඟින් සංස්ථාවට ආදායමක් උත්පාදනය වන බව ද සඳහන් කළයුතු වේ.

2.3 (ක) පහත අදහස් දක්වමි.

හදිසි අලුත්වැඩියා කටයුතුවලදී සංස්ථාවේ වාහන අලුත්වැඩියා ක්‍රමවේදයට අනුව සංස්ථාවේ වාහන ගරාජවලට ඇතුළත් කරන අතර, සමහර අවස්ථාවලදී හදිසියේ ගරාජවලට ඇතුළත් කරනු ලබන වාහනවල අලුත්වැඩියාවන්ට අදාල ප්‍රසම්පාදන කටයුතු නිසි පරිදි සම්පූර්ණ කරන තෙක් එම වාහන සැලකිය යුතු කාලසීමාවක් ගරාජ තුළ රැඳී පවතින අවස්ථා පවතී. කෙසේ නමුත් වාහන අලුත්වැඩියා ක්‍රමවේදය නිසි පරිදි අනුගමනය කරමින් හැකි ඉක්මණින් අදාල අලුත්වැඩියා නිම කරවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ.

2.3 (ග) පහත අදහස් දක්වමි.

මෙම විගණන නිරීක්ෂණය යටතේ සඳහන්ව ඇති රු. මිලියන 7.092 ක අගය තුළ මූලික වශයෙන් කජු බොයිලේරුවක්, කජු පිරිසැකසුම් යන්ත්‍රයක් හා කජු විජලන යන්ත්‍ර 02 ක් පැවති අතර, ඉන් සංස්ථාව මඟින් ඇණවුම් කරන ලද්දේ කජු පිරිසැකසුම් යන්ත්‍රය හා කජු විජලන යන්ත්‍ර දෙක පමණකි. අදාල කාල වකවානුව තුළ දිවයිනෙහි පැවති උද්ධමනකාරී වාතාවරණය හේතුකොටගෙන ඉහත කී කජු විජලන යන්ත්‍ර සැපයීම සිදුකළ නොහැකි බවට අදාල සැපයුම්කරු වන සහේෂ් ඉන්ඩස්ට්‍රිස් ආයතනය විසින් දන්වන ලද හෙයින් සංස්ථාව වෙත අදාල සැපයුම්කරු විසින් භාරදෙනු ලැබුවේ කජු පිරිසැකසුම් යන්ත්‍රය පමණි.

එම පිරිසැකසුම් යන්ත්‍රය ක්‍රියාත්මක කිරීම පිළිබඳව පැවති ගැටළුසහගත තත්ත්වය හමුවේ එය පිරිසැකසුම් කටයුතු සඳහා භාවිතයට ගැනීම ප්‍රමාද වූ අතර, අදාල සැපයුම්කරු විසින් එම යන්ත්‍රය සඳහා ගෙවීම් ඉල්ලුම් කිරීමේදී යන්ත්‍රයේ ක්‍රියාකාරීත්වය පිළිබඳව පැවති ගැටළු ඔහු විසින් අවස්ථා කිහිපයකදීම නිරාකරණය කරන ලදී. පසුව අදාල යන්ත්‍රයේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා පත් කරන ලද කමිටුවේ නිර්දේශ මත යන්ත්‍රයේ ගැනුම් මිලෙන් 10% ක අගයක් රඳවාගෙන අදාල ගෙවීම් නිදහස් කිරීමට කටයුතු කරන ලදී.

අදාල ගෙවීම් කිරීමෙන් පසුව යන්ත්‍රය පිරිසැකසුම් කටයුතු සඳහා භාවිතයට ගත් මුල් අවස්ථාවේදී විනාඩි 15 ක පමණ කාලයකින් පසුව ද , දෙවන අවස්ථාවේදී පැය 02 ක පමණ කාලයකින් පසුව ද නැවත යන්ත්‍රයේ ක්‍රියාකාරීත්වය ඇණහිටි අතර, ඉන්පසුව එය පිරිසැකසුම් කටයුතු සඳහා භාවිතයට නොගන්නා ලදී. මෙම ගැටළුකාරී තත්ත්වය පිළිබඳව අදාල සැපයුම්කරුව කිහිප අවස්ථාවකදීම දැනුවත් කර, අදාල යන්ත්‍රය නැවත ක්‍රියාත්මක තත්ත්වයට පත් කර දෙන ලෙස ඉල්ලීම් සිදුකළ ද ඔහු විසින් ඒ සඳහා කිසිදු ප්‍රතිචාරයක් නොදක්වන ලදී.

එසේම ඉහත යන්ත්‍රයට අදාලව අලෙවියෙන් පසු සේවා සැපයීම සඳහා ගිවිසුමකට එළඹීමට සහභාගී වන ලෙස කිහිප වාරයකදීම දැනුම්දෙනු ලැබුව ද ඔහු එම සියලු අවස්ථා මඟහරින ලදී.

මෙම තත්ත්වය හමුවේ සංස්ථාවට අදාල යන්ත්‍රය පිරිසැකසුම් කටයුතු සඳහා භාවිතයට ගැනීමට නොහැකිවීම මඟින් අලාභයක් සිදුවී තිබීම හා එම යන්ත්‍රයේ උපයෝගීතාවය අවමවීම යන කරුණු පදනම් කර ගනිමින් අදාල සැපයුම්කරුට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අදාල නීති උපදෙස් ලබා ගැනීමට අදාල ලිපිලේඛන විෂයභාර අමාත්‍යාංශයේ නීති නිලධාරී වෙත යොමු කරන ලදී.

එහිදී සිය සේවාලාභියා වෙත ඉටුකිරීමට බැඳී ඇති වගකීම් පැහැර හැරීම සම්බන්ධව කරුණු දන්වන ලෙස අමාත්‍යාංශ නීති නිලධාරී විසින් ඉහත කී සැපයුම්කරු වෙත ලිඛිත දැනුම්දීමක් සිදුකරන ලද අතර, ඉදිරි නීතිමය කටයුතු සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත අදාල ලිපි ලේඛන යොමු කරන ලෙසට නීති නිලධාරී විසින් තවදුරටත් උපදෙස් ලබාදෙන ලදී. ඒ අනුව අදාල ඉදිරි කටයුතු සිදුකර ඇති අතර, ඉහත සඳහන් කරන ලද 10% ක රැඳවුම් මුදල ගෙවීම අත්හිටුවීමට කටයුතු කරන ලදී.

අනතුරුව මෙම යන්ත්‍රය නැවත ක්‍රියාකාරී තත්ත්වයට පත් කර ගැනීම සඳහා කජු කැපීමේ යන්ත්‍ර නිෂ්පාදනය කිරීම සම්බන්ධයෙන් පේටන්ට් බලපත්‍රය හිමි කජු පිරිසැකසුම් යන්ත්‍ර නිෂ්පාදනයේ පුරෝගාමී ආයතනයක් වන බුද්ධි ඉන්ඩස්ට්‍රීස් ආයතනය වෙතින් එම අලුත්වැඩියා කටයුතු සඳහා පිරිවැය ඇස්තමේන්තුවක් ඉල්ලුම් කළ අතර, අදාල ආයතනයේ කාර්මිකයින් විසින් එම යන්ත්‍රය භෞතිකව පරීක්ෂා කර බලා එය නැවත භාවිතයට ගත හැකි තත්ත්වයට පත්කර දීමට රු. මිලියන 04 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර ඇත.

ඒ අනුව දැනට ඉහත පිරිසැකසුම් යන්ත්‍රයේ අත්‍යාවශ්‍ය වන බවට හඳුනාගෙන ඇති කජු කැපීම සිදුකරන යන්ත්‍ර කොටස මූලික වශයෙන් අලුත්වැඩියා කර ගැනීමට මෙම සංස්ථාව අපේක්ෂා කරන අතර, ඒ අතරතුර ඉහත සඳහන් කළ පරිදි මූලික සැපයුම්කරුට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ කටයුතු සිදුකරගෙන යනු ලැබේ.

2.3 (ව) පහත අදහස් දක්වමි.

මෙහි සඳහන් විදුලිජනක යන්ත්‍රය හා බොයිලේරුව ඉතා පැරණි ඒවා වුව ද එම යන්ත්‍ර වරින්වර අලුත්වැඩියා කටයුතු සිදුකරමින් පිරිසැකසුම් මධ්‍යස්ථානයේ කටයුතු සඳහා භාවිතා කරන ලද යන්ත්‍ර වන අතර, විවිධ ප්‍රායෝගික හේතූන් මත මේවායේ සමහර අලුත්වැඩියා කටයුතුවල යම් ප්‍රමාදයක් සිදුවී ඇත. ඉදිරියේදී මේ සම්බන්ධව විශේෂ අවධානය යොමු කර කටයුතු කරනු ලැබේ.

එසේම කජු ලෙලි තෙල් සඳහා වර්තමාන වෙළෙඳපොල ඉල්ලුමක් නොමැතිවීම හේතුකොටගෙන මෙම කජු ලෙලිවලින් තෙල් නිපදවන යන්ත්‍රය භාවිතයට නොගෙන පවතින අතර, කෙසේ නමුත් ඉදිරියේදී වෙළෙඳපොල සාධක වෙනසකට භාජනය වුවහොත් අවශ්‍යතාවය පරිදි සේවා කටයුතු සිදුකර මෙම යන්ත්‍රය නැවත අදාල නිෂ්පාදන කටයුතු සඳහා භාවිතයට ගැනීමේ හැකියාව පවතී.

2.3 (ජ) පහත අදහස් දක්වමි.

නැදගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානයේ ජ්‍යෙෂ්ඨ ස්ථානභාර නිලධාරීගේ ඉල්ලීමට අනුව හා පසුකාලීනව නිර්මාණය වූ තත්ත්වයන් මත 2017 වර්ෂය මැද භාගයේදී පමණ නැදගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානයේ බොයිලේරුව අලුත්වැඩියා කිරීම සඳහා මිල ලංසු කැඳවීමට ප්‍රසිද්ධ පුවත්පතක දැන්වීමක් පළ කර ඇති අතර, ඒ අනුව එක් මිල ලංසුවක් පමණක් ලැබී ඇත. ලැබුනු මිල ලංසුව ද ඉතා ඉහළ අගයකින් යුක්ත වූ බැවින් සංස්ථාවේ එවකට ඒ සඳහා පැවති ප්‍රතිපාදනවල තත්ත්වය මත අදාල අලුත්වැඩියා කටයුතු සිදුකිරීමට යොමුවී නොමැත.

මෙම විගණන ඡේදයේ සඳහන් කර ඇති පරිදි බොයිලේරුව මගින් ලෙලි කජු තැම්බීම සිදුකර එම ලෙලි කජු පිරිසැකසුම් කිරීමෙන් සම්පූර්ණ කජු මද ප්‍රතිශතය ඉහළ යාම වාසිදායක වූවත්, කජු මදවල සාමාන්‍ය රසයට වඩා රසය තරමක් අඩුවීම. කජු මද කල් තබාගත හැකි කාලය යම් මට්ටමකින් අඩුවීම වැනි කජු අලෙවිය කෙරෙහි අවාසිදායක /අහිතකර බලපෑම් ද එමගින් නිර්මාණය වේ.

සංස්ථාවේ කජු මිලදී ගන්නා පාරිභෝගිකයන් ඒ සඳහා යොමුවීමට ප්‍රධානම හේතුව වන්නේ අනෙකුත් කජු නිෂ්පාදකයන්ගේ කජුවලට සාපේක්ෂව සංස්ථා කජුවල රසය සැලකිය යුතු ලෙස ඉහළ මට්ටමක පැවතීම වන අතර, එම ඉල්ලුමට ගැළපෙන සේ කජු මද නිෂ්පාදනය කළයුතු බැවින් දැනට පිරිසැකසුම් කටයුතු සඳහා බොයිලේරුව යොදා නොගන්නා අතර, කෙසේ නමුත් ඉහත අවාසිදායක/අහිතකර තත්ත්වයන් පාලනය කළ හැකි පරිද්දෙන් නැතහොත් යාමනය කළ හැකි පරිද්දෙන් කජු පිරිසැකසුම් කටයුතු වෙනුවෙන් ලෙලි කජු තැම්බීම සඳහා බොයිලේරුව නැවත යොදා ගැනීමේ හැකියාව සම්බන්ධයෙන් අවශ්‍ය සලකා බැලීම් සිදුකරගෙන යනු ලැබේ.

2.3 (ට) පහත අදහස් දක්වමි.

මෙම විගණන නිරීක්ෂණය සම්බන්ධයෙන් මීට පෙර වරින්වර සංස්ථාව වෙත ඉදිරිපත් කර ඇති විගණන විමසුම් හා විගණන වාර්තා සඳහා ඉදිරිපත් කර ඇති කරුණු දැක්වීම්වලට වැඩිමනත් වශයෙන් පහත අදහස් දක්වමි.

කජු ක්ෂේත්‍රයේ පවතින එකම රාජ්‍ය ආයතනය වශයෙන් ශ්‍රී ලංකා කජු සංස්ථාව වෙත දිවයිනෙහි කජු වගාව, කජු ව්‍යාප්තිය, කජු පිරිසැකසුම, කජු පිළිබඳ පර්යේෂණ හා සංවර්ධනය, කජු අලෙවිකරණය යනාදී ක්ෂේත්‍ර ගණනාවක් නියෝජනය කරමින් අදාල කාර්යයන් සඳහා මැදිහත් වී කටයුතු කිරීමේ වගකීම පැවරී ඇත.

2020 හා 2021 වර්ෂයන් හිදී දිවයින පුරා පැතිර ගිය Covid – 19 වසංගත රෝග තත්ත්වය හමුවේ කජු ක්ෂේත්‍රයේ වගාකරුවන්, පිරිසැකසුම්කරුවන්, අලෙවිකරුවන් යනාදී විශාල පිරිසකට සිය ආදායම් අහිමි වී ගිය අතර, එසේ ආර්ථික වශයෙන් අපහසුතාවයට පත් වූ කජු ක්ෂේත්‍රය නියෝජනය කරන පුද්ගලයන් එම අපහසුතාවයන්ගෙන් මුදවා ගැනීම සඳහා කටයුතු කිරීමේ වගකීම ද මෙම සංස්ථාව වෙත පැවරී ඇති බැවින් මෙම තත්ත්වයට විසඳුම් ලබාදීම සඳහා අමාත්‍යාංශ ප්‍රගති සමාලෝචන රැස්වීම්වලදී මෙම සංස්ථාවේ එවකට සිටි සභාපතිතුමියගේ ඉල්ලීම මත සහ එවකට විෂයභාර රාජ්‍ය අමාත්‍යාංශයේ ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් සංස්ථාවේ පිරිසැකසුම් මධ්‍යස්ථානවල සිදුකරන නිරීක්ෂණ චාරිකා කිහිපයකදී සිදුකරන ලද නිරීක්ෂණවල ප්‍රතිඵලයක් ද ලෙස සංස්ථාවට හා කජු ක්ෂේත්‍රය නියෝජනය කරනු ලබන පිරිසැකසුම්කරුවන්ට පොදුවේ ප්‍රතිලාභ ලැබෙන පරිද්දෙන් මෙම විගණන නිරීක්ෂණයට පදනම් වූ කජු ඇසුරුම් යන්ත්‍රය හා තවත් කජු පිරිසැකසුම් යන්ත්‍ර පද්ධතියක් (මෙම පිරිසැකසුම් යන්ත්‍ර පද්ධතිය සම්බන්ධයෙන් මෙම විගණකාධිපති වාර්තාවේ අංක 2.3 (ග) යටතේ විගණන නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත.) මිලදී ගැනීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන විෂයභාර රාජ්‍ය අමාත්‍යාංශය මඟින් මෙම සංස්ථාව වෙත ලබාදීමට කටයුතු කරන ලදී.

සංස්ථාවේ කජු පිරිසැකසුම් කටයුතුවල අවසාන අගය එකතු කිරීමේ කටයුතු හා අවසාන ඇසුරුම් කටයුතු සිදුකරනු ලබන්නේ නැදගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානයේ වන බැවින් කජු ඇසුරුම් යන්ත්‍රය එම පරිශ්‍රයේ ස්ථාපනය කරන ලද අතර, කජු පිරිසැකසුම් යන්ත්‍ර පද්ධතිය ද නැදගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානයේ ස්ථාපිත කළ හැකි වුවත්, ක්ෂේත්‍රයේ පුද්ගලයන්ට වැඩි ප්‍රතිලාභයක් ලබාගත හැකි පරිද්දෙන්, දිවයිනෙහි කජු කර්මාන්තයේ කටයුතු වැඩි වශයෙන් ව්‍යාප්ත වී ඇති පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටි සංස්ථාවේ පිරිසැකසුම් මධ්‍යස්ථානයේ එම කජු පිරිසැකසුම් යන්ත්‍ර පද්ධතිය ස්ථාපනය කරන ලදී.

එමෙන්ම 2020 වර්ෂය අගභාගයේදී පමණ ඉදිරිපත් වූ 2021 වර්ෂයේ රාජ්‍ය අයවැය ප්‍රකාශනයට අනුව එවකට විෂයභාර රාජ්‍ය අමාත්‍යාංශය මඟින් මෙම සංස්ථාවේ මන්නාරම, කොන්ඩච්චි වතුයායේ ප්‍රතිස්ථාපන කටයුතු සඳහා රු.මිලියන 225 ක ප්‍රතිපාදන සංස්ථාව වෙත ලබාදෙන ලද අතර, එම රු. මිලියන 225 ක ප්‍රතිපාදනවලින් රු. මිලියන 125 ක් කොන්ඩච්චි වතුයායේ 2021 වර්ෂය සඳහා වූ ව්‍යාපෘතිය යටතේ අක්කර 1000 ක භූමි කොටසක නව කජු වගාවක් සිදුකිරීම හා අනෙකුත් සංවර්ධන හා යටිතල පහසුකම් වෙනුවෙන් වෙන් කර තිබිණි.

ඒ අනුව වසර 03 ක කාලසීමාවක් තුළදී එම අක්කර 1000 ක භූමි ප්‍රමාණය තුළ ක්‍රමිකව නව කජු වගාව සිදුකර ලැබෙන අස්වනු ප්‍රමාණය සම්බන්ධයෙන් පුරෝකථනයක් සිදුකර, ඉහළ කාර්යක්ෂමතාවයෙන් යුතුව එම ලෙලි කජු නිෂ්පාදනවල පිරිසැකසුම් කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය පිරිසැකසුම් හා ඇසුරුම් යන්ත්‍රවල අවශ්‍යතාවය ද මෙම මිලදී ගැනීම්වලදී සැලකිල්ලට භාජනය කරන ලදී.

කෙසේ නමුත් Covid – 19 වසංගත රෝග තත්ත්වය දීර්ඝ කාලයක් දිවයින පුරා පැවතීම හා ඉන්පසුව ඇතිවූ ආර්ථික අවපාත තත්ත්වය හේතුකොටගෙන අදාල නව කජු වගාවන්වල කටයුතු නිසි ලෙස සම්පූර්ණ කර ගැනීමට නොහැකි වූ අතර, ඒ අනුව ඉහත පරිදි මිලට යන්ත්‍ර මඟින් ද අපේක්ෂිත නිෂ්පාදිත ධාරිතාවයන් ළඟා කර ගැනීමට නොහැකි විය. මේ අනුව විෂයගත ඇසුරුම් යන්ත්‍රය සංස්ථාවේ වර්තමාන කජු නිෂ්පාදන ධාරිතාවයන්ට නොගැලපෙන හෙයින් එම ඇසුරුම් යන්ත්‍රය විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේදයක් භාවිතයෙන් උපරිම වෙළෙඳපොල මිල ගණනකට අලෙවි කර, එම මුදලින් සංස්ථාවේ වර්තමාන නිෂ්පාදන ධාරිතාවයට ගැලපෙන නව ඇසුරුම් යන්ත්‍රයක් මිලදී ගැනීමට අනුමැතිය ඉල්ලුම් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද පත්‍රිකාව සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර, ඒ අනුව අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරනු ලැබේ.

2.3 (ඩ) පහත අදහස් දක්වමි.

නැදගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානය ඉතා පැරණි ගොඩනැගිල්ලක පවත්වාගෙන යනු ලබන අතර, එය අදාල ඉඩම සංස්ථාව මඟින් අත්පත් කර ගැනීමේදී එහි ඉදිකර තිබූ ගොඩනැගිල්ලකි. ගොඩනැගිල්ල ඉතා පැරණි බැවින් සංස්ථාවේ පිරිසැකසුම් අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි අදාල ගොඩනැගිල්ල නවීකරණය කර ගැනීම ඉතා අපහසු කටයුත්තක් වන අතර, අදාල පැරණි ගොඩනැගිල්ල ඉවත් කර ඒ වෙනුවට පිරිසැකසුම් මධ්‍යස්ථානය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමෙන් මෙම ගැටළුකාරී තත්ත්වයන් මහහරවා ගත හැකි නමුත් ඒ සඳහා ප්‍රමාණවත් මුදල් ප්‍රතිපාදන සංස්ථාව සතුව නොමැත.

ඒ අනුව වරින් වර මෙහි සඳහන් ගබඩා ගොඩනැගිල්ලේ හා අනෙකුත් ගොඩනැගිලි කොටස්වල සිදුකළ හැකි අලුත්වැඩියා කටයුතු පමණක් සිදුකර බාධාවකින් තොරව මධ්‍යස්ථානයේ කටයුතු පවත්වාගෙන යනු ලැබේ. සංස්ථාවේ මූල්‍ය තත්ත්වය යහපත් මට්ටමකට පත් වූ පසු මේ සම්බන්ධයෙන් අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ.

මෙම විගණන නිරීක්ෂණයේ තවදුරටත් සඳහන් ආකාරයට සංස්ථාවේ ලෙලි කපු අස්වනු ඇසිරීම සඳහා ලණු ගෝනි හෝ දැල් ගෝනි යොදා ගැනීම ප්‍රායෝගිකව සිදුකළ නොහැක්කේ ප්‍රධාන වශයෙන්ම එම ලණු ගෝනි/දැල් ගෝනි, මෙම සංස්ථාවට දැරිය නොහැකි ඉතා ඉහළ මිලකින් යුක්ත වීම හේතුකොටගෙන වන අතර, එසේම අදාල ලණු ගෝනි/දැල් ගෝනි ඉතාමත් ඉක්මණින් දිරා යෑමට ලක් වීම ද, අදාල ඇසුරුම් ක්‍රමවේදයට අනුව වායුගෝලයේ ජල වාෂ්ප සෘජුවම ලෙලි කපු තොගවලට උරා ගැනීම නිසා එම ලෙලි කපු තොග පිරිසැකසුම් කටයුතුවලට භාවිතා කිරීම අපහසු වීම ද, අවශ්‍යතාවයට ප්‍රමාණවත් ලණු ගෝනි/දැල් ගෝනි ප්‍රමාණයක් වෙළෙපොලෙන් සපයා ගැනීමට අපහසුවීම ද ඒ සඳහා තවදුරටත් බලපාන හේතූන් වශයෙන් සඳහන් කළ හැකිය. ඒ අනුව සංස්ථාව මඟින් සාපේක්ෂව මිල අඩු පොලිසැක් වර්ගයේ ඇසුරුම් ලෙලි කපු තොග ඇසිරීම සඳහා භාවිතා කරනු ලබයි. එමෙන්ම ලෙලි කපු, මේදමය සංචිත ද්‍රව්‍යයක් වන බැවින් කවර වර්ගයක ගෝනිවල එම තොග ඇසුරුම්ගත කළ ද ඒවා ගබඩා කර තබාගත හැකි කාලසීමාවේ සැලකිය යුතු වෙනසක් නොපවතී.

2.3 (ත) පහත අදහස් දක්වමි.

මෙම නිරීක්ෂණය යටතේ සඳහන් කර ඇති කොන්ඩච්චි වතුයායේ ප්‍රතිස්ථාපන ව්‍යාපෘති කටයුතු සඳහා විෂයභාර අමාත්‍යාංශයෙන් ලැබී ඇති රු.මිලියන 225 ක ප්‍රතිපාදනවලින් 2024.02.29 වන දින වනවිට අදාල ඉලක්කගත කාර්යයන් සම්පූර්ණ කර ගැනීම සඳහා රු. මිලියන 106.598 ක් වැය කර ඇති අතර, ඊට අතිරේකව දැනට ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර සිදුකරමින් පවතින වැඩ කටයුතු සඳහා ගෙවීම් බැඳියාව රු. මිලියන 87.671 කි. මේ අනුව අදාල ව්‍යාපෘතියේ අන්තර්ගත දැනට ගැටළු සහගත තත්ත්වයකට පත් වී ඇති කොන්ඩච්චි වතුයාය වටා විදුලි වැටක් ඉදිකිරීමේ කටයුතු හැරුනුකොට අනෙකුත් සියලුම ඉලක්කගත කාර්යයන් බොහෝදුරට සම්පූර්ණ වී ඇති අතර, ව්‍යාපෘතියේ සියලු ඉදිකිරීම් කටයුතු 2024.04.30 දිනට හෝ ඊට පෙර නිම කිරීමට සැලසුම් කර තිබේ.

2.3 (ද) පහත අදහස් දක්වමි.

මේවනවිට ඉදිකිරීම් කටයුතු නිම කර ඇති සියලු ගොඩනැගිලිවලට විදුලිය ලබාදීම සිදුකර ඇති අතර, අනෙකුත් ගොඩනැගිලිවල ද ඉදිකිරීම් කටයුතු සිදුකරගෙන යනු ලැබේ. එම ඉදිකිරීම් කටයුතුවලට සමගාමීව එම ගොඩනැගිලිවල වයරින් කිරීමේ කටයුතු නිමකරනු ලබන අතර, එම කටයුතු නිමවූ වහාම අදාල ගොඩනැගිලි සඳහා ද විදුලි සැපයුම ලබාදීමට කටයුතු කරනු ලැබේ.

2.3 (න) පහත අදහස් දක්වමි.

මෙම නිල නිවාස ඉදිකිරීම සඳහා මූලික වශයෙන් අනුමත වූ ඇස්තමේන්තුවලට සාපේක්ෂව වෙළෙඳපොලේ අදාල ඉදිකිරීම් ද්‍රව්‍යවල මිල ගණන් හා වැඩකුලී අගයන් ඉතාමත් ද්‍රව්‍යාත්මක ලෙස ඉහළ ගිය බැවින් අදාල ඉදිකිරීම් කටයුතු නිසි පරිදි සම්පූර්ණ කර ගැනීමට නොහැකි විය. කෙසේ නමුත් මෙම තත්ත්වය සැලකිල්ලට ගෙන විෂයභාර අමාත්‍යාංශයෙන් ද උපදෙස් ලබාගෙන අදාල ගොඩනැගිලිවල ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය අතිරේක ප්‍රතිපාදන අමාත්‍යාංශ අනුමැතිය යටතේ සපයා ගැනීමට මේවනවිට කටයුතු කර ඇති අතර, ඒ අනුව මෙහි සඳහන් ඉදිකිරීම් කටයුතු නිම කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය සැලසුම් සකස් කරගෙන යනු ලැබේ.

2.3 (ප) පහත අදහස් දක්වමි.

මෙම කසු ගස් සංගණනය කිරීමේ කටයුතුවල මුල් අදියර වශයෙන් සංස්ථාවේ කමන්දළුව වතුයායෙන් අදාල සංගණන කටයුතු ආරම්භ කළ අතර, අදාල කටයුතුවලදී උපයෝගී කරගත යුතු කම්කරු ශ්‍රමය හා ගස් ලකුණු කිරීමේ තීන්ත යනාදිය සඳහා ඉතා විශාල පිරිවැයක් දැරීමට සිදුවන හෙයින් ඒ සඳහා අතිරේක මුදල් ප්‍රතිපාදන සපයා ගැනීම ගැටළුසහගත වී ඇත. ඒ අනුව හැකි ඉක්මණින් අදාල අතිරේක ප්‍රතිපාදන සපයාගෙන සංගණන කටයුතු සම්පූර්ණ කිරීමට කටයුතු කරනු ලබන අතර, පසුව ඒ මත පදනම්ව කසු ගස් රෙජිස්තර පිළියෙල කිරීමේ කටයුතු ද සම්පූර්ණ කරනු ලැබේ.

13. වර්ෂ 05ක ගිණුම් සාරාංශය

ශ්‍රී ලංකා කපු සංස්ථාව					
	2022	**2021**	**2020**	**2019**	**2018**
ලාභ ලාභ ගිණුම	රු.(000)	රු.(000)	රු.(000)	රු.(000)	රු.(000)
ශුද්ධ විකුණුම්	134,849	139,223	109,120	100,082	94,931
විකුණුම් පිරිවැය	83,472	99,661	(72,190)	(67,857)	(61,023)
දළ ලාභය	**51,377**	**39,562**	**36,930**	**32,225**	**33,908**
අනෙකුත් ආදායම්	69,390	42,727	43,300	48,343	10,544
පුනරාවර්තන ප්‍රදාන	77,500	64,800	60,000	60,000	15,077
පරිපාලන වියදම්/අනෙකුත් වියදම්	(181,059)	(160,419)	(147,982)	(167,334)	(38,407)
ක්‍රමක්ෂය	(2,736)	(3,082)	(3,134)	(3,420)	539
වාණිජ කටයුතු වලින් ලත් ශුද්ධ ලාභය	**14,472**	**(16,412)**	**(10,886)**	**(30,186)**	**21,661**
සේවා අංශය- ආදායම් ඉක්ම වූ වියදම්	**-**	**-**	**-**	**-**	**(61,303)**
ආයුගණක (ලාභය)/අලාභය	**2,232**				
ශුද්ධ ලාභය/අලාභය	**16,704**	**(16,412)**	**(10,886)**	**(30,186)**	**(39,642)**
ශේෂ පත්‍රය					
ජංගම නොවන වත්කම්					
දේපල පිරියත සහ උපකරණ	116,125	117,553	77,883	82,027	87,369
ඵල දරන වගා නඩත්තුව	25,316	28,053	31,135	34,270	27,436
ඵල නොදරන වගා නඩත්තුව	98,080	71,592	60,329	37,862	51,591
කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ	6,543	628	576	69	-
අනෙකුත් කුඩා ව්‍යාපෘති	588	6,363	122	675	523
මුළු ජංගම නොවන වත්කම්	**246,652**	**224,189**	**170,045**	**154,903**	**166,919**
ජංගම වත්කම්					
තොග	76,770	90,952	64,467	38,264	20,222
වෙළඳ ණයගැතියෝ සහ ලැබිය යුතු අනෙකුත් දෑ	31,801	47,390	18,474	21,207	17,484
අත්තිකාරම් සහ පූර්ව ගෙවීම්	50,639	43,813	9,828	6,093	2,553
මුදල් හා මුදල් සමාන දෑ	143,842	159,876	42,516	5,202	3,225
මුළු ජංගම වත්කම්	**303,052**	**342,031**	**135,285**	**70,766**	**43,484**
					70,766
මුළු වත්කම්	**549,704**	**566,220**	**305,330**	**225,669**	**210,403**
හිමිකම් සහ වගකීම්					
හිමිකම්					
මූලික ප්‍රාග්ධනය	40,000	40,000	40,000	40,000	40,000
රාජ්‍ය ප්‍රදාන	281,565	289,535	256,381	202,788	175,414
අනෙකුත් පාර්ශවයන්ගෙන් ලැබුණු ප්‍රදාන	280,919	286,736	32,337	15,766	17,756
ප්‍රාග්ධන සංචිත	17,441	17,442	17,441	17,442	17,442
ලාභාලාභ ගිණුම	(152,058)	(167,065)	(149,638)	(141,197)	(110,011)
මුළු හිමිකම්	**467,867**	**466,648**	**196,521**	**134,799**	**140,601**
ජංගම නොවන වගකීම්					
පාරිතෝෂික දීමනා සඳහා වෙන්කිරීම්	35,790	42,948	38,953	35,046	27,704
දිගුකාලීන ණය	3,500	3,500	3,500	3,500	3,500
මුළු ජංගම නොවන වගකීම්	**39,290**	**46,448**	**42,453**	**38,546**	**31,204**
ජංගම වගකීම්					
වෙළඳ ණයහිමියෝ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ	42,547	53,124	66,359	52,324	38,598
මුළු ජංගම වගකීම්	**42,547**	**53,124**	**66,359**	**52,324**	**38,598**
මුළු ස්කන්ධ සහ වගකීම්	**549,704**	**566,220**	**305,333**	**225,669**	**210,403**
ශුද්ධ වත්කම් ප්‍රතිලාභය %	3.6%	(3.5%)	(64.36)	(59.7)	(28.2)
ශුද්ධ ලාභ අනුපාතය %	12.4%	11.8%	(9.98)	(30.2)	(41.8)
ජංගම අනුපාතය	7:1	0:3	2:01	1:4	1:1
ක්ෂණික වත්කම් අනුපාතය	5:3	4:7	1:1	0:4	0:6
මුළු ආදායමට මුළු වියදම	1:1	(0.93)	(0.89)	(1.3)	(1:2)